# වාර්ෂික පර්යේෂණ සැසිය - 2022

# සිංහල භාෂා සාහිත්‍ය විෂයක විචාර සංකථන

සාරසංක්ෂේප සංග්‍රහය

වාර්ෂික පර්යේෂණ සැසිය - 2022

# සිංහල භාෂා සාහිත්‍ය විෂයක විචාර සංකථන

## සාරසංක්ෂේප සංග්‍රහය


**සංස්කරණය**

කල්‍යාණි විජේසුන්දර

ඔසඳ ගුණරත්න

රිද්මි හඳපාන්ගොඩ



සිංහල අධ්‍යයනාංශය

කොළඹ විශ්වවිද්‍යාලය

**සාරසංක්ෂේප සංග්‍රහය**
**වාර්ෂික පර්යේෂණ සැසිය – 2022**

## සිංහල භාෂා සාහිත්‍ය විෂයක විචාර සංකථන

**සංස්කරණය**
කල්‍යාණි විජේසුන්දර
ඔසඳ ගුණරත්න
රිද්මි හඳපාන්ගොඩ

**පිට කවරය නිර්මාණය**
ලලිත් රණවීර

**ISBN 978 - 624 - 5873 - 05 - 0**

**© සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය**

මේ කෘතියේ සාරසංක්ෂේපවල පද බෙදීම ලේඛකයන්ගේ අභිමතය පරිදි ය.

**මුද්‍රණය**
කොළඹ විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය

**ප්‍රකාශනය**
සිංහල අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය

2022 වාර්ෂික පර්යේෂණ සැසිය සම්බන්ධ සියලු තොරතුරු මෙම QR කේතයෙන් ලබා ගන්න.

**සාරසංක්ෂේප සමීක්ෂණ මණ්ඩලය**

සම්මානිත මහාචාර්ය රෝහිණී පරණවිතාන
සම්මානිත මහාචාර්ය ආර්. එම්. ඩබ්. රාජපක්ෂ
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අනුර මනතුංග
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සඳගෝමි කෝපරහේවා
මහාචාර්ය පූජ්‍ය අගලකඩ සිරිසුමන හිමි
මහාචාර්ය විමල් හේවාමානගේ
ආචාර්ය ප්‍රේමසිරි නාගසිංහ
ආචාර්ය ලතා ගුරුසිංහ
ආචාර්ය කුමුදු කරුණාරත්න
ආචාර්ය කපිල බණ්ඩාර
ආචාර්ය ජයන්ති බණ්ඩාර
ආචාර්ය ධම්මික ජයසිංහ
ආචාර්ය සුදේශ් මන්තිලක
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ක්‍රිෂාන්ත ෆෙඩ්රික්ස්

**අනුශාසකත්වය**

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සඳගෝමි කෝපරහේවා
අධ්‍යයනාංශ ප්‍රධාන - සිංහල අධ්‍යයනාංශය

**පර්යේෂණ සැසි ප්‍රධාන**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කල්‍යාණි විජේසුන්දර

**පර්යේෂණ සැසි සම්බන්ධීකාරක**

කථිකාචාර්ය ඔසඳ ගුණරත්න

**සාරසංක්ෂේප කමිටුව**

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සඳගෝමි කෝපරහේවා
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ක්‍රිෂාන්ත ෆෙඩ්රික්ස්
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කල්‍යාණි විජේසුන්දර
කථිකාචාර්ය ඔසඳ ගුණරත්න
සහකාර කථිකාචාර්ය රිද්මි හඳපාන්ගොඩ

**සංස්කරණය**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කල්‍යාණි විජේසුන්දර
කථිකාචාර්ය ඔසඳ ගුණරත්න
සහකාර කථිකාචාර්ය රිද්මි හඳපාන්ගොඩ



## උපකුලපතිතුමාගේ පණිවිඩය

### ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච්. ඩී. කරුණාරත්න

සමාජ ප්‍රගමනය උදෙසා ඥාන සම්පාදන කාර්යයෙහිලා විශ්වවිද්‍යාලයකට පැවරෙන්නේ සුවිශේෂී භූමිකාවකි. ශුද්ධ විද්‍යා, සමාජීය විද්‍යා, මානව ශාස්ත්‍ර ආදි කුමන විෂය පථයක වුව ද පර්යේෂකයන්ට ස්වකීය පර්යේෂණ ඉදිරිපත් කිරීමට අවශ්‍ය පසුබිම සකසා දීමට දශක ගණනාවක් පුරා කොළඹ විශ්වවිද්‍යාලය කැප වී කටයුතු කළ බව මෙහි දී සිහිපත් කළ යුතු ය. මෙහිලා කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශය අපගේ ප්‍රශංසාවට නිරන්තරයෙන් ලක් වන්නේ භාෂා, සාහිත්‍ය හා සංස්කෘතික විෂය ක්ෂේත්‍රවලට අදාළ පර්යේෂණ කර්තව්‍යයන් තුළ ස්වකීය භූමිකාව මැනවින් වටහා ගනිමින් අඛණ්ඩ ශාස්ත්‍රීය සේවයක නිරත වන බැවිනි. ඔවුන් විසින් සංවිධානය කෙරෙන වාර්ෂික පර්යේෂණ සැසිය එහි මනා පිළිබිඹුවකි. **සිංහල භාෂා සාහිත්‍ය විෂයක විචාර සංකථන** යන තේමාව යටතේ මෙවර එකොළොස් වන වරටත් සංවිධානය කෙරෙන මෙම පර්යේෂණ සැසිය ශ්‍රී ලංකාවේ සිංහල භාෂා සාහිත්‍යය අධ්‍යයන ක්ෂේත්‍රයේ සුවිශේෂී අනන්‍යතාවක් සනිටුහන් කරන අවස්ථාවක් ලෙස මම දකිමි. සිංහල අධ්‍යයන ක්ෂේත්‍රයට නව දැනුම සම්පාදනය කරන විද්වතුන්ගේ පර්යේෂණ මගින් ශාස්ත්‍රීය ලෝකයේ නිම්වළලු පුළුල් කිරීමට මෙය වැදගත් අවස්ථාවක් වනු ඇත. මෙබඳු ශාස්ත්‍රීය කර්තව්‍යයන් සංවිධානය කිරීම සම්බන්ධයෙන් සිංහල අධ්‍යයනාංශයට මාගේ ප්‍රණාමය පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.



## පීඨාධිපතිතුමාගේ පණිවිඩය
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ලසන්ත මානවඩු

ශ්‍රී ලංකාවේ මානව ශාස්ත්‍ර අධ්‍යයන කාර්යය තුළ ප්‍රමුඛ ස්ථානයක් හිමි කර ගන්නා කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශය, වාර්ෂික ව සංවිධානය කරන පර්යේෂණ සැසිය සිංහල භාෂා සාහිත්‍ය හා සංස්කෘතික අධ්‍යයන ක්ෂේත්‍රයන්හි පර්යේෂණවල නිරත වන විද්වතුන්ට ස්වකීය පර්යේෂණ ඉදිරිපත් කිරීමට ලැබෙන මහගු අවස්ථාවකි. පෘථුල විෂය ක්ෂේත්‍රයක නව දැනුම ඉදිරිපත් කරන පර්යේෂකයන්ගේ ඥාන සම්පාදන කාර්යයන් සඳහා සිංහල අධ්‍යයන අංශය මෙවැනි අවස්ථා උදා කිරීම පිළිබඳ ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපතිවරයා වශයෙන් මගේ සතුට පළ කරමි.

රටේ පවත්නා තත්ත්වය සැලකිල්ලට ගනිමින් විශ්වවිද්‍යාලය තුළ මෙන් ම මාර්ගගතව ද ස්වකීය පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීමට ඉඩ ලබා දී තිබීමත් භාෂා සාහිත්‍ය විෂය ක්ෂේත්‍රවල ප්‍රගමනයට හේතු වන **'විචාර සංකථන'** පිළිබඳ අවධානය යොමු කර තිබීමත් මෙවර සැසියෙහි විශේෂතා ලෙස නිරීක්ෂණය කළ හැකි ය.

වාර්ෂික ව ඉතා සාර්ථක ව මෙම කටයුත්ත සංවිධානය කරන සිංහල අධ්‍යයන අංශයේ අංශාධිපතිතුමා ඇතුළු ආචාර්ය මණ්ඩලයට සහ මෙවර පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරන සැමට මාගේ සුභාශිංසන එක් කරමි.



## අංශාධිපතිතුමාගේ පණිවිඩය
### ජ්‍යේෂ්ඨ මහාචාර්ය සඳගෝමි කෝපරහේවා

කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අංශය විසින් වාර්ෂික ව සංවිධානය කරනු ලබන පර්යේෂණ සැසිය සිංහල භාෂා සාහිත්‍ය හා සංස්කෘතික අධ්‍යයන විෂයෙහි පර්යේෂණවල නිරත වන පර්යේෂකයන්ගේ අවධානය දිනාගත් ශාස්ත්‍රීය කර්තව්‍යයකි. මෙවර පර්යේෂණ සැසියෙහි තේමාව වන්නේ **සිංහල භාෂා සාහිත්‍ය විෂයක විචාර සංකථන** යන්න යි. ඒ යටතේ සිංහල භාෂාව සහ වාග්විද්‍යාව, සම්භාව්‍ය සහ නූතන සාහිත්‍යය, සිංහල සංස්කෘතිය සහ කලා ශිල්ප, සාහිත්‍ය නිර්මාණකරණය හා විචාරය යන උපශික්ෂණ යටතේ ස්වකීය පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීමට පර්යේෂකයන්ට අවස්ථාව උදා වී ඇත. එකොළොස් වසරක් පුරා මෙම කර්තව්‍යය සංවිධානය කරමින් සිංහල අංශය උක්ත විෂය ක්ෂේත්‍රවල ශාස්ත්‍රීය ඥානය සමාජගත කිරීමට දායක වූ බව මාගේ විශ්වාසය යි. විවිධ දුෂ්කරතා මධ්‍යයේ වුව ද මෙම කාර්යය සැලසුම් කර සාර්ථක ව ක්‍රියාත්මක කිරීම සඳහා කැප වූ පර්යේෂණ සැසි ප්‍රධානීන් ඇතුළු සිංහල අංශයේ ආචාර්ය මණ්ඩලයටත් පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කළ සියලු දෙනාටත් නන් අයුරින් සහය වූ සැමටත් මාගේ ස්තුතිය පුද කර සිටිමි.





## සැසි ප්‍රධාන සටහන

ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය කල්‍යාණි විජේසුන්දර
කථිකාචාර්ය ඔසඳ ගුණරත්න

2022 වර්ෂයේ සිංහල අධ්‍යයනාංශ පර්යේෂණ සැසිය '**භාෂා සාහිත්‍ය විෂයක විචාර සංකථන**' යන තේමාව යටතේ පැවැත්වේ. සිංහල භාෂා සාහිත්‍ය හා සංස්කෘතික අධ්‍යයන විෂය ක්ෂේත්‍රවලට අදාළ තේමාවක් යටතේ ශාස්ත්‍රාලයීය විද්වතුන් වෙනුවෙන් නව දැනුම සම්ප්‍රේෂණය කිරීමේ අරමුණින් 2011 වර්ෂයේ සිට සිංහල අධ්‍යයනාංශ පර්යේෂණ සැසිය වාර්ෂික ව පැවැත්වේ. මෙවර පර්යේෂණ සැසිය වෙනුවෙන් ලැබුණු සාරසංක්ෂේප විශාල ප්‍රමාණයක් අතුරින් සාරසංක්ෂේප සමීක්ෂණ මණ්ඩලය විසින් තෝරා ගන්නා ලද පර්යේෂණ පත්‍රිකා 2022 සැප්තැම්බර් මස 22 සහ 23 දෙදින පුරා ඉදිරිපත් කෙරේ. ප්‍රවාහන අපහසුතා මෙන් ම පර්යේෂකයන්ගේ ඉල්ලීම් ද සැලකිල්ලට ගනිමින් මෙවර පර්යේෂණ සැසිය දෙමුහුම් ක්‍රමයකට පැවැත්වීමට සංවිධායක මණ්ඩලය විසින් තීරණය කෙරිණි. ඒ අනුව ශාස්ත්‍ර පීඨ පරිශ්‍රය තුළ මෙන් ම මාර්ගගත ව ද ස්වකීය පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීමට පර්යේෂකයන්ට අවස්ථාව සලසා දී ඇත.

සාරසංක්ෂේප පත්‍රිකා පිළිබඳ තත්ත්ව සමීක්ෂණයක යෙදෙමින් ප්‍රමිතකරණ කාර්යය මනාව ඉටු කර දෙමින් සිය වටිනා කාලය කැප කරමින් පර්යේෂණ සැසියේ ගුණාත්මක අගය තීව්‍ර කර ගැනීම සඳහා මහාර්ඝ මෙහෙයක් ඉටු කළ සාරසංක්ෂේප සමීක්ෂණයේ යෙදුණු විද්වත් මණ්ඩලය මෙහි දී කෘතවේදී හදවතින් සිහි කළ යුතු ය. පර්යේෂණ සැසියේ සාර්ථකත්වය උදෙසා අපගේ ආරාධනය පරිදි නව්‍ය පර්යේෂණවලට අදාළ සාරසංක්ෂේප ඉදිරිපත් කළ විද්වතුන් සියලු දෙනාට ද අපි ස්තුතිවන්ත වෙමු.

මෙම කර්තව්‍යය සාර්ථක කර ගැනීමට අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දුන් අධ්‍යයනාංශ ප්‍රධාන ජ්‍යේෂ්ඨ මහාචාර්ය සඳගෝමි කෝපරහේවා මහතාට, විවිධ උපකමිටුවල සක්‍රීය ව කටයුතු කරමින් පර්යේෂණ සැසියෙහි සාර්ථකත්වයට උර දුන් ආචාර්ය මණ්ඩලයට, සහකාර කථිකාචාර්ය මණ්ඩලයට, අනධ්‍යයන කාර්ය මණ්ඩලයට, තාක්ෂණික සහාය ලබා දුන් ශිෂ්‍ය පරිගණක ඒකකයේ සාමාජිකයන්ට, සිංහල විශේෂ උපාධි ශිෂ්‍ය ප්‍රජාවට සහ නන් අයුරින් සහය දුන් සැමට තුති පුද කරමු.

# පටුන


1. වාර්ෂික පර්යේෂණ සැසිය - 2022ඃ මුඛ්‍ය දේශනය 01-13
2. පර්යේෂණ සැසි පෙළගැස්ම 14-23
3. සමෝධාන සැසිය 24
4. සාරසංක්ෂේප 26-90
5. වාර්ෂික පර්යේෂන සැසිය - 2022ඃ උප කමිටු 91

භාෂාව සහ වාග්විද්‍යාව 26-47

1. **Using common knowledge and one's own knowledge as sources of evidentially in Sinhala**
   *Kaushalya Perera*
2. **Relationship between Language and Gender Based Violence with special reference to Sri Lanka**
   *Kumari Thoradeniya*
3. **සංස්කෘත භාෂාවේ 'ලට්' ල කාර රූප හා සිංහල ලිඛිත භාෂාවේ වර්තමාන ක්‍රියා රූප පිළිබඳ අධ්‍යයනයක්**
   චින්තක රණසිංහ
4. **The impact of Digital Textbooks on Digital Literacy in Scondary Education in Sri Lanka**
   *Kumesh Prabhashini*
5. **සිංහල ජාතික පුවත්පත්හි ශීර්ෂපාඨ රචනයේ දී භාවිත භාෂාත්මක ප්‍රයෝග පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්**
   පී.ටී.කේ.අයි. ධර්මසිරි
   කේ.ජී.එන්.එම්. විජේරත්න
6. **Environmental Factors Affecting the Distribution of the Phonologically Conditioned Nominal Suffixes /wɑt/ and /mɑt/ in Contemporary Sinhalese**
   *K.K. Ganushka Randula*
7. **සංස්කෘතික බැඳීම් ගොඩ නැඟීමේ දී භාෂාවේ කාර්යභාරය**
   එස්.එච්.සදීකා ෆර්වින්
8. **පස්වන ශ්‍රේණිය සිංහල කියවීම් පොත්වල විෂය අන්තර්ගතය පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක් (1970 සහ 2019 වර්ෂවල ප්‍රකාශිත පෙළ පොත් ඇසුරෙන්)**
   ප්‍රගීතිකා ජයසේකර
   ප්‍රදීප් ඉඳුනිල් පියරත්න

9. **ඉච්ඡානුකතාව වාක්‍ය විචාරාත්මක ලක්ෂණයක් ලෙස; ලේඛන සිංහලය ඇසුරින් කෙරෙන විමර්ශනයක්**
චමිල ලියනගේ
10. **සිංහල හා හින්දි භාෂණයේ භාවිත ස්ථානවාචී ආදේශක වචන පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්**
දිමුතු දිලුම් ධනංජය විතානගේ
11. **සිංහල හා දෙමළ භාෂාවල ආදේශක නාම භාවිතය**
භාග්‍යා දිල්හානි මාබුලගේ
12. **සිංහලයේ පද බෙදීම - භාෂා සංහිතා සැලසුම පිළිබඳ අධ්‍යයනයක්**
වයි.ඩී. ප්‍රියංකර
13. **සිංහල භාෂාවේ ක්‍රියාපදය පිළිබඳ ව නූතන ව්‍යාකරණඥයන්ගේ විග්‍රහය පිළිබඳ ව තුලනාත්මක අධ්‍යයනයක් (තෝරා ගත් ව්‍යාකරණ ග්‍රන්ථ කිහිපයක් ඇසුරින්)**
චානිකා පියුමාලි දොඹගොල්ල
14. **තහංචි ව්‍යවහාර වාරණය පිළිබඳ සමාජ වාග්විද්‍යාත්මක අධ්‍යයනයක් (වරකාගොඩ ග්‍රාම නිලධාරී වසම ආශ්‍රයෙන්)**
ඩබ්.ඩී.එන්.ඩී. විතානගේ
15. **සිංහල මාධ්‍ය ශාස්ත්‍රීය ලේඛන විද්‍යුත් ප්‍රකාශනයෙහි ගැටලු හා ප්‍රමිතිකරණයෙහි අවශ්‍යතාව**
තමලු මලිත්ත පියදිගම
16. **Morphological and Periphrastic Expressions of Tense and Aspect in Sinhala Language**
Thamalu Maliththa Piyadigama
17. **සිංහල වාක්‍ය රීති අධ්‍යයනය සඳහා වාග් විද්‍යාත්මක ප්‍රවේශයක්**
රනිල් ප්‍රභාත් සෝමරත්න
18. **බදුල්ල නාගරික කලාපයේ භාෂා භූ දර්ශනය පිළිබඳ අධ්‍යයනයක්**
ජේ. එම්. කලණ හසන්ත ජයසුන්දර

**සම්භාව්‍ය සාහිත්‍යය** 48-59

19. **සිංහල සාහිත්‍ය විචාරයෙන් පිළිබිඹු වන ධ්වනි සහ ගුණ-රීති සංකල්ප පිළිබඳ විමර්ශනයක්**
එච්. ඩබ්. බී. අයි. සම්පත්
20. **ථෙරී ගාථා පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අධ්‍යයනයක්**
නදීකා සඳමාලි පීරිස්

21. **Symbolic Representation and Character Portrayal of the Elephant (*Hasti*) in Buddhist Art: Literary Investigation with Reference to the *Nālāgiri-damana* Story in the *Butsaraṇa***
Anuda Kanchana
22. **පුස්කොළ පොත්වල අන්තර්ගත ලේඛන සහ ශිල්පීය විධික්‍රම පිළිබඳ විමර්ශනයක් (මාතලේ සහ මහනුවර ප්‍රදේශවල තෝරා ගත් පුස්කොළ පොත් ඇසුරෙන්)**
දීපාංජනී ඇල්ලෙපොළ
23. **සීගිරි ගීයක් ඇසුරෙන් 'වැටකොළ මල් සහ සීගිරි ළඳුන්'**
සුදේවි රණසිංහ
24. **කෝට්ටේ පද්‍ය සාහිත්‍යයෙන් හෙළි කෙරෙන විශ්වාස හා ඇදහිලි පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්**
එම්.ජේ. නදීශා සඳමාලි
25. **උපමාලංකාර පොදු ජන අත්දැකීම් කෙරෙහි දක්වන සංවේදීතාව පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් : සද්ධර්මාලංකාරය සහ මයූර සන්දේශය ඇසුරෙන්**
පසන් පාදුක්කගේ
26. **වීදාගම මෛත්‍රෙය මාහිමි ලෝවැඩ සඟරාව යළි සංස්කරණය කිරීම පිළිබඳ ව පර්යේෂණාත්මක අධ්‍යයනයක්**
එම්. කේ. සුසන්ත සේනාධිලංකාර
27. **ජාතක අටුවාවේ අන්තර්ගත කථා නාම සිංහලයට නැගීමේ දී දක්වූ සුවිශේෂතා පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්**
එම්. කේ. සුසන්ත සේනාධිලංකාර

නූතන සාහිත්‍යය සහ සාහිත්‍ය විචාරය 60-68

28. **සාහිත්‍ය ඉතිහාසඥයකු වශයෙන් කේ. එන්. ඕ. ධර්මදාසගේ අනන්‍යතාව**
චින්තක රණසිංහ
29. **රත්න ශ්‍රී විජේසිංහගේ කාව්‍ය සම්ප්‍රදානය තුළ සෞන්දර්යාත්මක චින්තනය සමග දේශපාලන දෘෂ්ටිය සංයෝගකරණයේ ස්වාධිකාරකත්වය පිළිබඳ අධ්‍යයනයක්**
අමරසිරි වික්‍රමරත්න
නාලක ජයසේන
30. **ශ්‍රී ලාංකේය දේශපාලනික ව්‍යුහ තුළ මාධ්‍යවේදීන්ගේ භූමිකාව පිළිබඳ කතිකාවː සහෝදරයා ටෙලිනාට්‍යය ඇසුරෙන්**
එච්. ටී. කේ. ඉෂාරා ජයරත්න

31. පෙරදිග ආකෘතිවාදයට සාපේක්ෂව සාහිත්‍ය නිර්මාණයට හා විචාරයට නව පර්යාලෝකයක් එක් කිරීමට අපරදිග ආකෘතිවාදය සමත් වන්නේ ද යන්න පිළිබඳ විමර්ශනයක්

කේ. කේ. එන්. එන්. කාරියවසම්

32. ලාංකේය නාට්‍යය කලාවේ දෘෂ්ටිවාද නිරූපණය : 'සුබ සහ යස' වේදිකා නාට්‍යය ආශ්‍රිත සිද්ධි අධ්‍යයනයක්

එම්.ඒ. දිෂාන් මධුෂන්ක

33. වීරපොකුණේ උපරතන හිමියන්ගේ 'මං' නවකතාවේ අන්තර්ගත අතුරු කතා පිළිබඳ අධ්‍යයනයක්

මනෝජා නවෝදනී ඒකනායක

34. වර්තමාන සිංහල නවකතාවෙන් නිරූපණය වන සංක්‍රාන්තික ලිංගික සමාජභාවී පරපීඩනය පිළිබඳ ව විමර්ශනාත්මක අධ්‍යයනයක්. (තෝරා ගත් නවකතා ඇසුරෙන්)

එච්.එම්.බී.එල්.කේ. හේරත්

35. සාහිත්‍ය නිර්මාණයක අන්තර්ගතයේ පමණක් නොව අකෘතියේ ද අර්ථ ගැබ්වී පවතින ආකාරය පිළිබඳ අධ්‍යයනයක් (තෝරා ගත් නූතන පද්‍ය සාහිත්‍ය කෘති කිහිපයක් ඇසුරින්)

එස්. එම්. එන්. එස්. විමලසේන

36. පුරුෂ මූලික සමාජ සංස්ථාව තුළ පීඩනයට පත් වන පවුල් සංස්කෘතිය පිළිබඳ නූතන ස්ත්‍රීවාදී කියැවීමක් : රුවන් බන්දුජීවගේ කුණ්ඩලකේශී කාව්‍ය ආශ්‍රයෙන්

එම්.එම්.සී.ඩී.වනසිංහ

සිංහල සංස්කෘතිය සහ කලා ශිල්ප 69-90

37. අනුරාධපුර පන්කුලිය විහාරයේ පාදෙණියක සටහන් ව ඇති සෙල්ලිපියක් පිළිබඳ අධ්‍යයනයක්

කරුණාසේන හෙට්ටිආරච්චි

38. ජය ශ්‍රී මහා බෝධිය හා වත්මන් තේවාකරුවන් පිළිබඳ කෙරෙන සමාජ සංස්කෘතික අධ්‍යයනයක්

වසන්ත කේ. දිසානායක

ජී. භවන්ත ප්‍රමෝද් චන්ද්‍රරත්න

39. හොරණ රජමහා විහාරයෙහි ඇති දුර්ලභ ගණයේ සඳකඩපහණක් පිළිබඳ අධ්‍යයනයක්

කරුණාසේන හෙට්ටිආරච්චි

දිල්හානි දිල්රුක්ෂිකා

40. **අලුත් බණ්ඩාර නමින් කිවුලෙගෙදර මොහොට්ටාල ඇදහීමෙන් ප්‍රකාශිත පානම ජනයාගේ උඩරට සම්භවය පිළිබඳ විමර්ශනයක්**

අමරසිරි වික්‍රමරත්න

41. **Factors affecting the vocational Interest of the G.C.E. Advanced Level Students**

E. Randeniya , W.M.C.S Wijesinghe

42. **සිංහල ජන සමාජයේ පවතින විවාහ සම්ප්‍රදායන් සම්බන්ධයෙන් වත්මන් නෛතික පිළිගැනීම පිළිබඳ අධ්‍යයනයක්**

එස්. ආර්. එල්. රෝසා

43. **සිංහල සමාජයේ විවාහ මංගල පෝරු චාරිත්‍රයන් තුළින් නිරූපණය වන සමාජීය හරයන් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්**

එස්. ආර්. ඒ. ආර්. ආර්. ලක්මාල්

44. **කලාගම ජන වංශය හා සබැඳි කිරිපොහොය ශාන්තිකර්මය පිළිබඳ අධ්‍යයනයක්**

පී.ඩබ්.ටී. ඩයන්

45. **පුරාතන ලංකාවේ ඔත්තු සේවය**

එච්.එම්. ඉසුරු හේරත්

46. **ශ්‍රී ලංකාවේ සහ චීනයේ පුර පසළොස්වක පොහෝ දින සැමරුම් පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්**

Huang Yuxuan

47. **දේශීය බුද්ධ ප්‍රතිමා කලාව පිළිබඳ ශාරිපුත්‍රයෙහි එන උපදේශ පිළිබඳ අධ්‍යයනයක්**

ඉවන්තා සඳුනි ජයසේන

48. **උඩරට නර්තනයේ පා සරඹ අභ්‍යාස කිරීමෙහිලා දණ්ඩිකඳ යොදා ගැනීමේ අවශ්‍යතාව පිළිබඳ අධ්‍යයනයක්**

එල්.ඒ.වී. රංගික ජීවන්ත

49. **සිංහල ජන වහරෙහි බෞද්ධාගමික ආභාසය පිළිබඳ අධ්‍යයනයක්**

ඉවන්තා සඳුනි ජයසේන

50. **සම්ප්‍රදායික ලාක්ෂා කර්මාන්තය සහ ඉන් පිළිබිඹු වන සමාජ ස්තරායනය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් (මහනුවර යුගයේ පාරම්පරික ලාක්ෂා කර්මාන්තය ඇසුරෙන්)**

ඩබ්.එම්.සී.ඩී. වනසිංහ

51. **පබ්බතාරාම ආශ්‍රිත ව හඳුනාගත හැකි බෞද්ධ ආරාම සංවිධානයේ සංවිධිත බව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්**

යූ.ඩී.ආර්. ෂෙහාන් තිලකරත්න

52. **අභිචාරාත්මක ප්‍රතිකාර ක්‍රම සහ සංකේතිය ප්‍රාග්ධනය : මොරවක් කෝරළය ආශ්‍රයෙන් කෙරෙන සංස්කෘතික අධ්‍යයනයක්**

ශයිනි කරුණාරත්න

53. **ඓතිහාසික පඬිවිට ඉසිඹුහලේ කලාත්මක හා වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳ ව විමර්ශනයක්**
සුහසිංහ ආරච්චිගේ ප්‍රසන්න
54. **සීගිරිය කෞතුකාගාරයේ ප්‍රදර්ශිත තෝරා ගත් පුලුටු මැටි රූ පහක් පිළිබඳ රූප විද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්**
මල්ෂා මධුශානි රණසිංහ
55. **මානසික ආතතිය අවම කරගැනීමෙහි ලා ජන කවියේ උපයෝගීතාව**
ආර්. නිරංජන් මදුශංක තෙන්නකෝන්



## වාර්ෂික පර්යේෂණ සැසිය - 2022
## මුඛ්‍ය දේශනය

මහාචාර්ය සරත් විජේසූරිය

නූතන සිංහල සාහිත්‍යය විෂයෙහි නිර්මාණකරුවෙකු, විචාරකයෙකු හා ප්‍රකට දේශකයෙකු ලෙස ශාස්ත්‍රීය ප්‍රජාව තුළ ස්වකීය අනන්‍යතාව සටහන් කළ මහාචාර්ය සරත් විජේසූරිය මහතා කොළඹ විශ්වවිද්‍යාලයෙන් ස්වකීය ප්‍රථම හා පශ්චාද් උපාධි සුදුසුකම් සම්පූර්ණ කළ ශාස්ත්‍රඥයෙකි. විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකු අවධියේ සිට ම මේ දක්වා ම ලේඛන කලාවෙහි අඛණ්ඩ ව නිරත ව සිටින මහාචාර්ය සරත් විජේසූරිය මහතා නවකතා, කෙටිකතා සංග්‍රහ හා ශාස්ත්‍රීය ග්‍රන්ථ ගණනාවක් ප්‍රකාශයට පත් කර ඇති අතර ඔහු විසින් රචිත **නිර්මාණ අධ්‍යයනය** කෘතියට 1995 වර්ෂයේ දී හොඳ ම ශාස්ත්‍රීය ග්‍රන්ථයට හිමි රාජ්‍ය සාහිත්‍ය සම්මානය ද පිරිනැමිණි. 1989 දී කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අංශයේ සේවයට සම්බන්ධ වූ එතුමා එම වසරේදී ම **අවිදු අඳුර** නවකතාවේ අත්පිටපතට හොඳ ම නවකතා අත්පිටපතට හිමි වන ඩී.ආර්. විජේවර්ධන සම්මානය ද දිනාගන්නට ද සමත් විය. 2005 වසරේ දී ඒ මහතාට ජපන් තානාපති කාර්යාලය විසින් විශිෂ්ට නිර්මාණාත්මක ලේඛකයෙකුට පිරිනැමෙන **බුන්කා සම්මානය** ද හිමි විය. තිස්පස් වසරකට ආසන්න ස්වකීය සේවා කාලය තුළ විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන්ට සිංහල නාට්‍ය කලාව, නවකතාව, කෙටිකතාව හා පද්‍යය මෙන් ම සාහිත්‍ය නිර්මාණකරණය පිළිබඳ ශාස්ත්‍රීය ඥාන සම්පාදන කාර්යයෙහි සක්‍රීය වූ විද්වතෙකු ලෙස මහාචාර්ය සරත් විජේසූරිය සිංහල අධ්‍යයනාංශයේ නොමද ගෞරවයට පාත්‍ර වේ.

## මුඛ්‍ය දේශන පිටපත

# නිර්මාණකරණය හා විචාරය

කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අංශය සංවිධානය කරන 2022 වාර්ෂික පර්යේෂණ සැසියට අදාළ කරගෙන තිබෙන විෂය ක්ෂේත්‍ර සතරින් එකක් වන 'සාහිත්‍ය නිර්මාණය හා විචාරය' යන්න පදනම් කරගෙනයි මා මේ දේශනය පැවැත්වීමට අදහස් කළේ. සැහෙන කාලයක සිට නිර්මාණකරණයේ ද, ඊට සමාන කාලයක් තිස්සේ සාහිත්‍ය විචාරයේ ද නිරතව සිටින කෙනකු ලෙස මගේ අදහස් කීපයක් ඉදිරිපත් කරන්නයි මං කල්පනා කරන්නේ. නිර්මාණකරුවා සහ විචාරකයා අතර 'සාධනීය හා යහපත්' සම්බන්ධතාවක් නැති බැවින් 'නිර්මාණය සේ ම විචාරය දුබල තලයක පවතින්නේය' යන කාරණයයි මා සාකච්ඡා කිරීමට අපේක්ෂා කරන්නේ. මගේ අදහස් දැක්වීම තුළ ඉදිරිපත් වන යම්යම් විවේචන මටත් අදාළ බව ද මුලින් ම කියන්න කැමති යි.

මෙහි දී මා ගොඩ නඟන ප්‍රවාදය වන්නේ, ලංකාවේ සාහිත්‍ය නිර්මාණය හා විචාරය යන උභය කාර්යය ම කාලයක සිට "හුදෙකලාව, අසරණව, එක ම විදිහකට අයාලේ යන" තත්ත්වයක තිබෙන්නේය යන්න යි.

ප්‍රථමයෙන් ම **'නූතන සාහිත්‍ය විචාරය'** ලංකාවේ වැඩී වර්ධනය වූ අන්දම සම්බන්ධ නිරීක්ෂණ කිහිපයක් දක්වන්න කැමති යි.

නූතන සාහිත්‍ය විචාරය සම්බන්ධයෙන් න්‍යායික මැදිහත්වීමක් ලෙසින් අපට මුලින් ම හඳුනාගන්නට ලැබෙන්නේ, **සාහිත්‍යය හා සමාජය** මැයෙන් කොටහේනේ පඤ්ඤාකිත්ති හිමියන් 1940 දී රචනා කොට පළ කළ, පසු ව තව දුරටත් සංස්කරණය කළ කෘතිය යි. මේ කෘතියෙන් මතු කරන විචාර දෘෂ්ටිය වන්නේ, පසු කලෙක මහාචාර්ය ඒ.වී සුරවීර **සමාජීය සාහිත්‍ය විචාර විධික්‍රමය** යනුවෙන් වර්ධනය කරන්නට ප්‍රයත්න දැරූ විචාර මාර්ගය යි. එදා උන් වහන්සේ ඉදිරිපත් කළ මූලික විග්‍රහයන් දෙකක් තිබුණා.

01. " සාහිත්‍යය නිශ්චල දෙයක් නොවේ. එය සචල දෙයකි. එහි ස්වරූපය වෙනස් වේ. විශාල වේ. දේශ කාල අනුව පෙරළීම එහි ස්වභාවය වේ. ඊයේ තෙක් පැවති සාහිත්‍යය අදට නොගැළපේ...සමාජය පෙරළෙන විට සාහිත්‍යය ද පෙරළේ. එහිලා පරිවර්තනය වන්නේ සාහිත්‍යය නොව සාහිත්‍යික රුචිය යි. රුචිය පෙරළෙත් ම එයට අයත් විෂයයන් අතර ද පෙරළි හට ගනී. ඇතැම් විෂයයෝ පහව යෙති. අමුතු විෂයයෝ වැද ගනිති." (06 පිටුව)

02." මානවතාව අද සාහිත්‍යයෙහි විෂය වේ. මුළු මනුෂ්‍ය ජීවනය ම නිඛිල ජන සමාජය ම මෙකල සාහිත්‍යයට ගෝචර ය. පෙර මෙන් අද සාහිත්‍යයිකයා රාජ සභාවට හෝ පණ්ඩිත සභාවට සීමා වී නැත. හේ අද සාමාජිකයෙකි. පොදු

මිනිසෙකි. පෙර විසූ ඇතැම් කවීන් මෙන් ව්‍යක්තිවාදය - ස්වකීය පෞද්ගලික හැඟීම් - නිසා මනෝ රාජ්‍යයෙහි සැරිසැරීම ඔහුගේ කාර්යය නොවේ. ජීවිත සංග්‍රාමයෙහි ඔහු විසිනුදු කළ හැකි විශාල සේවයක් තිබේ. එය වෙන කිසිවකු විසිනුත් පිරිමැසිය නොහැකි ය.'' (16 පිටුව)

පඤ්ඤාකිත්ති හිමියන් යෝජනා කර තිබෙන්නේ සාහිත්‍ය කෘතිය එය පහළ වූ සමාජය මත තබා තක්සේරු කළ යුතුය යන්න යි.

**නූතන සාහිත්‍ය විචාරය** සම්බන්ධයෙන් දෙවෙනි න්‍යායික මැදිහත්වීම ලෙසින් හඳුනාගන්නට ලැබෙන්නේ එදිරිවීර සරච්චන්ද්‍ර විසින් රචනා කොට පළ කරන ලද, පසු ව තව දුරටත් සංස්කරණය කළ **සිංහල නවකථා ඉතිහාසය හා විචාරය (1951)** නමැති කෘතිය යි. සරච්චන්ද්‍රයන් වර්ධනය කළ විචාර විධික්‍රමයට අනුව සාහිත්‍ය කලාවේ වැදගත් ම අංශය වන්නේ මනුෂ්‍ය ජීවිතය හා මනුෂ්‍ය සම්බන්ධතා නිරූපණය කිරීම යන්න යි. ඔහු යෝජනා කරමින් තහවුරු කරන්නට යෙදුණේ කෘතියක නිරූපිත චරිත ඔස්සේ 'මනුෂ්‍ය ජීවිතය' සම්බන්ධ විවරණය සලකා බැලීම යි. සිය විචාර දෘෂ්ටිය ඉදිරිපත් කරමින් ඔහු වැදගත් අදහස් තුනක් එම කෘතියෙන් දක්වනවා.

01. '' සාහිත්‍යය ජීවිතයට වඩා ළං විය යුතු යයි ද ජීවිතය විවරණය කිරීම, ජීවිතය පිළිබිඹු කිරීම ආදිය සාහිත්‍යයේ පරමාර්ථය විය යුතු යයි ද විද්වතුන් විසින් පිළිගනු ලැබී ය...කථාවකින් ලැබෙන ආස්වාදය තියුණු වීමට නම්, ජීවිත කාර්යය සඳහා එයින් ලැබෙන ප්‍රයෝජනය විපුලතර වීමට නම්, එයින් ඇති වන සහෘද කම්පාව ගැඹුරු වීමට නම්, එය හැකිතාක් විශ්වසනීය විය යුතු ය; එය ජීවිත සුවඳ හමන්නක් විය යුතු ය; එය ජීවන පුස්තකයෙන් ගත් පත් ඉරුවක් සේ විය යුතු ය; යන අදහස බහුල ව ප්‍රචලිත විය.'' (04 පිටුව)

02. කල්පිත කථා සම්ප්‍රදායේ වර්තමාන සංවර්ධනය සිදු වූයේ අපරදිග සාහිත්‍යයන්හි හෙයින්, අපරදිග රසාස්වාදන ක්‍රම සසඳා බැලීම වටනා බව අවිවාදයෙන් පිළිගත යුත්තකි. ඒ අතර ම, නවකතාවේ නියම රසය හඳුනා ගැනීම සඳහා බටහිර සාහිත්‍යයන්හි පහළ වූ ශ්‍රේෂ්ඨ නවකතා ඒ ඒ භාෂාවලින් හෝ නැතහොත් සිංහලයට කරන ලද පරිවර්තනවල මාර්ගයෙන් හෝ මැනවින් පරිශීලනය කිරීම අත්‍යවශ්‍ය බව ද කිය යුතු ය. එබඳු තුලනාත්මක දැනීමක් නැත්තවුන්ට, මේ කෘතියෙහි කරන ලද විවේචන ආදිය අත්තනෝමතික ව බැස ගන්නා ලද තීරණ සේ පෙනෙන්නට පුළුවන. මෙහි එන තීරණවලට තුඩු දුන් කරුණු නොදන්නා තැනැත්තා ඒවා පක්ෂ භජනයකින් කරන ලද තීරණ යයි සැලකීම පුදුමයක් නොවේ.'' (04 පිටුව)

03.''විශ්ව සාහිත්‍යයෙහි මිම්ම ය, මෙකල සාර්වත්‍රික වශයෙන් පිළිගනු ලබන්නේ. කිසියම් දේශීය සීමාවක් ඇතුළත සාමාන්‍ය පාඨකයන්ගේ රුචිය විවිධාකාර විය හැකි

වුව ද, විචාරවත් පාඨකයන්ගේ රුචිය ලොව පුරා සම තත්ත්වයක පවතී...එහෙයින්, කවර බසකින් වුව ද මෙකල නිර්මාණය කරන ලද සාහිත්‍යය මිනිය යුත්තේ දේශීය මිම්මකින් නොව විශ්ව සම්මත සාර්වත්‍රික මිම්මකිනි. (04 පිටුව)

නූතන සිංහල සාහිත්‍ය නිර්මාණ ප්‍රමාණ කිරීම හෝ විචාරයට ලක් කිරීම විෂයෙහි එදා මෙදා තුර දැන හෝ නොදැන ඉවහල් කර ගැනෙනුයේ සරච්චන්ද්‍ර පෙන්වා දුන් විචාර සිද්ධාන්ත යි.

සරච්චන්ද්‍රට සමගාමී ව නූතන සාහිත්‍ය විචාරයේ යෙදුණු ප්‍රධාන විචාරකයා වන්නේ මාර්ටින් වික්‍රමසිංහ යි. වික්‍රමසිංහගේ නිර්මාණ නියමාකාර ව ප්‍රමාණ කිරීම හා විචාරයට ලක් කිරීම කරන ලද්දේ සරච්චන්ද්‍ර විසින් වන නමුත් පසු කලෙක සරච්චන්ද්‍ර විචාර විධික්‍රමවලට වික්‍රමසිංහ එරෙහි වූවා. එරෙහි වූවා පමණක් නොව අභියෝග කරන තත්ත්වයකට ද වික්‍රමසිංහ පත් වුණා. එම ස්වභාවය වික්‍රමසිංහගේ **නවකථාංග හා විරාගය (1965)** කෘතියෙන් හා **ජපන් කාම කථා හෙවණැල්ල (1969)** යන කෘතිවලින් හඳුනා ගන්නට හැකියි.

ගුණදාස අමරසේකරගේ නිර්මාණ අගය කිරීම හා ප්‍රමාණ කිරීම හා විචාරයට ලක් කිරීම සිදු කරන ලද්දේ ද සරච්චන්ද්‍ර විසින්. පසුකලෙක යම් ප්‍රමාණයකට වික්‍රමසිංහට අනුගත වෙමින් අමරසේකර ද සරච්චන්ද්‍රගේ විචාර විධික්‍රමවලට අභියෝග කරන්නට වුණා. අමරසේකරගේ විවේචනය විධිමත් ව ඉදිරිපත් කෙරුණේ **අබුද්දස්ස යුගයක් (1976)** කෘතියෙන්.

සරච්චන්ද්‍රගේ විචාර ක්‍රමය හෙවත් ඔහු නිර්මාණ ප්‍රමාණ කිරීම ගැන නොසතුට පළ කළ තවත් දෙදෙනෙක් සිටියා. ඉන් එක් අයෙකු වන්නේ **ජී.බී. සේනානායක** යි. අනෙක් තැනැත්තා **සිරි ගුනසිංහ** යි. මේ නොසතුට සඳහා ඉවහල් වී තිබෙන්නේ වැදගත් ශාස්ත්‍රීය කරුණු කාරණා නොව අතිශය පෞද්ගලික හේතු සාධක බව කුප්‍රකට යි. ඒ සම්බන්ධ කිසිවක් මෙහි දී කියන්නට මා අපේක්ෂා කරන්නේ නෑ.

තවත් කරුණක් කෙටියෙන් පවසන්නට මා කැමැතියි. එය නම්, සරච්චන්ද්‍ර නමැති නිර්මාණකරුවාගේ නිර්මාණ ප්‍රමාණ කිරීම විධිමත් ව විචාරකයෙකු වශයෙන් සිදු කළ තැනැත්තෙකු ද නූතන සිංහල සාහිත්‍ය කලා විචාරයට යම් ආලෝකයක් ලබා දුන් බව යි. ඒ, **රෙජී සිරිවර්ධන.** ඔහු ඉංග්‍රීසි භාෂාවෙන් ලිපි ලේඛන ලියූ කෙනෙකු බැවින් සිංහල පාඨක සමාජය තුළ අඩු අවධානයකට ලක් වූවෙක්. අවධාරණයෙන් කිව යුත්තේ ඔහු ද අනුදත් විචාර විධික්‍රමය "විශ්ව සම්මත මිනුම් දණ්ඩ" යන්න බව යි.

සරච්චන්ද්‍ර නූතන සිංහල සාහිත්‍ය විචාරයෙන් දූරස්ථ වීමෙන් අනතුරුව ඔහුගේ විචාර විධික්‍රමවලට අභියෝග කළ තිදෙනෙකු ලෙස **ඒ. වී. සුරවීර, සුචරිත ගම්ලත් සහ පියසීලී විජේගුනසිංහ** සිහි කළ හැකියි.

ඒ.වී. සුරවීර කොමියුනිස්ට් පක්ෂයට සම්බන්ධ ව එහි සාහිත්‍ය කලා ක්ෂේත්‍රය පිළිගත් 'ස්ටැලින්වාදී චින්තනය' සාහිත්‍ය කියවීමට හා ප්‍රමාණ කිරීමට ඉවහල් කර ගත්තා. ඔහු සිය විචාර රීතිය ලෙසින් පෙන්වා දෙන්නට යෙදුණේ සමාජසත්තා යථාර්ථවාදය යි. මේ සම්බන්ධයෙන් ලිපි ලේඛන පමණක් නොව ඒ ක්ෂේත්‍රයෙහි චින්තකයන්ගේ රචනා ද කෘති ද ඔහු සිංහලයට නැගුවා.

සුචරිත ගම්ලත් සහ පියසීලී විජේගුනසිංහ යන දෙදෙනා නිල වශයෙන් හා නොනිල වශයෙන් 'කම්කරු මාවත' නම් දේශපාලන පක්ෂය (පසුව සමාජවාදී සමානාත්මතා පක්ෂය) නියෝජනය කළ අය යි. ඔවුන් ගුරු කොට ගත්තේ ට්‍රොස්කිවාදය යි. මේ දෙදෙනා සරච්චන්ද්‍ර හැඳින්වූයේ 'විඥානවාදියෙකු' හැටියට යි. මේ දෙන්නා මාක්ස්වාදී ප්‍රවේශයකින් සාහිත්‍ය කලා නිර්මාණ ප්‍රමාණ කිරීමට ප්‍රෝත්සාහී වුවත්, ඔවුන් සාහිත්‍ය කෘතියක් - කලා කෘතියක්, ආස්වාදනය කර තිබෙන අන්දම සියුම් ව විමර්ශනය කර බලන විට පෙනී යන්නේ, සරච්චන්ද්‍ර අනුදත් 'විශ්ව සම්මත මිනුම් දණ්ඩ' ඔවුන් ද භාවිතයට ගෙන තිබෙන බව යි. උත්ප්‍රසාය නම් පසුකලක පියසීලී විජේගුනසිංහගේ විචාර විධික්‍රම දරුණු ලෙස විවේචනය කරන්නෙකු බවට සුචරිත ගම්ලත් පත් වීම යි. පියසීලී විජේගුනසිංහත් ඊට ප්‍රතිප්‍රහාර එල්ල කිරීමට පසුබට වූයේ නැහැ. මේ දෙදරීමට අදාළ වූයේ සුචරිත ගම්ලත් 'සරච්චන්ද්‍රාභිනන්දන' මැයෙන් සිදු කළ දේශනයෙන් අනතුරුව නිල වශයෙන් ඔහු ව පක්ෂයෙන් නෙරපා හැරීම යි.

මා මෙහි දී පෙන්වා දෙන්නට උත්සාහ කළේ සාහිත්‍ය විචාරයේ පුරෝගාමී චරිත විදහා පෑ අර්බුදය හුදෙක් ශාස්ත්‍රීය කාරණා ම පදනම් කර නොගත් බව මෙන් ම ඊට අදාළ වී තිබෙන්නේ පෞද්ගලික කාරණා ද බවයි.

නූතන නිර්මාණ සාහිත්‍යයේ ප්‍රධාන භූමිකා හිමි කරගත් චරිත අතර **මාර්ටින් වික්‍රමසිංහ, ජී.බී. සේනානායක, ගුණදාස අමරසේකර,කේ. ජයතිලක සහ මහගම සේකර** කැපී පෙනෙනවා. මේ පස් දෙනා ම ශාස්ත්‍රාලයීය පසුබිමකින් මතු වූ අය නොවේ. අමරසේකර 'සරච්චන්ද්‍ර යුගයේ' පේරාදෙණි විශ්වවිද්‍යාලයේ සිටි කෙනෙකු වුවත් ඔහු හැදෑරුවේ දන්ත වෛද්‍ය විද්‍යාව යි.

මහගම සේකර හැර අන් සියල්ලන්ගේ ම මුල් කාලීන කෘති ප්‍රමාණ කළේත් විචාරයට ලක් කළේත් සරච්චන්ද්‍ර යි. සැබවින් ම මොවුන් නූතන සාහිත්‍ය ක්ෂේත්‍රයේ නිසි තන්හි අසුන් ගන්වන ලද්දේ සරච්චන්ද්‍ර විසිනුයි. මේ නිර්මාණකරුවන් සරච්චන්ද්‍ර විචාර විධික්‍රම පසු කලක ප්‍රතික්ෂේප කිරීමට පෙලඹුණත්, ගුණදාස අමරසේකර පමණයි, සිය නිර්මාණ සම්බන්ධ සරච්චන්ද්‍රගේ ප්‍රමාණ කිරීම් විවෘත ව ප්‍රතික්ෂේප කළේ. කේ. ජයතිලක සරච්චන්ද්‍රගේ විචාර විධික්‍රමවලට අභියෝග කළේ නැහැ. ඔහු ජනතා ලේඛක පෙරමුණ නියෝජනය කරමින් මැදහත් තැනක සිටියා.

මාක්ස්වාදී විචාර විධික්‍රමයක පිහිටා සාහිත්‍ය කෘති ප්‍රමාණ කිරීමේ යෙදුණු සුචරිත ගම්ලත් සහ පියසීලී විජේගුනසිංහ යන දෙදෙනා ද ඉමහත් අවධානයෙන් අගය කළ නූතන සිංහල සාහිත්‍ය නිර්මාණ අතර ඉහළින් ම තිබෙන්නේ සරච්චන්ද්‍ර ප්‍රමාණ කළ වික්‍රමසිංහ සහ ගුණදාස අමරසේකරගේ නිර්මාණ බව ද මෙහි දී සඳහන් කළ යුතුයි.

අමරසේකරගේ ප්‍රතික්ෂේප කිරීම හා මාක්ස්වාදීන්ගේ පිළිගැනීම පවසන්නේ කුමක් ද?

හැම නිර්මාණකරුවෙකුට ම තමන්ගේ නිර්මාණය ඉහළ යි. ස්වභාවයෙන් එහි ගුණ මිස දොස් දකින්න බොහෝ අය කැමතිත් නෑ. එහි එදා සහ අද කියා වෙනසකුත් නැති බව පෙනී යනවා. මේ දුර්වල මානසික තත්ත්වය නිසා සාහිත්‍ය කලා විචාරය නිර්මාණකරණයේ අභිවෘද්ධිය හා පාඨකයාගේ වින්දන චින්තන ශක්තිය දියුණු කිරීමේ අරමුණින් විවෘත අවකාශයක වැඩී වර්ධනය නොවුණ බවයි, මගේ නිරීක්ෂණය. අද වන විට නිල වශයෙන් පෙනී සිටින කැපවුණ විචාරකයන් සාහිත්‍ය කලා ක්ෂේත්‍රයේ නැති තරම්. හැම දෙනාම විචාරකයන් වී සිටින තත්ත්වයක් අද විද්‍යමාන වන්නේ. නිර්මාණකරුවන් කිහිප දෙනෙකු සාධනීය ප්‍රයත්න දැරුවත් ඒවා පාඨකයා අතර හෝ නිර්මාණකරුවන් අතර නියමාකාර කතිකාවන් ගොඩ නඟන තත්ත්වයකට පත් ව නැහැ. ශාස්ත්‍රාලයීය උගතුන්ට සාහිත්‍ය කලා විචාරය වැඩබිමක් නොවී තිබෙන අතර ඔවුන් පිටස්තරයන්ගේ අදහස් හා මතිභ්‍රම මතින් යැපෙන තත්ත්වයක් ද අද පෙනෙන්නට තිබෙනවා. විචාරකයාගේ භූමිකාව පවතින්නේ පදනමක් නැති තත්ත්වයක බව ද කිව යුතුයි.

අද සාහිත්‍ය කෘති විචාරය සහ විනිශ්චය යන උභය කාර්යයෙහි ම නිමග්න අය ඒ ඒ කටයුතුවලට කවර සුදුසුකම් සපුරා ඇත් ද යන්න නිතර මතුවන ප්‍රශ්නයක්. වත්මනේ ලංකාවේ පූර්ණ කාලීන නිර්මාණකරුවන් ලෙස සැලකිය හැකි පිරිසක් සිටියත්, පූර්ණ කාලීන විචාරකයන් ලෙස සඳහන් කළ හැකි පිරිසක් නැහැ. ඊට එක හේතුවක් වන්නේ විචාර කලාව වෘත්තීය මට්ටමක නොපැවතීම යි. එය වෘත්තීය මට්ටමකින් ඉහළට ඔසවා තබා ගත යුත්තේ ශාස්ත්‍රාලයීය උගතුන්. ඔවුන් එය සාධනීය මට්ටමකින් සිදු නොකරන බැවින් විචාර ක්ෂේත්‍රයට අවතීර්ණ ව නෙක හරඹ පාන්නේ සිංහල සාහිත්‍ය සම්ප්‍රදාය විධිමත් ව හදාරා නැති පිටස්තරයන්. වරින් වර ඔවුන් මතු වී නැති වී යනවා. ඒ අයගෙන් වැඩි දෙනෙකු නූතනවාදී අදහස් දන්නා කියන අය හෝ ඒවා අසා දැනගත් අය විය හැකියි. වැඩි දෙනෙකු වැඩ පටන් ගන්නේ ම සරච්චන්ද්‍ර හෙළා දැකීමකින්. නූතන සිංහල සාහිත්‍ය නිර්මාණ ප්‍රමාණ කිරීමට කැපවුණ කාර්යභාරයක් සිදු කළ සරච්චන්ද්‍ර සාහිත්‍ය විචාරයේ අපරාධකාරයෙකු වීම එක අතකින් ශෝචනීය යි, තවත් අතකින් නාටකීය යි.

ඇතැම් සාහිත්‍ය කලා නිර්මාණ සම්බන්ධ සාකච්ඡාවල දී ප්‍රකාශ වුණ අදහස් කීපයක් මේ.

''...මෙහි දී මා අදහස් දක්වන්නේ විචාරකයෙකු වශයෙන් නොවෙයි, මං විචාරකයෙක් නෙමේ...''
''...මම සාහිත්‍යකරුවෙක්වත් විචාරකයෙක්වත් නොවෙයි, සංවිධායකයන් මට ආරාධනා කළේ කැමති දෙයක් කථා කරන්න කියලා. අනික මට මේ පොත ලැබුණෙ ගිය සතියෙ. මට සම්පූර්ණයෙන්ම කියවා ගන්න බැරි වුණා. ඒත් මට කියන්න පුළුවන් පැහැදිලිව ම මේක තමයි සිංහල නවකතාවේ මෙතෙක් කල් කිසිවෙකුත් නොලියූ කතාව බව නම්...''
''...මම මේ කෘතිය කියවලා ඇත්තට ම අසනීප වුණා. ඒ තරම් කම්පනයක් මා තුළ ඇති කළ කෘතියක්...''
''...මම මෙච්චර කාලයක් හිතා හිටියෙ අපේ රටේ කෆ්කා අජිත් තිලකසේන කියලා. අද තමයි මට කෆ්කා ඇත්තටම හම්බ වුණේ...''

මේ වගේ වැකි ලිඛිත ව පුවත්පත්වලත්, අන්තර්ජාලයේත් අප්‍රමාණ යි. මේ අද විචාර කාර්යය නම්, නිර්මාණකරණයට මේ විචාරය සලසන සෙත කුමක් ද?

මෙහි දී මා අවධාරණය කර සිටින්නේ වත්මනේ සාහිත්‍ය කලා විචාරය වැදගත් ශාස්ත්‍රීය පදනමක නැති බව යි. ඊට පෞද්ගලික ආකල්ප අදාළ වී තිබෙන බව යි.

මගේ ඊළඟ ප්‍රවාදය නම් නූතන සිංහල සාහිත්‍ය නිර්මාණකරුවන් සහ සාහිත්‍ය විචාරය අශාස්ත්‍රීය සහ කනගාටුදායක පසුගාමී තත්ත්වයක් මුල් අවධියේ සිට ම විශද කරන බව යි. කාලය ගැන සලකා මේ කරුණ මා එක් සාහිත්‍යධරයෙකු ඔස්සේ විවරණය කර දැක්වීමට කැමැතියි. ඒ සඳහා මා ඉවහල් කර ගන්නේ **ජී.බී.සේනානායක** නමැති නිර්මාණකරුවා හා විචාරකයා යි.

සාහිත්‍යකරුවා හා විචාරකයා අතර ගැටුමට අදාළ එක් කරුණක් පාදක කරගෙනයි,මා සේනානායක හරහා මගේ ප්‍රවාදය ඉදිරිපත් කරන්නේ.

නූතන සිංහල කවිය සහ කෙටිකතාව යන සාහිත්‍යාංග දෙක කලාත්මක සන්දර්භයක් තුළ ගොඩ නැඟීමට සේනානායක වැදගත් මෙන් ම පුරෝගාමී කාර්යයක් නිර්මාණකරුවෙකු ලෙසින් ඉටු කළා. නවකතාව විෂයෙහි කෙසේ වෙතත් කෙටිකතාව සහ කවිය යන සාහිත්‍යාංග දෙක සම්බන්ධයෙන් අදටත් සේනානායක සාහිත්‍ය සම්භාෂණයෙන් වියුක්ත වෙලා නැහැ.

ශාස්ත්‍රාලයීය අධ්‍යාපනයක් නොලැබුවත් ද්විභාෂික උගතෙකු වශයෙන් ලෝක සාහිත්‍යය පරිශීලනය කිරීමට තිබුණ සමත්කම නිසා ඔහු සාහිත්‍ය කලාව සම්බන්ධ දැනුමක් ද අපට ප්‍රදානය කළා. ඔහු එහි දී විචාරකයෙකුගේ භූමිකාවක් නිරූපණය නොකළ බව මගේ අදහස යි. **නවකථා කලාව (1946), බටහිර ශ්‍රේෂ්ඨ නවකථා (1955), සාහිත්‍ය සේසත් (1957) විචාර ප්‍රවේශය (1960), සාහිත්‍ය විග්‍රහය (1961) සාහිත්‍ය ධර්මතාව (1963)** යන කෘති ඔහුගේ සාහිත්‍ය ඥානය පළ කරන කෘති යි. මේ සෑම

කෘතියකින් ම ඔහු උත්සාහ කරන්නේ ලෝක සාහිත්‍යය ගැන ඔහුගේ වින්දනය 'දැනුමක්' ලෙස ඉදිරිපත් කිරීමට යි. කිසියම් අරමුණකින් ඔහු එය කළත් විචාරකයාගේ භූමිකාවට ඔහු ප්‍රවේශ වන්නේ නැහැ. ඊට අදාළ මතයක ඔහු පිහිටා සිටි කෙනෙකු බවයි පෙනී යන්නේ.

නිර්මාණකරුවා සහ විචාරකයා යනු දෙදෙනෙක් ද? මේ භූමිකා දෙක ම එක් අයෙකුට නියෝජනය කළ නොහැකි ද? විචාරකයා අතර පැවතිය යුත්තේ කවරාකාර සම්බන්ධතාවක් ද? විචාරකයා යනු නිර්මාණකරුවාගේ මිතුරෙක් ද? නැතිනම් සතුරෙක් ද?

මේ ගැන සේනානායකගේ මතය දක්වන්න කැමතියි. විචාරකයාගේ කාර්යය යනු "කෘතියක් අගය කිරීම" යන්න සේනානායකගේ මතය යි. තවත් අවස්ථාවක විචාරයේ මූලික කාර්යය 'ගුණ දොස් දැකීම' බව ද ඔහු පවසනවා. ඔහු අවධාරණය කරන්නේ, 'අගය කිරීම හෝ ගුණදොස් දැක්වීම නිර්මාණකරුවෙකු නොකළ යුත්තක්' බව යි. රංජිත් අමරකීර්ති පලිහපිටිය සංස්කරණය කළ **වියතුන් සබා මැද (1987)** කෘතිය තුළ ජී.බී.සේනානායක පහත අදහස දක්වනවා.

''විශේෂයෙන් ම මා කිව යුතු එක් කාරණයක් තිබෙනවා. එනම් මගේ සමකාලීන ලේඛකයන්ගේ පොත්වල ගුණ දොස් නොසෙවීම මගේ ප්‍රතිපත්තියක් බව යි. මා සාහිත්‍යය ගැන කතා කරන්නේ පොදුවේයි. පොත් ගැන ගුණ දොස් කිව යුත්තේ විචාරකයා විසිනුයි. එය විශේෂ කාරණයක්..." (72 පිටුව)

එම කෘතිය තුළ ම තව දුරටත් අදහස් දක්වන සේනානායක සිය මතය සාධාරණීකරණය කරන්නේ මෙලෙසින්.

''මා පෙන්වා දෙන්න කැමති යි, සමර්සෙට් මෝම් නමැති ඉංග්‍රීසි ලේඛකයාගේ (A Writers Note Book) ලේඛකයෙකුගේ සටහන් පොත, නමැති පොතේ එන කරුණු කීපයක්.''

''සමර්සෙට් මෝම් ඉංග්‍රීසි ලේඛකයකු නිසා එංගලන්තයේ සාහිත්‍ය ලෝකය පිළිබඳ ඔහුට හොඳ අවබෝධයක් තිබුණා. එමෙන් ම දීර්ඝ කාලයක් ප්‍රංශයේ විසූ නිසා ප්‍රංශයේ සමකාලීන සාහිත්‍ය ලෝකය පිළිබඳ ඉතා ම හොඳ අවබෝධයකුත් ඔහුට තිබුණා. මේ පොතේ දෙරටේ ම සාහිත්‍ය ලෝක පිළිබඳ ඉතා තියුණු විග්‍රහයක් කර තිබෙනවා. එහි කියා තිබෙනවා, සමකාලීන ඉංග්‍රීසි ලේඛකයන්ගේ නවකතා විවේචනය කිරීම පමණක් නොව නොකියවීමත් නවකතාකාරයන්ගේ සිරිතක් වග. ඔවුන් හමු වී කතා බස් කිරීමේ සිරිතකුත් නැහැ. එක ලේඛකයෙකුට තව ලේඛකයෙකු හමු වන්නේ ඉතා කලාතුරකින්. එයත් බොහෝ විට මහ පාරේදී. මීට හේතුව වශයෙන් ඔහු දක්වා තිබෙන්නේ කීර්තියට හෝ මුදල් හම්බ කිරීමට හෝ තියුණු තරගයක් නොතිබීම යි. එය නොතිබෙන්න හේතුව එංගලන්තයේ

හැරෙන්නට ඉංග්‍රීසි පොතපතට කැනඩාව ඇමරිකාව යනාදි රටවලත් පැරණි ඉංග්‍රීසි යටත් විජිත ආදියේත් විශාල වශයෙන් පාඨක පිරිසක් සිටීම යි. ප්‍රංශයේ තත්ත්වය මීට වෙනස්. ඊට හේතුව ප්‍රංශ භාෂාවෙන් ලියන පොතපත ඉංග්‍රීසියෙන් ලියන පොතපත තරම් නොවිකිණීම යි. ඔවුනොවුන් කුළල් කා ගන්නවා. කල්ලි හැදෙනවා. කල්ලි හැදිලා තම තමන්ගේ පිට කසා ගන්නවා. ඒ කියන්නේ එකා අනෙකා ප්‍රශංසා කරනවා. ලේඛකයෙකුගේ ඉතා ම හොඳ මිත්‍ර ලේඛකයා පිටු පසින් ඇවිත් පිහියෙන් ඇන්නොත් එය ප්‍රංශයේ පුදුමයට කාරණයක් නොවෙයි. සමර්සෙට් මෝම්ගේ පොතේ කරුණු මං කියෙව්වෙ මීට අවුරුදු බොහෝ ගණනකට ඉස්සර යි. ප්‍රංශයේ තත්ත්වය මේ රටේත් ඇති වී යන බව ගුරුකුල භේද නිසා මා දුටුවා. නමුත් මේ අප්‍රසන්න තත්ත්වය එකල පේරාදෙණියේ ගුරුකුලය මෙන් ඉහළ ම තත්ත්වයකට නැඟ ව්‍යාප්ත වූයේ නැහැ. නමුත් දැන් වාසනාවකට දෝ මේ කුළල් කා ගැනීම් අඩුයි. එයට හේතු වශයෙන් මා හිතන්නේ සාහිත්‍යය ඉතා ම කනගාටුදායක තත්ත්වයකට පත්ව තිබීම යි. දැන් පොරකාලා කුළල් කාගෙන බෙදා ගන්න දෙයක් සාහිත්‍යයේ නැහැ...” (73 පිටුව)

සේනානායක මේ අදහස් පළ කර තිබෙන්නේ 1979 වසරේදි යි. දැස් නොපෙනී හුදෙකලාව සිටි අවධියේ යි. ඇත්ත වශයෙන් ම සමර්සෙට් මෝම්ගේ පොතේ සේනානායක කියන අන්දමේ ම ප්‍රකාශ නැහැ. සේනානායක යම්යම් කරුණු තමන්ට අවශ්‍ය මට්ටමට ගළපා ගෙන තිබෙන වග පැහැදිලි යි. සේනානායකට අනුව විචාරකයා යනු නිර්මාණ කාර්යයෙන් වියුක්ත ව සිටින්නෙකු විය යුතුයි. වෙනත් විදිහකට එය පවසතොත් විචාරකයා යනු ශාස්ත්‍රඥයෙකු විය යුතුය යනුවෙන් දැක්විය හැකියි. සේනානායක පවසන්නේ ලංකාවේ සාහිත්‍ය විචාරය ප්‍රගුණ කළ ශාස්ත්‍රඥයන් නැති බව යි. සිටින්නේ 'ගුරුකුල' නියෝජනය කරන්නන් බව යි. සේනානායක මේ අදහස් පළ කරන්නේ නූතන සාහිත්‍යයේ ආරම්භක ප්‍රවණතා සිදුවුණ අවධියට අදාළ ව යි. එදවස ඔහු නිර්මාණකරුවෙකු ලෙස විචාරකයා නොරිස්සූ කෙනෙක්. ඊට හේතුව මට හිතෙන අන්දමට ශාස්ත්‍රීය කරුණක් නොවෙයි. ඒ නිගමනයට මා එළැඹෙන්නේ ඔහු විචාරකයන් නිසා තමන්ට හානි වූ අන්දම භාවාත්මක අන්දමින් පවසා තිබෙන නිසයි. මේ, **විනි විදිමි අඳුර (2008)** කෘතිය තුළ එන ඔහුගේ අදහස් කිහිපයක්.

01. ”මට පහර දී ලියූ ප්‍රවෘත්ති පත්‍ර ලිපියක් නිසා අම්මා හැඬුවා ය. අම්මාට ඊට පසු එවැනි ම පහරදීම් නිසා බඩගින්නේ ඉන්ට සිදු විය. ඈ ජීවත් වූයේ මා පොත් ලියා නිපදවන ලද ආදායමෙනි. ද්වේෂ සහගත ලෙස ලේඛකයන්ට පහර දෙන සාහිත්‍ය කල්ලියක් තිබිණ. අවුරුදු පහළොවකටත් වැඩි කාලයක් මේ කල්ලිය මට පහර දුන්නේය. මෙයින් මට මහත් හානියක් සිදු විය. මගේ පොත් විකිණීම බොහෝ සෙයින් අඩු වී ගියේය. ඒ නිසා මටත් මගේ අම්මාටත් බඩ ගින්නේ ඉන්ට සිදු විය.” (102 පිටුව)

02. ''මගේ අම්මාගේ මරණය හා අවමඟුල පිළිබඳ කරුණු අතීත ජීවිත නමැති අහස අඳුරු කොට වසාගෙන තිබෙන්නේ ය. මගේ සිත ඒ කාලයට ගමන් කරවන කල එය මං මුළා වෙති යි මට හැඟේ. ඊට හේතුව අම්මාගේ මරණය හා අවමඟුල පිළිබඳ ශෝකය ම නොව මා විනාශ කරන්ට වෑයම් කළ මගේ සතුරන්ගේ උත්සාහයේ ප්‍රතිඵලයකි. සාහිත්‍ය කල්ලිය නමැති කණ්ඩායමක් විසින් මට හානිකරන්ට තැත් කළ සැටි මෙහි යට කියා ඇත. ඔවුහු මාත් මගේ අම්මාත් කුස ගින්නේ තැබූහ. එපමණක් නොව මගේ අම්මාට ලෙඩෙහි දී පිළියම් කරන්ට තිබිය යුතු සුළු මුදල වුවත් මට සොයා ගැනීම අපහසු කළහ...'' (110 -  111 පිටු)

'කල්ලියක් සංවිධානාත්මක ව තම කෘති විවේචනය කොට තමා ආර්ථික ප්‍රශ්නවලින් හෙම්බත් කළේය' යන්න සේනානායකගේ මතිභ්‍රමයකි. ඔහු ආර්ථික වශයෙන් අසරණ වන්නේ අතිශය පෞද්ගලික හේතුවක් නිසා ලේක් හවුස් ආයතනයේ රැකියාව අත්හැර දැමීම හේතුවෙනි. එදවස විශාල ආදායමක් ලබන්නට තරම් පොත් සංඛ්‍යාවක් ඔහු ලියා පළ කර තිබුණේ ද නැත. අප සොයා ගත් තවත් කරුණක් වන්නේ පොත් පළ කිරීම කඩදාසි අර්බුදය නිසා මෙකල සීමාසහිත වී තිබුණු බව ය. ප්‍රධාන පොත් සමාගම් දෙක සමග සේනානායක අමනාප වී තිබීම ද එක් කරුණකි. තමා සුළු දෙයින් පවා සැලෙන චරිතයක් ඇත්තෙකු බව සේනානායක ම පවසයි.

මෙහි දී අප සලකා බැලිය යුතු කරුණක් වන්නේ පොත් අලෙවියට පවා බලපෑ විවේචන කවරේ ද යන්නයි. මේ ඉන් කිහිපයකි.

"...ඓතිහාසික නවකතා නමින් පළ කර තිබෙන පොත්වල ඇත්තේ හිතලූ ය. ඉතිහාසය නොකියවා ඇති බව කියන්නට අවශ්‍යත් නැත. බුද්ධ කාලීන භාරත සමාජය ගැන අහුලා ගත් කරුණු විනා නිවැරදි ව බුද්ධ කාලීන භාරත සමාජය මේ පොත්වල නැත..."

"...සිංහල කාව්‍ය සම්ප්‍රදාය ගැන එහෙන් මෙහෙන් දැන ගත්තත් විරිතකට කවියක් ලියා ගන්න බැරිකම නිසා පැළලි කවි ලියන අය හිතනවා තමනුත් කවියන් කියලා..."
 සේනානායකගේ නිර්මාණ භූමිකාවෙන් ම ඔහු 'කෘතියක් අගය කිරීම' ම විචාරකයාගේ කාර්යය නොවන බව සපථ කර තිබෙනවා. ඒ නිගමනයට එළැඹෙන්නේ ඔහු කෙටිකතාකරුවෙකු ලෙසින් ඔහුට පූර්වයෙන් පැවති කතා රීතිය බැහැර කිරීම හා කවියෙකු ලෙසින් ඔහුට පූර්වයෙන් පැවති කාව්‍ය රීතිය බැහැර කිරීමෙන්. ඔහු ඒ උභය කාර්යය ම කරන්නේ නිර්මාණකරුවෙකු වශයෙනුයි. මේ කාරණය ගැන සේනානායක මහතා සමග මා සාකච්ඡා කර තිබෙනවා. ඔහු අවධාරණයෙන් කියුවේ, ' තමා කොළඹ කවියවත් ඩබ්ලිව්.ඒ. සිල්වා ඇතුළු අයගේ කෙටිකතාවත් 'ගර්භාවට' ලක් නොකළ බවයි. එහෙත් තමාට සතුරුකම් කළ කඳවුරක් තමාට හානි කළ බව ඔහු පැවසුවා.

සේනානායක මහතා සිය ජීවිතයේ අවසන් කාලයේ ද පවසන්නට යෙදුණේ

පේරාදෙණි කල්ලිය එදා මෙන් අදත් තමා විනාශ කරන්නට තැත් කරන බවයි. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ඔහුට සම්මාන උපාධියක් පිරිනැමීමට සමාන්තර ව උපහාර ග්‍රන්ථයක් පළ කළා. මා එවක කොළඹ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෙක්. මාත් මේ කෘතිය පළ කිරීමේ වැඩවලට සහභාගි වුණා. කෘතිය පළ කළ උත්සවයට පසුදින සේනානායක මහතාගේ නිවසින් ලැබුණ පණිවිඩයකට අනුව මා ඒ නිවසට ගියා. ඔහු දැඩි දෝෂාරෝපණයක් එක දිගට ම කළා. සතුරන් තමා විනාශ කිරීමට බඩගින්නේ තැබීමට දැනුත් උත්සාහ කරන බවයි ඔහුගේ චෝදනාව වූයේ. ඒ කරුණ සනාථ කරමින් ඔහු **ජී.බී.සේනානායක ප්‍රභාෂණය (1985)** නම් පොතේ ලිපි දෙකක් සඳහන් කරමින් මා ලවා යම් කොටස් කියෙව්වා. මේ ඔහු කෝපයට පත් කළ ලිපි දෙකෙන් උද්ධෘත දෙකක්. පළමු උපුටනය සරච්චන්ද්‍රගේ ලිපියෙන්. දෙවැන්න ගුණදාස අමරසේකරගේ ලිපියෙන්.

01 "ජී.බී. සේනානායක මහතා ගත කරන්නේ නිශ්චල ජලාශයක් මැද පිහිටි, හාත්පසින් ආවරණය වූ දූපතක වෙසෙන්නෙකුගේ දිවි පෙවතට සමාන වූ ජීවිතයකි. නුදුර ඇති මහාද්වීපයෙහි හමන කුණාටු ඔහුගේ දූපතට නොදැනෙන්නා සේ ය. පාරම්පරික චර්යාධර්මයට හා පාරම්පරික පුරුෂාර්ථවලට පැමිණ ඇති අභියෝගය ඔහු නොසලකයි. නවීන විද්‍යාත්මක හා තාක්ෂණික සභ්‍යත්වයේ බලපෑම නිසා අද අපේ විශ්වාස බිඳී ඇත, සමාජ සංස්ථාවල පදනම දෙදරා ඇත. විශේෂයෙන් අප ද අයිති, තුන්වන ලෝකය වශයෙන් හැඳින්වෙන රටවල ජනතාවට මුහුණ පාන්ට තිබෙන ගැටලු බොහෝමයක් පැන නගින්නේ මේ තත්ත්වයෙනි. වර්තමාන සමාජය ඇසුරු කොට තමා ලියූ නවකතාවල පවා සේනානායක මහතා මෙවැනි ධර්මතා විෂය කොට නොගත්තේ ඔහු ඒවා වැදගත් යයි නොසිතන බැවිනි. ඔහු වැදගත් කොට සලකන්නේ මිනිස් චරිතයේ සනාතන ලක්ෂණ ය..." (11 පිටුව)

මේ ලිපියේ ම සරච්චන්ද්‍ර, සේනානායක සම්බන්ධ කර තිබෙන අගය කිරීම ය මේ.

''ජී.බී. සේනානායක මහතා සිංහල සාහිත්‍යයේ නවීන යුගයේ පතාක යෝධයන්ගෙන් කෙනෙකු ලෙස හැඳින්විය යුතු ය. සාහිත්‍යයට ඔහුගේ කැපවීම එසේ මෙසේ එකක් නොවී ය...ඔහු තරම් ශිල්පීය ක්‍රමවලට මුල් තැන දී ආකෘතිය ගැන පරිශ්‍රමයක් දැරූ අන් සිංහල ලේඛකයෙකු නොවී යයි කිව හැකි ය... ජී.බී. සේනානායක කලාකරුවෙකු පමණක් නොව, බහුශ්‍රැත පඬිවරයෙක් ද වේ. නිර්මාණ කෞශල්‍යය හා බහුශ්‍රැතභාවය එක ප්‍රමාණයට තනි පුද්ගලයෙකු තුළ විද්‍යමාන වන්නේ කලාතුරකිනි...''(12 පිටුව)

02. සමස්තයක් වශයෙන් ගත් කල ජී.බී. සේනානායක නිර්මාණය කළ මුළු සාහිත්‍යය ම 'ලෝකෙට රුව' පමණක් ඇති ජීවන සුවඳ වහනය නොකරන ශූර කලා ශිල්පියෙකුගේ දක්ෂ ව්‍යායාමයක් ලෙස සැලකීම නිවැරදි යයි මම සිතමි. පසු කලෙක ඔහුගේ ඒ ශූර ශිල්ප හරඹය පිරිහීමට පත්වීම යුක්ති යුක්ත වෙයි... පනස්

ගණන්වල මහත් කීර්තියක් ඉසිලූ ජී.බී. සේනානායක මෙවැනි තත්ත්වයකට පත් වූයේ කෙසේ ද? ඔහු විසින් ප්‍රදර්ශනය කරන ලද මේ ඌනතාවට මූලික හේතුව කුමක් ද? මාර්ටින් වික්‍රමසිංහ මේ අරබයා සිය අදහස් නිතර පළ කළ බව මට මතක ය. වික්‍රමසිංහ එය දුටුවේ සේනානායකගේ පෞරුෂත්වයෙහි හෝ මනසෙහි ලක්ෂණයක් ලෙසිනි. සේනානායකට ඇත්තේ සාහිත්‍යකරුවකුට ඇවැසි මනසක් නොවේ ය යන්න වික්‍රමසිංහගේ මතය විය. සේනානායක සතු දළදඬු අනම්‍ය මනස අත්දැකීම් එක්රැස් කර වර්ධනය කිරීමට සුදුසු තෝතැන්නක් නොවේ; ඒවා පිටුදකින ශුෂ්ක පෙදෙසකි. වික්‍රමසිංහයන්ගේ නිගමනය මෙවැන්නක් විය. (232 පිටුව)

මේ ලිපියේ ම අමරසේකර සේනානායක සම්බන්ධ කර තිබෙන අගය කිරීම ය මේ.

''හතළිස් ගණන් හා පනස් ගණන්වල කළ එළි දුටු - සිංහල සාහිත්‍ය උයනෙහි පිපුණු ජී.බී. සේනානායකගේ කෙටිකතා නවක ලේඛකයන් වූ අපගේ සිත් සතන් - දෙනෙත් වසී කළ බව රහසක් නොවේ. ඒවායේ රුවින් අපි විස්මෘත වීමු. එවැනි රුව ඇති මලක් සාහිත්‍ය උයනෙහි එතෙක් නොපිපුණු බවකි අපට එකල හැඟුණේ. 'දුප්පතුන් නැති ලෝකය' සහ 'පළිගැනීම' නමැති කෙටි කතා පොත්වල වූ කතා අප එකල කියවූයේ අනුකරණය කළ යුතු නිර්මාණ වශයෙනි...'' (233 පිටුව)

මා ඉදිරිපත් කළ අදහස් කිහිපයෙන් පෙන්වා සිටින්නට උත්සාහ කළේ නූතන සාහිත්‍යයේ ආරම්භක අවස්ථාවේ සිට විචාරකයා සහ නිර්මාණකරුවා අතර 'යහපත් හා සාධනීය' සම්බන්ධතාවක් නොතිබුණ බව යි. මේ තත්ත්වය ක්‍රමයෙන් වැඩුණ බවට ද නිදසුන් තිබෙනවා. ඒ නරක තත්ත්වය නිසා 'නිර්මාණකරණය' හැම විට ම තාප්පයකින් වටකර රැකගෙන සිටින්නට නිර්මාණකරුවන් රහසින් හෝ පෙලඹුණ බවක් නිරීක්ෂණය කළ හැකි යි.

විචාරය සම්බන්ධයෙන් තත්ත්වය ඊට වඩා නරක තත්ත්වයකට තල්ලු වුණා. එහි එක් ස්වභාවයක් වූයේ සාහිත්‍ය කලා විචාරය ශාස්ත්‍රීය පදනමක් මත වැඩී වර්ධනය නොවීම යි. සාහිත්‍ය කලා විචාරය කවරෙකුට වුව පොදු ක්‍රීඩා පිටියක් වන්නේ මේ නිසයි.

මෙහි වරදට ශාස්ත්‍රාලයීය උගතුන් වශයෙන් අප කවුරුත් වන්දි ගෙවිය යුතුය යන්න මගේ පිළිගැනීම යි.

අද සම්මාන උත්සව කිහිපයක් පැවැත්වෙනවා. ඒවා නොවන්නට සාහිත්‍ය කියවීම ශාස්ත්‍රාලයීය උගතුන් අතින් ද සිදු නොවන බව පැවසීම සාවද්‍ය නැති බව මා කල්පනා කරනවා. ඒ ඒ උත්සව ඔස්සේ විචාර කලාවේ කවර නම් දියුණුවක් ඇති වී ද? නිර්මාණකරණයට කවර නම් ඥානාලෝකයක් උරුම වී ද? යන ප්‍රශ්න අප ඉදිරියේ තිබෙනවා.

ජාතික පුස්තකාල සේවා මණ්ඩලය - ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය නිර්මාණ විනිශ්චය හා ප්‍රමාණ කිරීමට භාවිත කරන මිනුම් දඬු බොහොමයක් ඉතා පසුගාමී යි. ඒවා තැනුවේ කවුරුන් ද? මේ එහි මිනුම් දඬු දෙකක්.

"සංවාද හැර සමස්ත ආඛ්‍යානය ලිඛිත ව්‍යවහාරයෙන් තිබිය යුතු ය." (කටවහරෙන් ලියා ඇති කෘති සුදුසු නැත යන්න.)
"දිවිනසා ගැනීම් - ඝාතන නොතිබිය යුතු ය - පිළිගත් සමාජ සංස්ථාවන්ට කිසිදු බලපෑමක් කර නොතිබිය යුතු ය."

මේ මිනුම් දඬුවලට අනුව, **'මනමේ'** - **'සිංහබාහු'** - **'පෙමතො ජායතී සොකො'** වැනි නාට්‍ය ද නොමනා ය. ලංකාවේ නිර්මාණකරණයට නව ඥානාලෝකයක් ඉදිරිපත් කළ සිරි ගුනසිංහගේ හෙවනැල්ල පවා නොමනා ය. උත්ප්‍රාසය නම් සම්මාන ප්‍රදානෝත්සවවලදී කට වහරෙන් ලියා තිබෙන කෘති සම්මාන හිමි කර ගැනීම යි.

ලංකාවේ සාහිත්‍ය නිර්මාණය හා විචාරය යන උභය කාර්යය ම කාලයක සිට "හුදෙකලා ව, අසරණව, එක ම විදිහකට අයාලේ යන" තත්ත්වයක තිබෙන්නේ ය යන ප්‍රවාදය මා ඉදිරිපත් කරන්නේ මේ යථාර්ථය කලක සිට නිරීක්ෂණය කිරීමෙන් ලත් අවබෝධයෙන් බව අවසානයේ මා පැවසීමට කැමැති යි.

# තාක්ෂණික සැසි පෙළගැස්ම

| පළමු සැසිය (**A**) - භාෂාව හා වාග්විද්‍යාව<br>දිනය: 22. 09. 2022 ස්ථානය: ඇම්. බී. ආරියපාල ශ්‍රවණාගාරය<br>වේලාව: පෙ.ව. 11.00 - ප.ව. 1.30 | | | |
|---|---|---|---|
| **මුලසුන : ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සඳගෝමි කෝපරහේවා** | | | |
| SSS_LGL-077 | Using common knowledge and one's own knowledge as sources of evidentially in Sinhala | Kaushalya Perera | පෙ.ව. 11.05- 11.20 |
| SSS_LGL-049 | සංස්කෘත භාෂාවේ 'ලට්' 'ල' කාර රූප හා සිංහල ලිඛිත භාෂාවේ වර්තමාන ක්‍රියා රූප පිළිබඳ අධ්‍යයනයක් | චින්තක රණසිංහ | පෙ.ව. 11.20- 11.35 |
| SSS_LGL- 056 | The Effect of digital literacy on senior secondary education in Sri Lanka | Kumesh Prabhashini | පෙ.ව. 11.35- 11.50 |
| SSS_LGL-064 | Environmental Factors Affecting the Distribution of the Phonologically Conditioned Nominal Suffixes /w ɑ t/ and /m ɑ t/ in Contemporary Sinhalese | K.K. Ganushka Randula | පෙ.ව. 11.50- 12.05 |
| SSS_LGL-078 | ඉච්ඡානුකතාව වාක්‍ය විචාරාත්මක ලක්ෂණයක් ලෙස; ලේඛන සිංහලය ඇසුරින් කෙරෙන විමර්ශනයක් | චමිල ලියනගේ | ප.ව. 12.05 - 12.20 |
| SSS_LGL-025 | සිංහල වාක්‍ය රීති අධ්‍යයනය සඳහා වාග් විද්‍යාත්මක ප්‍රවේශයක් | රනිල් ප්‍රභාත් සෝමරත්න | ප.ව. 12.20- 12.35 |
| SSS_LGL-061 | සිංහලයේ පද බෙදීම - භාෂා සංහිතා සැලසුම පිළිබඳ අධ්‍යයනයක් | වයි. ඩී. ප්‍රියංකර | ප.ව. 12.35- 12.50 |
| | සාකච්ඡාව | | ප.ව. 12.50-1.30 |

| පළමු සැසිය (B) - සංස්කෘතිය හා කලා ශිල්ප<br>දිනයඃ 22. 09. 2022 ස්ථානයඃ ඇම්. බී. ආරියපාල ශ්‍රවණාගාරය<br>වේලාවඃ පෙ.ව. 11.00 - ප.ව. 1.30 | | | |
|---|---|---|---|
| මූලසුන : මහාචාර්ය පූජ්‍ය අගලකඩ සිරිසුමන හිමි | | | |
| SSS_AC-086 | අලුත් බණ්ඩාර නමින් කිවුලෙගෙදර මොහොට්ටාල ඇදහීමෙන් ප්‍රකාශිත පානම ජනයාගේ උඩරට සම්භවය පිළිබඳ විමර්ශනයක් | අමරසිරි වික්‍රමරත්න | පෙ.ව. 11.05- 11.20 |
| SSS_LGL-022 | පුස්කොළ පොත්වල අන්තර්ගත ලේඛන සහ ශිල්පීය විධික්‍රම පිළිබඳ විමර්ශනයක් (මාතලේ සහ මහනුවර ප්‍රදේශවල තෝරාගත් පුස්කොළ පොත් ඇසුරෙන්) | දීපාංජනී ඇල්ලෙපොළ | පෙ.ව. 11.20- 11.35 |
| SSS_AC-065 | සිංහල ජන සමාජයේ පවතින විවාහ සම්ප්‍රදායන් සම්බන්ධයෙන් වත්මන් නෛතික පිළිගැනීම පිළිබඳ අධ්‍යයනයක් | එස්.ආර්.එල්. රෝසා | පෙ.ව. 11.35- 11.50 |
| SSS_AC-092 | කලාගම ජන වංශය හා සබැඳි කිරිපොහොය ශාන්තිකර්මය පිළිබඳ අධ්‍යයනයක් | පී.ඩබ්.ටී. ඩයන් | පෙ.ව. 11.50- 12.05 |
| SSS_CL-017 | ථෙරි ගාථා පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අධ්‍යයනයක් | නදීකා සඳමාලි පීරිස් | ප.ව. 12.05 - 12.20 |
| SSS_CL-102 | වීදාගම මෛත්‍රෙය මාහිමි ලෝවැඩ සඟරාව යළි සංස්කරණය කිරීම පිළිබඳ ව පර්යේෂණාත්මක අධ්‍යයනයක් | එම්. කේ. සුසන්ත සේනාධිලංකාර | ප.ව. 12.20- 12.35 |
| SSS_AC-103 | සිංහල සමාජයේ විවාහ මංගල පෝරු චාරිත්‍රයන් තුළින් නිරූපණය වන සමාජීය හරයන් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් | එස්.ආර්.ඒ.ආර්.ආර් ලක්මාල් | ප.ව. 12.35 - 12.50 |
| | සාකච්ඡාව | | ප.ව. 12.50-1.30 |

**පළමු සැසිය (C) - සංස්කෘතිය හා කලා ශිල්ප**

දිනය: 22. 09. 2022 මාර්ගගත සැසිය (Online)

වේලාව: පෙ.ව. 11.00 - ප.ව. 1.00

**මුලසුන : ආචාර්ය ප්‍රේමසිරි නාගසිංහ**

| | | | |
|---|---|---|---|
| SSS_AC-02 | පුරාතන ලංකාවේ ඔත්තු සේවය | එච්.එම්. ඉසුරු හේරත් | පෙ.ව. 11.05- 11.20 |
| SSS_AC-099 | සිංහල ජන වහරෙහි බෞද්ධාගමික ආභාසය පිළිබඳ අධ්‍යයනයක් | ඉවන්තා සඳුනි ජයසේන | පෙ.ව. 11.20- 11.35 |
| SSS_AC-029 | සීගිරිය කෞතුකාගාරයේ ප්‍රදර්ශිත තෝරා ගත් පුලුටු මැටි රූ පහක් පිළිබඳ රූප විද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් | මල්ෂා මධුශානි රණසිංහ | පෙ.ව. 11.35- 11.50 |
| SSS_AC-067 | මානසික ආතතිය අවම කරගැනීමෙහි ලා ජන කවියේ උපයෝගීතාව | ආර්. නිරංජන් මදුශංක තෙන්නකෝන් | පෙ.ව. 11.50- 12.05 |
| SSS_AC-080 | ශ්‍රී ලංකාවේ සහ චීනයේ පුර පසළොස්වක දින සැමරුම් පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් | Huang Yuxuan | ප.ව. 12.05- 12.20 |
| | සාකච්ඡාව | | ප.ව. 12.20-12.45 |

| දෙවන සැසිය (**A**) - සම්භාව්‍ය සාහිත්‍යය සහ සාහිත්‍ය විචාරය<br>දිනය: 22. 09. 2022 ස්ථානය: ඇම්. බී. ආරියපාල ශ්‍රවණාගාරය<br>වේලාව: ප.ව. 3.45 - ප.ව. 3.50 | | | |
|---|---|---|---|
| **මුලසුන : ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ආනන්ද තිස්සකුමාර** | | | |
| SSS_CL-063 | සිංහල සාහිත්‍ය විචාරයෙන් පිළිබිඹු වන ධ්වනි සහ ගුණ-රීති සංකල්ප පිළිබඳ විමර්ශනයක් | එච්. ඩබ්. බී. අයි. සම්පත් | ප.ව. 3.50- 4.05 |
| SSS_ML-075 | සාහිත්‍ය ඉතිහාසඥයකු වශයෙන් කේ. එන්. ඕ. ධර්මදාසගේ අනන්‍යතාව | චින්තක රණසිංහ | ප.ව. 4.05- 4.20 |
| SSS_CL-076 | සීගිරි ගීයක් ඇසුරෙන් 'වැටිකොළ මල් සහ සීගිරි ළඳුන්' | සුදේවි රණසිංහ | ප.ව. 4.20- 4.35 |
| SSS_CL- 060 | Symbolic Representation and Character Portrayal of the Elephant (*Hasti*) in Buddhist Art: Literary Investigation with Reference to the *Nālāgiri-damana* Story in the *Butsaraṇa* | Anuda Kanchana | ප.ව. 4.35- 4.50 |
| SSS_ML-054 | ආකෘතිය පිළිබඳ පෙරදිග සංකල්පයට සාපේක්ෂ ව සාහිත්‍ය නිර්මාණයට හා විචාරයට නව පර්යාලෝකයක් එක් කිරීමට අපරදිග ආකෘතිවාදය සමත් වන්නේ ද? යන්න පිළිබඳ විමර්ශනයක් | කේ. කේ. එන්. එන්. කාරියවසම් | ප.ව. 4.50- 5.05 |
| SSS_LGL-041 | බදුල්ල නාගරික කලාපයේ භාෂා භූ දර්ශනය පිළිබඳ අධ්‍යයනයක් | ජේ. එම්. කලණ හසන්ත ජයසුන්දර | ප.ව. 5.05- 5.20 |
| | සාකච්ඡාව | | ප.ව. 5.20-6.00 |

| දෙවන සැසිය (**B**) - නූතන සාහිත්‍ය විචාරය | | | |
|---|---|---|---|
| දිනය: 22. 09. 2022 ස්ථානය: ආර්ථික විද්‍යා අධ්‍යයනාංශ ශ්‍රවණාගාරය | | | |
| වේලාව: ප.ව. 3.45 - ප.ව. 3.50 | | | |
| **මුලසුන : ආචාර්ය ලතා ගුරුසිංහ** | | | |
| SSS_ML- 83 | රත්න ශ්‍රී විජේසිංහගේ කාව්‍ය සම්ප්‍රදානය තුළ සෞන්දර්යාත්මක චින්තනය සමග දේශපාලන දෘෂ්ටිය සංයෝගකරණයේ ස්වාධිකාරකත්වය පිළිබඳ අධ්‍යයනයක් | අමරසිරි වික්‍රමරත්න, නාලක ජයසේන | ප.ව. 3.50- 4.05 |
| SSS_LGL-052 | පස්වන ශ්‍රේණිය සිංහල කියවීම් පොත්වල විෂය අන්තර්ගතය පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක් (1970 සහ 2019 වර්ෂවල ප්‍රකාශිත පෙළ පොත් ඇසුරෙන්) | ප්‍රගීතිකා ජයසේකර ප්‍රදීප් ඉඳුනිල් පියරත්න | ප.ව. 4.05- 4.20 |
| SSS_ML-034 | ශ්‍රී ලාංකේය දේශපාලනික ව්‍යුහ තුළ මාධ්‍යවේදීන්ගේ භූමිකාව පිළිබඳ කතිකාව: **සහෝදරයා** ටෙලිනාට්‍යය ඇසුරෙන් | එච්. ටී. කේ. ඉෂාරා ජයරත්න | ප.ව. 4.20- 4.35 |
| SSS_AC-096 | ලාංකේය නාට්‍ය කලාවේ දෘෂ්ටිවාද නිරූපණය: **සුබ සහ යස** වේදිකා නාට්‍යය ආශ්‍රිත සිද්ධි අධ්‍යයනයක් | එම්.ඒ. දිෂාන් මධුෂන්ක | ප.ව. 4.35- 4.50 |
| SSS_LGL-058 | සිංහල ජාතික පුවත්පත්හි ශීර්ෂපාඨ රචනයේ දී භාවිත භාෂාත්මක ප්‍රයෝග පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් | පී. ටී. කේ. අයි. ධර්මසිරි කේ. ජී. එන්. එම්. විජේරත්න | ප.ව. 4.50- 5.05 |
| SSS_AC-036 | උඩරට නර්තනයේ පා සරඹ අභ්‍යාස කිරීමෙහිලා දණ්ඩිකඳ යොදා ගැනීමේ අවශ්‍යතාව පිළිබඳ අධ්‍යයනයක් | එල්. ඒ. වී. රංගික ජීවන්ත | ප.ව. 5.05- 5.20 |
| | සාකච්ඡාව | | ප.ව. 5.20-6.00 |

| දෙවන සැසිය (C) - සංස්කෘතිය සහ කලා ශිල්ප<br>දිනය: 22. 09. 2022 මාර්ගගත සැසිය (Online)<br>වේලාව: ප.ව. 3.45 - ප.ව. 3.50 | | | |
|---|---|---|---|
| මුලසුන : මහාචාර්ය විමල් හේවාමානගේ | | | |
| SSS_AC-050 | ජය ශ්‍රී මහා බෝධිය හා වත්මන් තේවාකරුවන් පිළිබඳ කෙරෙන සමාජ සංස්කෘතික අධ්‍යයනයක් | වසන්ත කේ. දිසානායක ජී. භවන්ත ප්‍රමෝද් චන්ද්‍රරත්න | ප.ව. 3.50- 4.05 |
| SSS_AC-059 | හොරණ රජමහා විහාරයෙහි ඇති දුර්ලභ ගණයේ සඳකඩපහණක් පිළිබඳ අධ්‍යයනයක් | කරුණාසේන හෙට්ටිආරච්චි දිල්හානි දිල්රුක්ෂිකා | ප.ව. 4.05- 4.20 |
| SSS_AC- 98 | පබ්බතාරාම ආශ්‍රිත ව හඳුනාගත හැකි බෞද්ධ ආරාම සංවිධානයේ සංවිධිත බව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් | යූ. ඩී. ආර්. ෂෙහාන් තිලකරත්න | ප.ව. 4.20- 4.35 |
| SSS_AC-031 | දේශීය බුද්ධ ප්‍රතිමා කලාව පිළිබඳ ශාරිපුත්‍රයෙහි එන උපදේශ පිළිබඳ අධ්‍යයනයක් | ඉවන්තා සඳුනි ජයසේන | ප.ව. 4.35- 4.50 |
| SSS_CL-101 | ජාතක අටුවාවේ අන්තර්ගත කථා නාම සිංහලයට නැගීමේ දී දක්වූ සුවිශේෂතා පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් | එම්. කේ. සුසන්ත සේනාධිලංකාර | ප.ව. 4.50- 5.05 |
| | සාකච්ඡාව | | පෙ.ව. 5.05-5.45 |


| තෙවන සැසිය (A) භාෂාව සහ වාග්විද්‍යාව<br>දිනය: 23. 09. 2022 මාර්ගගත සැසිය (Online)<br>වේලාව: පෙ.ව. 9.00 - පෙ.ව. 11.00 | | | |
|---|---|---|---|
| **මුලසුන : ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සඳගෝමි කෝපරහේවා** | | | |
| SSS_AC-047 | අනුරාධපුර පන්කුලිය විහාරයේ පාදෙණියක සටහන් ව ඇති සෙල්ලිපියක් පිළිබඳ අධ්‍යයනයක් | කරුණාසේන හෙට්ටිආරච්චි | පෙ.ව. 9.05- 9.20 |
| SSS_LGL-046 | Relationship between Language and Gender Based Violence with special reference to Sri Lanka | Kumari Thoradeniya | පෙ.ව. 9.20- 9.35 |
| SSS_LGL-053 | තහංචි ව්‍යවහාර වාරණය පිළිබඳ සමාජ වාග්විද්‍යාත්මක අධ්‍යයනයක් වරකාගොඩ ග්‍රාම නිලධාරී වසම ආශ්‍රයෙන්) | ඩබ්. ඩී. එන්. ඩී. විතානගේ | පෙ.ව. 9.35- 9.50 |
| SSS_ML-085 | සිංහල හා දෙමළ භාෂාවල ආදේශක නාම භාවිතය | භාග්‍යා දිල්හානි මාබුලගේ | පෙ.ව. 9.50- 10.05 |
| SSS_ML-018 | Morphological and Periphrastic Expressions of Tense and Aspect in Sinhala Language | Thamalu Maliththa Piyadigama | පෙ.ව. 10.05- 10.20 |
| | සාකච්ඡාව | | ප.ව. 10.20-10.50 |

| තෙවන සැසිය (B) - සම්භාව්‍ය සාහිත්‍යය සහ කලාශිල්ප<br>දිනයඃ 23. 09. 2022 මාර්ගගත සැසිය (Online)<br>වේලාවඃ පෙ.ව. 11.00 - ප.ව. 12.30 | | | |
|---|---|---|---|
| **මුලසුනඃ සම්මානිත මහාචාර්ය රෝහිණී පරණවිතාන** | | | |
| SSS_AC-093 | සම්ප්‍රදායික ලාක්ෂා කර්මාන්තය සහ ඉන් පිළිබිඹු වන සමාජ ස්තරායනය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් (මහනුවර යුගයේ පාරම්පරික ලාක්ෂා කර්මාන්තය ඇසුරෙන්) | ඩබ්. එම්. සී. ඩී. වනසිංහ | පෙ.ව. 9.05- 9.20 |
| SSS_CL-068 | උපමාලංකාර පොදු ජන අත්දැකීම් කෙරෙහි දක්වන සංවේදීතාව පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් : සද්ධර්මාලංකාරය සහ මයූර සන්දේශය ඇසුරෙන් | පසන් පාදුක්කගේ | පෙ.ව. 9.20- 9.35 |
| SSS_LGL-070 | ඓතිහාසික පඬිවිට ඉසිඹුහලේ කලාත්මක හා වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳ ව විමර්ශනයක් | සුහසිංහ ආරච්චිගේ ප්‍රසන්න | පෙ.ව. 9.35- 9.50 |
| SSS_CL- 089 | කෝට්ටේ පද්‍ය සාහිත්‍යයෙන් හෙළි කෙරෙන විශ්වාස හා ඇදහිලි පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් | එම්. ජේ. නදීශා සඳමාලී | පෙ.ව. 9.50- 10.05 |
| SSS_AC-066 | අභිචාරාත්මක ප්‍රතිකාර ක්‍රම සහ සංකේතිය ප්‍රාග්ධනයඃ මොරවක් කෝරළය ආශ්‍රයෙන් කෙරෙන සංස්කෘතික අධ්‍යයනයක් | ශයිනි කරුණාරත්න | පෙ.ව. 10.05- 10.20 |
| | සාකච්ඡාව | | පෙ.ව. 10.20-10.50 |

| සිවුවන සැසිය (A) - සාහිත්‍යය සහ සාහිත්‍ය විචාරය<br>දිනය: 23. 09. 2022 මාර්ගගත සැසිය (Online)<br>වේලාව: පෙ.ව. 11.00 - ප.ව. 12.30 | | | |
|---|---|---|---|
| **මුලසුන : මහාචාර්ය සරත් විජේසූරිය** | | | |
| SSS_ML-073 | වීරපොකුණේ උපරතන හිමියන්ගේ 'මං' නවකතාවේ අන්තර්ගත අතුරු කතා පිළිබඳ අධ්‍යයනයක් | මනෝජා නවෝදනී ඒකනායක | පෙ.ව. 11.05- 11.20 |
| SSS_ML-074 | වර්තමාන සිංහල නවකතාවෙන් නිරූපණය වන සංක්‍රාන්තික ලිංගික සමාජභාවී පරපීඩනය පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක්. (තෝරාගත් නවකතා ඇසුරෙන්) | එච්. එම්. බී. එල්. කේ. හේරත් | පෙ.ව. 11.20- 11.35 |
| SSS_ML-71 | සාහිත්‍ය නිර්මාණයක අන්තර්ගතයේ පමණක් නොව අකෘතියේ ද අර්ථ ගැබ්වී පවතින ආකාරය පිළිබඳ අධ්‍යයනයක් (තෝරාගත් නූතන පද්‍ය සාහිත්‍ය කෘති කිහිපයක් ඇසුරින්) | එස්. එම්. එන්. එස්. විමලසේන | පෙ.ව. 11.35- 11.50 |
| SSS_ML-94 | පුරුෂ මූලික සමාජ සංස්ථාව තුළ පීඩනයට පත් වන පවුල් සංස්කෘතිය පිළිබඳ නූතන ස්ත්‍රීවාදී කියැවීමක් : රුවන් බන්දුජීවගේ කුණ්ඩලකේශී කාව්‍ය ආශ්‍රයෙන් | එම්. එම්. සී. ඩී. වනසිංහ | පෙ.ව. 11.50 - ප.ව. 12.05 |
| | සාකච්ඡාව | | ප.ව. 12.05-12.30 |

| සිවුවන සැසිය (**B**) - භාෂාව හා වාග්විද්‍යාව<br>දිනය: 23. 09. 2022 මාර්ගගත සැසිය (Online)<br>වේලාව: පෙ.ව. 11.00 - ප.ව. 12.50 | | | |
|---|---|---|---|
| **මුලසුන : ආචාර්ය ධම්මික ජයසිංහ** | | | |
| SSS_AC- 100 | Factors affecting the vocational interest of the G.C.E. Advanced Level students | E. Randeniya W. M. C. S. Wijesinghe | පෙ.ව. 11.05- 11.20 |
| SSS_LGL-107 | සංස්කෘතික බැඳීම් ගොඩ නැගීමේදී භාෂාවේ කාර්යභාරය | එස්.එච්. ඊර්වින් | පෙ.ව. 11.20- 11.35 |
| SSS_LGL-037 | සිංහල භාෂාවේ ක්‍රියාපදය පිළිබඳ ව නූතන ව්‍යාකරණඥයන්ගේ විග්‍රහය පිළිබඳ ව තුලනාත්මක අධ්‍යයනයක් (තෝරා ගත් ව්‍යාකරණ ග්‍රන්ථ කිහිපයක් ඇසුරින්) | චානිකා පියුමාලි දොඹගොල්ල | පෙ.ව. 11.35- 11.50 |
| SSS_LGL-106 | සිංහල හා හින්දි භාෂණයේ භාවිත ස්ථානවාචී ආදේශක වචන පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් | දිමුතු දිලුම් ධනංජය විතානගේ | පෙ.ව. 11.50- ප.ව. 12.05 |
| SSS_LGL-019 | සිංහල මාධ්‍ය ශාස්ත්‍රීය ලේඛන විද්‍යුත් ප්‍රකාශනයෙහි ගැටලු හා ප්‍රමිතිකරණයෙහි අවශ්‍යතාව | තමලු මලිත්ත පියදිගම | ප.ව. 12.05- 12.20 |
| | සාකච්ඡාව | | ප.ව. 12.20 - 1.00 |

# සමෝධාන සැසිය



## සම්මානිත මහාචාර්ය ජේ. බී. දිසානායකයන්ගේ ශාස්ත්‍රීය මෙහෙවර ඇගයීම

---

## සම්පත් දායකත්වය



**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය**
**අනුර මනතුංග**



**රාජ්‍ය සම්මානලාභී ලේඛිකා**
**තනූජා එන්. අයගම**



**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**
**ක්‍රිෂාන්ත ෆෙඩ්රික්ස්**

- මෙවර වාර්ෂික පර්යේෂණ සැසියෙහි සමෝධාන සැසිය සැප්තැම්බර් මස 22 දින ප.ව. 1.30 සිට 3.30 දක්වා ඇම්.බී. ආරියපාල ශ්‍රවණාගාරයේ දී පැවැත්වේ. සම්මානිත මහාචාර්ය ජේ.බී. දිසානායකයන් විසින් දශක හයකට අධික කාලයක් ලාංකේය භාෂා සාහිත්‍ය හා සංස්කෘතික අධ්‍යයන විෂයෙහි දක්වන ලද අද්විතීය දායකත්වය මෙම සැසියේ දී ඇගයෙනු ඇත.
- සම්මානිත මහාචාර්ය ජේ.බී. දිසානායකයන් සිංහල භාෂාව, ව්‍යාකරණය හා වාග්විද්‍යාව විෂයෙහි දක්වන දායකත්වය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ක්‍රිෂාන්ත ෆෙඩ්රික්ස් ද, ළමා සාහිත්‍යය විෂයෙහි ජේ.බී. දිසානායකයන්ගේ දායකත්වය පිළිබඳ රාජ්‍ය සම්මානලාභී ලේඛිකා තනූජා එන්. අයගම ද අදහස් දැක්වීමට නියමිත ය. පුරාවිද්‍යා කොමසාරිස් ජනරාල් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අනුර මනතුංග මහතා විසින් ඇගයෙන්නේ සම්මානිත මහාචාර්ය ජේ.බී. දිසානායකයන් සිංහල සංස්කෘතිය හා කලා ශිල්ප විෂයෙහි ඥාන සම්පාදනයෙහිලා ස්වකීය ලේඛනවලින් දැක්වූ දායකත්වය යි.
- මෙම සැසියෙහි මුලසුන සිංහල අංශ ප්‍රධාන ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සඳගෝමි කෝපරහේවා විසින් දරනු ලැබේ.

# සාරසංක්ෂේප

# Using common knowledge and one's own knowledge as sources of evidentiality in Sinhala political speech

Dr. Kaushalya Perera[1]

**Abstract**

All languages have structural features that present evidentiality, i.e., features that present the sources of knowledge supporting what we say. However, languages differ in the types of sources that are used, and in the linguistic features that are used to present such evidentiality and any genre-specific variations. Little is known of the types of sources that are used for Sinhala evidentiality or the linguistic features used for it. While scholars of Sinhala have discussed some features that are relevant for evidentiality in scholarship on syntax or in descriptions of the language (Ananda, 2011, 2018; Chandralal, 2010) little is known of Sinhala evidentiality per se. The main objective of this paper is to present three types of sources that are used for evidentiality in Sinhala, especially in political speech. These sources are common knowledge, one's own memory and one's own knowledge. These are also aspects less discussed as evidential sources in other languages (Aikhenvald, 2018). When presenting the three sources of evidentiality, the paper also presents the linguistic features of Sinhala used in such evidentiality. The study uses approximately 7 hours of interviews (personal and political) and political debates aired on national television as data. The videos were transcribed and coded for evidential sources, verbal morphology and lexical resources. The analysis shows that the linguistic features used more frequently for the presentation of the three sources discussed in this paper are the basic non-past forms of specific verbs (e.g. know), the inclusion of a quotative, and the use of agreement and assertion markers. Additionally, Sinhala uses noun phrases for evidentiality, which is an unusual characteristic. Finally, the study finds that the evidentiality sources of the speaker's memory and knowledge uses somewhat different linguistic structures to the structures presenting common knowledge.

**Keywords:** *Evidentiality, Political speech, Sinhala, Evidential markers*

---

1. Senior Lecturer, Department of English, University of Colombo.
kaushalya@english.cmb.ac.lk

# Relationship between Language and Gender Based Violence with special reference to Sri Lanka

Dr. Kumari Thoradeniya[1]

**Abstract**

Patriarchal cultural attitudes, poverty, religious belief, alcoholism, changing gender roles etc. are considered as the reasons for gender based violence in many societies across the globe and less attention has been paid to recognize the pivotal role that language plays for the issue. Language is used to communicate human's feelings, thoughts, activities, stress, life stories, etc. and consequently it has immense power for changing the world. For instance, language and its conduct are one of the most powerful tools that construct, define and constitute dynamic meanings of masculinity and femininity relationships in a society though few studies have focused on this relationship. Therefore, the aim of this paper is to explore the relationship between Sinhala language and gender based violence in Sri Lanka. Accordingly, two research questions were addressed by the study as how Sinhalese language explains gender based violence and whether the language used in order to define and explain relationship between men and women contribute to escalate gender based violence among the Sinhalese communities. Mainly secondary resources used for the study and accordingly, gender based violence incidents reported by three Sinhala newspapers during the last six months of the year 2021 reviewed and examined how they used language to report the cases. When reviewing the cases that have been reported, it could be observed that mostly the attention has focused on victims and though it is quite natural, this can lead to moving the focus away from the perpetrators. At the same time, the language styles and wording that it uses mostly reflects the patriarchal cultural attitudes which discourage women to come forward and openly explain their violence experience. This study concludes that even though languages are changing due to the technical revolution and experience of globalization, positive changes are not happening in Sinhalese language to reduce the inequality of gender relationship and the decrease of GBV. Radical changes of the education system are needed to establish to encourage gender equality and gender rights within the language and those changes might help to change the mind-set of the society since language is the main force for people to change their mind-set.

**Key Words:** *language, gender based violence, Sinhalese language, Sri Lanka*

1. Senior Lecturer, Department of Sociology, University of Peradeniya
kumari.thoradeniya@arts.pdn.ac.lk

# සංස්කෘත 'ලට්' ල කාර රූප හා සිංහල ලිඛිත භාෂාවේ වර්තමාන ක්‍රියා රූප පිළිබඳ අධ්‍යයනයක්

චින්තක රණසිංහ[1]

**සාරසංක්ෂේපය**

මෙම පර්යේෂණයෙන් සංස්කෘත ක්‍රියාපදය සහ සිංහල ක්‍රියාපදය අතර පවතින රූපමය සම්බන්ධය අධ්‍යයනය කරනු ලැබේ. පර්යේෂණ ගැටලුව වශයෙන් "සංස්කෘත ක්‍රියා පදයේ වර්තමාන ක්‍රියා රූප හා සිංහල ලිඛිත ව්‍යවහාරයෙහි වර්තමාන ක්‍රියා රූප අතර පවතින රූපමය සම්බන්ධය කුමක්ද' යන ගැටලුව කෙරෙහි අවධානය යොමු කෙරේ. ඒ අනුව සංස්කෘත ක්‍රියා පදයේ වර්තමාන රූපය හා සිංහල ක්‍රියා පදයේ ලිඛිත ව්‍යවහාරයේ වර්තමාන රූපය පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක් සිදු කෙරිණි. මෙම රූපමය සබඳතාව තුළ පවතින අර්ථමය සබඳතාවක් තිබේද? නැතහොත් එය හුදෙක් රූපමය සබඳතාවකට ලඝු වන්නේද යන පර්යේෂණ අනු ප්‍රශ්නවලට පිළිතුරු සෙවීමට අපේක්ෂිතය. පර්යේෂණය සඳහා සංස්කෘත හා සිංහල ක්‍රියාරූප 50-70 අතර නියැදියක් තෝරා ගත් අතර ක්‍රියා රූප තෝරා ගැනීමේදී වර්තමාන ක්‍රියා රූපයේ ඒක වචන හා බහු වචන යන රූප දෙකම උපයෝගී කොට ගැණිනි. සංස්කෘත ක්‍රියා රූප තෝරා ගැනීමේදී වර්තමාන කාල 'ලට්' ල කාරයට අයත් ක්‍රියා රූප උපයෝගී කර ගත් අතර, එහිදී එම ක්‍රියාරූපවල ඒකවචන හා බහුවචන රූප දෙකම සලකා බැලිණ. මෙම පර්යේෂණය සඳහා සංස්කෘත ක්‍රියා රූප ලබා ගැනීමේදී සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය දෙකින්ම සංස්කෘත භාෂාව ඉගෙනීම සඳහා ලියූ මූලික පෙළ පොත් කිහිපයක් උපයෝගි කොට ගැණිනි. ඒවා නම් සංස්කෘත පාඨාවලී -ප්‍රථම පුස්තකය (හැගොඩ ධම්මින්ද හිමි,1946), සංස්කෘත ව්‍යාකරණ ශික්ෂා (කඳානේගෙදර පඤ්ඤානන්ද හිමි), සංස්කෘත නාමාඛ්‍යාතපද මාලිකා (බළන්ගොඩ ආනන්ද මෛත්‍රය හිමි,1997), සංස්කෘත භාෂාව - මූලික පිරිවෙණ පොත් 1,2,3,4 සහ 5 (අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව), Learn Sanskrit in 30 Days (K. Srinivasachari 2002) යන කෘති මූලාශ්‍රය කර ගන්නා ලදී. සිංහල හා සංස්කෘත යන භාෂා ද්විත්වය ඓතිහාසික වාග්විද්‍යාත්මක ප්‍රවේශයකින් විමර්ශනය කර බලන විට 'ඉන්දු ආර්ය' නම් භාෂා පවුලට අයත් භාෂා දෙකකි. මෙම භාෂා දෙක අතර පවතින සම්බන්ධය පිළිබඳ විවිධ න්‍යායාත්මක ප්‍රවේශවලින් විශාල අධ්‍යයන ගණනාවක් සිදු කර තිබුණද අපගේ මෙම අධ්‍යයනය වාග්විද්‍යාව මෙන්ම සාම්ප්‍රදායික ව්‍යාකරණය යන විෂයයන් දෙක කෙරෙහිම අවධානය යොමු කරමින් සිදු කරන ලද්දකි.

**මුඛ්‍ය පදඃ** සිංහල ලිඛිත ක්‍රියාපදය වර්තමාන රූපය, සංස්කෘත ක්‍රියාපදයේ ලට් ල කාරය, රූපමය සබඳතා, අර්ථමය සබඳතා, ව්‍යාකරණය සහ වාග්විද්‍යාව

---

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
chinthakaranasinha@gmail.com

# The impact of Digital Textbooks on Digital Literacy in Secondary Education in Sri Lanka

Kumesh Prabhashini[1]

**Abstract**

Senior secondary education counted GCE O/L and GCE A/L grades in Sri Lanka. The country started implementing digital technology in the late 1980s. The concept of a Digital textbook is beneficial in terms of replacing a heavy school- bag, carrying on the learning process after school, and enhancing distance and self-learning. E-textbooks were introduced into the Sri Lankan school system in 2009 as a move toward updating and enhancing the school curriculum. The transition of literature from text to hypertext can be identified as digital literature. E-books are the current format for books and they produce Electronic literature in Audiobooks and PDF format. This research was exploring the impact of Digital Textbooks on Digital literacy in Secondary Education in Sri Lanka. This study used a survey method and 325 senior secondary students in Western Province and used it as a sample of this survey. SPSS software was used for analysing the data and finally came to the conclusion. Due to technological limitations, a preference for reading only printed books, Internet vulnerabilities, and an inability to read screens, digital textbooks are not widely used. It is clear from this sample that digital textbooks have a lack of impact on students' perceptions of digital literacy in Secondary Education in Sri Lanka.

**Keywords**: *Digital Literacy, Digital Textbooks, Senior Secondary Education, Sri Lankan Education, School Curriculum*

---

1. PhD candidate, School of Information Management, Wuhan University, P.R. China
k.prabhashini@gmail.com

# සිංහල ජාතික පුවත්පත්හි ශීර්ෂපාඨ රචනයේදී භාවිත භාෂාත්මක ප්‍රයෝග පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

පී. ටී. කේ. අයි. ධර්මසිරි[1]
කේ. ජී. එන්. එම්. විජේරත්න[2]

**සාරසංක්ෂේපය**

සිංහල ජාතික පුවත්පත්හි ශීර්ෂපාඨ රචනයේදී භාවිත භාෂාත්මක ප්‍රයෝග පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. පර්යේෂණ ගැටලුව වූයේ සිංහල ජාතික පුවත්පත්හි ශීර්ෂපාඨ රචනයේදී භාවිත භාෂාත්මක ප්‍රයෝගයන්හි ශක්‍යතාව කෙබඳු ද? යන්නයි. සංහතික මාධ්‍ය ක්‍රියාවලිය තුළ පුවත්පත් මාධ්‍ය සුවිශේෂී වේ. එහිදී පුවත්පත යනු ලිඛිත භාෂාව පදනම් වූ මාධ්‍ය ස්වරූපයක් වන අතර ඒ තුළ විවිධ පඨිත ආකාර අන්තර්ගත වේ. විශේෂයෙන් පුවත්පත තුළ අන්තර්ගත පඨිත ආකාරයක් ලෙස ශීර්ෂපාඨ වැදගත් වේ. සිංහල පුවත්පත් සැලකීමේදී ශීර්ෂපාඨ රචනය සුවිශේෂී වේ. එයට හේතුව වන්නේ ශීර්ෂපාඨ රචනයේදී විවිධ භාෂාත්මක ප්‍රයෝග භාවිත කිරීමයි. එමෙන්ම එම භාෂා ප්‍රයෝග කාලානුරූපීව විවිධතා අත්පත් කර ගනිමින් විකාශය වන ආකාරය හඳුනාගත හැකිය. කෙසේ වෙතත් සමකාලීන සිංහල පුවත්පත් ශීර්ෂපාඨ විමසීමේදී ඒවායේ භාෂාමය ප්‍රයෝග උචිත පරිදි භාවිත කර ඇති බැව් පෙනී යයි. එහිදී ශීර්ෂපාඨයන්හි භාෂාමය වශයෙන් පවතින ශක්‍යතාව, ග්‍රාහකයා විෂයෙහි ඇති කරන බලපෑම හා ආකෘතිය සහ අන්තර්ගතය කෙරෙහි බලපාන්නේ කෙසේද වැනි කරුණු පිළිබඳ අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ. එසේම මෙම පර්යේෂණය සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක ක්‍රමවේද ඇතුළත් මිශ්‍ර ක්‍රමවේදයක් භාවිත කරන ලදී. ප්‍රශ්නාවලී ක්‍රමය, සම්මුඛ සාකච්ඡා, අන්තර්ගත විශ්ලේෂණය සහ නිරීක්ෂණය යන ක්‍රමවේද දත්ත රැස් කිරීම සඳහා භාවිත කෙරුණි. එහිදී රැස් කරන ලද දත්ත, විශ්ලේෂණය කිරීම මගින් උපන්‍යාසය වූ 'සිංහල ජාතික පුවත්පත්හි ශීර්ෂපාඨ රචනයේදී විවිධ භාෂාත්මක ප්‍රයෝග භාවිත කරයි' යන්න ප්‍රත්‍යක්ෂ විය. එමෙන්ම පර්යේෂණයේ යෝජනා ඉදිරිපත් කිරීමේදී ශීර්ෂපාඨයන්හි භාවිත භාෂාත්මක ප්‍රයෝග තව දුරටත් සාධනීයව යොදා ගැනීමටත්, ශීර්ෂපාඨයන්හි පවතින භාෂාමය අඩුලුහුඬුතා මඟහරවා ගැනීමටත් අවධානය යොමු විය. එනම් ශීර්ෂපාඨයන්හි භාෂාමය වශයෙන් හා සංවර්ධනය විය යුතු වෙනත් පැතිකඩ පිළිබඳව මෙහිදී මූලික යෝජනා ඉදිරිපත් කරනු ලැබීය.

**මුඛ්‍ය පදඃ** භාෂාව, භාෂාත්මක ප්‍රයෝග, පුවත්පත් ශීර්ෂපාඨ, මුද්‍රිත මාධ්‍ය භාෂාව, භාෂාවේ සංඥාර්ථවේදී පැතිකඩ

---

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රීපාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය
kalani@spc.cmb.ac.lk

2. පශ්චාද් උපාධි අපේක්ෂක, ශ්‍රීපාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය
nadeewijerathna1995@gmail.com

**Environmental Factors Affecting the Distribution of the Phonologically Conditioned Nominal Suffixes /wɑt/ and /mɑt/ in Contemporary Sinhalese**

K. K. Ganushka Randula[1]

**Abstract**

The nominal suffixes /wɑt/ and /mɑt/, which form possessive nominals in Contemporary Sinhalese, are direct borrowings from Sanskrit. According to all Sanskrit grammars and subsequent Sinhalese grammars, these are two phonologically conditioned allomorphs in complementary distribution. It is, therefore, prescribed to add the suffix /wɑt/ to stems ending in the vowels [u], [uː], [i], [iː] and /mɑt/ everywhere else. However, this prescriptive rule of distribution is not strictly followed in everyday speech. As in /ɑːloːkəmɑt/, /prəboːdʰəmɑt/, /sɑubʰɑːgjəmɑt/, and /ɑːdɑrʃəmɑt/ etc., native speakers frequently substitute /mɑt/ for /wɑt/. This study aims to investigate whether there is a plausible phonetic cause underlying the violation of this rule of distribution. This is, actually, a topic hitherto overlooked by researchers who have recorded such violations as mere common errors. Given that /wɑt/ and /mɑt/ are phonologically conditioned allomorphs, the present researcher hypothesised that the cause behind the violation of this rule could also be phonological. This hypothesis was tested using a manually annotated corpus containing nominals with incorrectly used /mɑt/ suffix from both spoken and written texts. The phonetically transcribed nominals were analysed with a focus on the immediate and distant environments of the incorrectly used /mɑt/ suffix. This analysis revealed that the distant environments of all incorrect /mɑt/ suffixes were heavy syllables. These heavy syllables contained either long vowels [ɑː], [oː], [ɑi], or a short vowel followed by a coda consonant. Therefore, the heavy syllable in the distant environment seemed to be the phonological factor altering the distribution of the suffixes /wɑt/ and /mɑt/ in such cases. However, this superficial similarity in the distant environment could not be regarded as the determinant factor altering the distribution as clear exceptions with the correctly used suffix as in /prəmɑːɳəvɑt/, /warɳəvɑ t/, and /artəvɑt/ etc. occur in similar environments. Hence, in investigating the causes behind the altered distribution of the/wɑt/ and /mɑt/suffixes in

1. Lecturer (Prob.), Department of English Language Teaching, University of Colombo. k.k.g.randula@gmail.com

Contemporary Sinhalese, the present researcher recommends conducting an exhaustive analysis of their phonetic environments.

**Keywords:** *distribution, heavy syllable, phonetic environment, phonologically conditioned*

# සංස්කෘතික බැඳීම් ගොඩ නැඟීමේදී භාෂාවේ කාර්යභාරය

එස්.එච්.සදීකා ෆර්වින්[1]

**සාරසංක්ෂේපය**

මිනිසුන් අතර සමීප සබඳතා වර්ධනය කිරීමේදී භාෂාව යනු අත්‍යවශ්‍ය සාධකයකි. මිනිසුන් අදහස්, සිතිවිලි සහ තමාගේ වැදගත් සිදුවීම් පිළිබඳ විස්තර ආදිය වෙනත් පුද්ගලයෙකු සමඟ බෙදාගැනීම සඳහා භාෂාව යොදා ගනී. එමඟින් ඇති කරගන්නා වූ හඳුනා ගැනීම සහ වටහා ගැනීම මත ගැඹුරු බැඳීම් නිර්මාණය කෙරේ. එපමණක් නොව භාෂාවේ රටා සහ අර්ථය, විවිධ සමාජ සංවිධාන සහ සංස්කෘතික භාවිතයන් කෙරෙහිද බලපායි. කෙසේ නමුත් මෙම අන්තර් සම්බන්ධතා පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීම සඳහා තවමත් පර්යේෂකයන් භාෂාව සහ සංස්කෘතිය සංවර්ධන සංරචක ලෙස ප්‍රමාණවත් ලෙස ආමන්ත්‍රණය කර නොමැත. මෙම අධ්‍යයනය මඟින් සංස්කෘතික බැඳීම් ගොඩ නගා ගැනීමේදී භාෂාවේ කාර්ය භාරය කෙබඳු වේද යන්න විශ්ලේෂණය කෙරෙන අතර මෙම අධ්‍යයනය ගුණාත්මක ප්‍රවේශයක් අරමුණු කරගන්නා ලදී. අම්පාර දිස්ත්‍රික්කයට අයත් කල්මුණේ ප්‍රදේශයේ ඉස්ලාම් සහ සිංහල සමාජ පාදක කර ගනිමින් සංස්කෘතික විශ්ලේෂණයක් සිදු කිරීම මෙහි පර්යේෂණ අරමුණයි. දත්ත රැස් කිරීමේදී ප්‍රාථමික මෙන්ම ද්විතීයික දත්ත භාවිත කළ අතර විවිධ සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ තුළින් ප්‍රාථමික දත්ත රැස්කරගන්නා ලදී. ද්විතීයික දත්ත ලෙස විවිධ පර්යේෂණ ප්‍රකාශන, පූර්ව අධ්‍යයන, පොත්පත් සහ සඟරා ආදිය පරිශීලනය කෙරිණි. මේ අනුව මෙම අධ්‍යයනය තුළින් ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ භාෂාමය තත්ත්වය සහ ප්‍රජාව තුළ සමාජ ව්‍යුහය පවත්වාගෙන යාමෙහිලා එහි අවිවාදිත භූමිකාව හඳුනා ගැනීමකට ලක් කරනු ලබයි. සමාජ සන්දර්භයන් හරහා "සංස්කෘතිය" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න නිර්වචනය කිරීම ඉතා සංකීර්ණ වන අතර සංස්කෘතික බැඳීම් ගොඩ නැඟීමේලා භාෂාවේ කාර්යභාරය විවිධ සංස්කෘතීන් අනුව වෙනස් විය හැකිය. එබැවින් අධ්‍යයන සොයා ගැනීම් සාමාන්‍යකරණය කළ නොහැකි වීම අධ්‍යයනයේ මූලික සීමාවක් වශයෙන් හඳුනා ගත හැකිය.

**මුඛ්‍ය පදඃ** භාෂාව, සංස්කෘතිය, ඉස්ලාම්, සිංහල, ජන සමාජය,

---

1. කථිකාචාර්ය,භාෂා දෙපාර්තමේන්තුව,කලා හා සංස්කෘතික පීඨය,ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය
sadeekahameed@gmail.com

# පස්වන ශ්‍රේණිය සිංහල කියවීම් පොත්වල විෂය අන්තර්ගතය පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක්

## (1970 සහ 2019 වර්ෂවල ප්‍රකාශිත පෙළ පොත් ඇසුරෙන් )

ප්‍රගීතිකා ජයසේකර[1]

ප්‍රදීප් ඉඳුනිල් පියරත්න[2]

**සාරසංක්ෂේපය**

පාසල් පෙළපොත් යනු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි ලා උපයෝගී වන සුවිශේෂ ඉගෙනුම් ආධාරකයකි. දීර්ඝ කාලයක් තිස්සේ පාසල් අධ්‍යාපනයේ දී භාවිත වන මෙම පෙළපොත් වර්තමානයේ ද එකලෙස ම භාවිත වේ. එහි දී ප්‍රාථමික ශ්‍රේණිවල සිසු දරුවන් වෙනුවෙන් සම්පාදිත සිංහල කියවීම් පොත් ඇසුරෙන් ළමුන්ගේ ශ්‍රවණ කුසලතා, කථන කුසලතා, කියවීමේ කුසලතා, ලේඛන කුසලතා වර්ධනය කරලීමට දායකත්වයක් සැපයේ. එමෙන් ම නිර්මාණාත්මක පරිකල්පනාත්මක කුසලතා වර්ධනය කොටගත් විශ්වීය පුරවැසියෙකු බිහිකරලීමට ආධාර වීම ද මෙම පෙළ පොත් රචනා කිරීමේ අරමුණු අතර වෙයි. 1970 සහ 2019 වර්ෂවල පළමුවරට ප්‍රකාශිත පස්වන ශ්‍රේණිය සිංහල කියවීම් පොත් ද්විත්වය ඇසුරෙන් ඒවායේ විෂය අන්තර්ගතය පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක් සිදු කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. මෙහි දී ප්‍රධාන වශයෙන් ම ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ පුස්තකාල පරිශීලනයෙන් දත්ත රැස් කර ගන්නා ලදී. ප්‍රාථමික මූලාශ්‍රය ලෙස අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මඟින් 1970 සහ 2019 වර්ෂවල පළමුවරට ප්‍රකාශිත සිංහල භාෂාව විෂයට අදාළ පෙළ පොත් මෙන් ම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ ද අධ්‍යාපන න්‍යාය හා ඉගෙනුම් - ඉගැන්වීම් කාර්යයට අදාළ අතිරේක තොරතුරු විමර්ශනය සඳහා ද්විතීයක මූලාශ්‍රය ද පරිශීලනය කෙරිණි. එසේ ම මෙම පෙළ පොත් පරිශීලනය කළ ශිෂ්‍යයන් හා පෙළ පොත් සම්පාදන කාර්යය සඳහා සම්පත් දායකත්වය සැපයූ පිරිස් සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡා ද මෙම පර්යේෂණය සඳහා උපයෝගී කර ගැනිණි. ප්‍රස්තුත මාතෘකාවට අදාළ පර්යේෂණයේ දී මෙම පෙළ පොත් ද්විත්වයෙහි ම විෂය සන්ධාරය විශ්ලේෂණයට ලක් කෙරිණි. එහි දී එම පෙළ පොත්වල රචනා ශෛලියෙහි' විශේෂතා, පාඩම් සඳහා උපයුක්ත තේමාවල විවිධත්වය, උපයුක්ත උද්ධෘතවල විවිධත්වය, අභ්‍යාස හා ක්‍රියාකාරකම් භාවිතය, අන්තර්ගත සිතුවම්වල නිර්මාණශීලීත්වය ආදිය පිළිබඳ පෙළ පොත් ද්විත්වය ඇසුරෙන් ම සංසන්දනාත්මක ව විමර්ශනය කර ඒවායේ සුවිශේෂතා හඳුනා ගැනීමට හැකි විය.

**මුඛ්‍ය පද :** සිංහල භාෂාව, පෙළ පොත්, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය, පස්වන ශ්‍රේණි

1. නියෝජ්‍ය අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
prageethikaepd@gmail.com

2. සහකාර අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
piyarathnaindunil@gmail.com

# ඉච්ඡානුකතාව වාක්‍ය විචාරාත්මක ලක්ෂණයක් ලෙසඃ ලේඛන සිංහලය ඇසුරින් කෙරෙන විමර්ශනයක්

චමිල ලියනගේ[1]


**සාරසංක්ෂේපය**

කිසියම් භාෂාවක වාක්‍ය විග්‍රහ කිරීමේ දී අදාළ භාෂාවෙහි වාක්‍ය සංස්ථිතිය පිළිබඳ මෙන් ම එම භාෂාවෙහි වාක්‍ය විචාරාත්මක ලක්ෂණ (Syntactic features) පිළිබඳ ව ද හඳුනාගත හැකි වෙයි. ඒ අනුව භාෂාවක වාක්‍ය විචාරාත්මක ලක්ෂණ අනුව අදාළ භාෂාවේ වාක්‍ය සංස්ථිතියෙහි වෙනස්වීම් සිදු වෙයි. මෙහි දී අපගේ පර්යේෂණ ගැටලුව නම් 'ලේඛන සිංහලයෙහි වාක්‍ය සංස්ථිතිය වෙනස්වීමෙහි ලා බලපාන වාක්‍ය විචාරාත්මක ලක්ෂණ කවරේ ද?' යන්නයි. මෙම පර්යේෂණය සඳහා අවශ්‍ය දත්ත එනම් ලේඛන සිංහල වාක්‍ය රැස් කර ගනු ලැබූයේ සිංහල ලේඛන ඇතුළත් වාග් සංහිතාවක් ඇසුරිනි. එම වාග් සංහිතාවෙන් රැස් කර ගත් වාක්‍ය දහසක් පමණ මෙහි දී විශ්ලේෂණය කෙරිණි. පර්යේෂණයේ දී අනාවරණය වූ කරුණු ඇසුරින් මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් සාකච්ඡා කෙරෙනුයේ ඉච්ඡානුකතාව (volatility) සම්බන්ධ කරුණු පමණි. ඒ අනුව ඉච්ඡානුක - අනිච්ඡානුක (volitive - involitive) භේදය පිළිබඳ සිංහල සාම්ප්‍රදායික ව්‍යාකරණ කෘතීන්හි මෙන් ම නූතන වාග්විද්‍යාත්මක අධ්‍යයනවල දී ද සාකච්ඡා කෙරෙනුයේ සිංහල ක්‍රියාපදවල පදිම විචාරාත්මක විශේෂතාවක් වශයෙනි. මෙහි දී කිරීම් ක්‍රියාවල (action verbs) රූපීය වෙනස්කම් ප්‍රකාර ව අකාරාන්ත හෝ ඉකාරාන්ත ක්‍රියා ඉච්ඡානුක ක්‍රියා ලෙස ද තත් ක්‍රියාපදවල එකාරාන්ත ක්‍රියා මූලයෙන් සෑදෙන රූප අනිච්ඡානුක ක්‍රියා ලෙස ද විස්තර වෙයි. මෙම අධ්‍යයනයේ දී ඉච්ඡානුකතාව යනු විමර්ශනය කෙරෙනුයේ වාක්‍ය විචාරාත්මක සංසිද්ධියක් (syntactic phenomenon) වශයෙනි. එනම් කිරීම් ක්‍රියාවක් මූලික ඒකකය ලෙස යෙදෙන කිසියම් වාක්‍යයක සංස්ථිතිය වෙනස් වීමෙහි ලා බලපාන වාක්‍ය විචාරාත්මක ලක්ෂණ කිහිපයක් වන අතර ඉන් එකක් ලෙස මෙහි දී ඉච්ඡානුකතාව සංග්‍රහ කෙරේ. ඒ අනුව ඉච්ඡානුකතාවෙහි ස්වභාවය සහ එම ලක්ෂණ සහිත වාක්‍ය සංස්ථිති පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වෙයි. ලේඛන සිංහල වාක්‍ය රටා විග්‍රහ කිරීමෙන් කරන ලද අපගේ පර්යේෂණයට අනුව ලේඛන සිංහලයෙහි ඉච්ඡානුකතාව සහිත වාක්‍ය සංස්ථිති තුනකිඃ 1. ඉච්ඡානුක වාක්‍ය සංස්ථිති, 2. අනිච්ඡානුක වාක්‍ය සංස්ථිති සහ 3. අනිච්ඡානුක හැඟවුම් වාක්‍ය සංස්ථිති වශයෙනි. එහි දී පළමු වාක්‍ය රටාව ඉච්ඡානුක කර්තෘ සහ ඉච්ඡානුක ක්‍රියාවකින් ද දෙවන වාක්‍ය රටාව අනිච්ඡානුක කර්තෘ සහ අනිච්චානුක ක්‍රියාවකින් ද තෙවන වාක්‍ය රටාව ඉච්ඡානුක කර්තෘ සහ අනිච්චානුක ක්‍රියා රූපකින් ද සමන්විත වෙයි. මෙම වාක්‍ය රටාවල ස්වභාවයත් වෙනත් වාක්‍ය විචාරාත්මක



1. භාෂා තාක්ෂණ පර්යේෂණාගාරය, කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය.
cml@ucsc.cmb.ac.lk

ලක්ෂණවලින් ඉච්ඡානුකතාව වෙනස් වන ආකාරයත් සාකච්ඡා කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවෙහි අරමුණයි.

**මූඛ්‍ය පදඃ** ඉච්චානුකතාව, වාක්‍ය විචාරය, සිංහල භාෂාව

# සිංහල හා හින්දි භාෂණයේ භාවිත ස්ථානවාචී ආදේශක වචන පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

දිමුතු දිලුම් ධනංජය විතානගේ[1]

**සාරසංක්ෂේපය**

සිංහල භාෂාව සහ හින්දි භාෂාව එක ම භාෂා පවුලකට අයත් එක ම භාෂාවක් කේන්ද්‍ර කොට ගෙන බිහි වූ සහ විකාශය වූ භාෂා දෙකකි. එසේ වුවත් සිංහල සහ හින්දි භාෂාව ව්‍යවහාර වන්නේ සාගරයෙන් වෙන් ව පිහිටි එකිනෙකට වෙනස් සංස්කෘතීන් දෙකක් පදනම් ව ගොඩනැගුණු සමාජ වටපිටාවක් කේන්ද්‍ර කොට ගෙන ය. එබැවින් සිංහල සහ හින්දි භාෂා සංසන්දනාත්මක ව අධ්‍යයනය කිරීමේ දී සමානතා මෙන් ම අසමානතා ද හඳුනා ගත හැකි ය. නූතන වාග්විද්‍යාවේ දියුණුවත් සමග විකාසය වන අර්ථ විචාරය සහ ප්‍රකරණ විචාරය සම්බන්ධ අධ්‍යයන සිංහල භාෂාවෙන් සහ හින්දි භාෂාවෙන් සිදු වී ඇත්තේ අවම ප්‍රමාණයකි. ප්‍රකරණ විචාරයේ දී හඳුනා ගැනෙන ස්ථානවාචී ආදේශක වචන නිපාත ලෙස, ක්‍රියා විශේෂණ ලෙස හෝ අව්‍ය පද ලෙස හින්දි සහ සිංහල සාම්ප්‍රදායික ව්‍යාකරණයේ විග්‍රහ කර ඇත. එම පද වාග්විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් අර්ථ විචාරාත්මක ව සහ ප්‍රකරණ විචාරාත්මක ව අධ්‍යයනය කිරීමේ දී භාෂණ සිංහල සහ භාෂණ හින්දි ස්ථානවාචී ආදේශක වචන සමාන ව ප්‍රකරණ බද්ධ වේ ද නොවේ ද යන්න සෙවීම මෙහි පර්යේෂණ ගැටලුව යි. සිංහල සහ හින්දි භාෂණයේ භාවිත ස්ථානවාචී ආදේශක වචන සංසන්දනාත්මක ව අධ්‍යයනය කර එවැනි සමාන අසමානතා හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය. සිංහල සහ හින්දි භාෂාවේදීන් සමග සිදු කළ සම්මුඛ සාකච්ඡා ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ද විෂයානුබද්ධ ග්‍රන්ථ, ශාස්ත්‍රීය ලිපි සහ සඟරා ද්විතීයික මූලාශ්‍රය වශයෙන් ද භාවිත කරන ලදී. සපයාගත් දත්තවල ගුණාත්මක තත්ත්ව විශ්ලේෂණය කිරීම මගින් ප්‍රස්තුත පර්යේෂණයේ නිගමනවලට එළඹී අතර, එහි දී සපයාගත් දත්තවල ප්‍රමාණාත්මක කරුණු කෙරෙහි ද අවධානය යොමු කෙරිණි. ප්‍රස්තුත පර්යේෂණයේ දත්ත විශ්ලේෂණයට අනුව භාෂණ සිංහලයේ සහ භාෂණ හින්දියේ භාවිත වන ස්ථානවාචී ආදේශක වචන ප්‍රමාණාත්මක ව අසමාන බවත් එසේ ම භාෂණ සිංහලට සාපේක්ෂ ව භාෂණ හින්දි ස්ථානවාචී ආදේශක වචනවල ප්‍රකරණ බද්ධ අර්ථ උත්පාදකතාව ඉහළ බවත් නිගමනය කළ හැකි ය.

**මුඛ්‍ය පද:** අර්ථය, ආදේශක වචන, ප්‍රකරණය, භාෂණය, වාගාලාප

1. බාහිර කථිකාචාර්ය, ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය.
dwithanage8821@gmail.com

# සිංහල හා දෙමළ භාෂාවල ආදේශක නාම භාවිතය

භාග්‍යා දිල්හානි මාබුලගේ[1]

**සාරසංක්ෂේපය**

කිසියම් නාම පදයක් වෙනුවට කාලවාචීව, ස්ථානවාචීව, සත්ත්වවාචීව හා අචේතනික ආදි වශයෙන් භාවිත කළ හැකි නාම, ආදේශක නාම යනුවෙන් හඳුන්වා දිය හැකිය. සාම්ප්‍රදායික ව්‍යාකරණයේදී සර්ව නාම යනුවෙන් හඳුන්වන නාම පද විශේෂයද මෙම ආදේශක නාම කොටසට අදාළව අධ්‍යයනය කළ හැකිය. වාක්‍ය විචාරයේදී භාෂාවක භාවිත වන වාක්‍ය, ඒවායේ සංස්ථිතිය අනුව සරල හා සංකීර්ණ වාක්‍ය වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදා දක්වන අතර සිංහල හා දෙමළ භාෂාවල භාවිත වන ආදේශක නාම මෙම සංස්ථිතීන් දෙකෙහිදීම දක්නට ලැබේ. සිංහල හා දෙමළ භාෂාවල ආදේශක නාම භාවිතයේ පවතින සම-විෂමතා මොනවාද?' යන්න  පර්යේෂණ ගැටලුව වශයෙන් යොදා ගෙන මෙම අධ්‍යයනය සිදු කරන ලදී. භාෂා දෙකෙහි ආදේශක නාම භාවිතයෙහි පවතින සමානතා හා අසමානතා හඳුනා ගැනීම, දෙවන භාෂා අධ්‍යයනයේදී භාෂකයකු සිදු කරන භාෂාන්තර භාෂා දෝෂ අවම කර ගැනීම යනාදිය පර්යේෂණයේ අරමුණු ලෙස පෙන්වා දිය හැකිය. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ මෙහිදී ප්‍රාථමික හා ද්විතීයික දත්ත ලබා ගන්නා ලදී. අධ්‍යයන වර්ෂයක් තුළ දෙවන භාෂාවක් ලෙස දෙමළ භාෂාව අධ්‍යයනය කරන විශ්වවිද්‍යාල සිසුන්ගේ ආදේශක නාම භාවිතය පිළිබඳ නිරීක්ෂණයෙන් ප්‍රාථමික දත්ත රැස් කර ගනු ලැබීය. ද්විතීයික දත්ත රැස් කිරීම සඳහා සිංහල හා දෙමළ භාෂාවල ආදේශක නාම භාවිතය පිළිබඳව පවතින ලිඛිත මූලාශ්‍රය භාවිතයට ගැනිණි. අධ්‍යයනයේදී ස්ථානවාචී ආදේශක නාම භාවිතය භාෂා දෙකෙහිම සමාන ලක්ෂණවලින් සමන්විත වුවද, ප්‍රකරණ විචාරයේදී දෙමළ භාෂකයා සැලකිලිමත්ව භාවිත කරන ඇතැම් ආදේශක නාම සිංහල භාෂකයා සාවද්‍ය ලෙස භාවිත කරන බව දක්නට ලැබුණි. කාලවාචී ආදේශක නාම, සිංහල භාෂාවේදී ප්‍රත්‍ය ගැන්වුවද, දෙමළ භාෂාවේදී ප්‍රත්‍ය නොගන්වයි. සිංහල භාෂාවේ සත්ත්වවාචී ආදේශක නාම භාවිතය සංකීර්ණ වුවද, දෙමළ භාෂාවේ භාවිත වන්නේ සීමිත වචන ප්‍රමාණයකි. අචේතනික ආදේශක නාම භාවිතය භාෂා දෙකෙහිම සමානය. ඒ අනුව භාෂා දෙකෙහි ආදේශක නාම භාවිතයෙහි සමානතා මෙන්ම අසමානතාද දක්නට ලැබෙන අතර අර්ථ ගොඩනගා ගැනීමේදී ප්‍රකරණ විචාරය කෙරෙහි අවධානය යොමු කිරීමෙන් දෙවැනි භාෂා අධ්‍යයනයේදී සිදු වන භාෂාන්තර භාෂා දෝෂ අවම කළ හැකි බව නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද:** ආදේශක නාම, දෙමළ භාෂාව, ප්‍රකරණ විචාරය, සිංහල භාෂාව

---

1. සහාය කථිකාචාර්ය, සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
bhagyadilhani@sjp.ac.lk

# සිංහලයේ පද බෙදීම - භාෂා සංහිතා සැලසුම පිළිබඳ අධ්‍යයනයක්

වයි. ඩී. ප්‍රියංකර[1]

**සාරසංක්ෂේපය**

1956 සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත් වීමෙන් අනතුරුව සිංහල භාෂාවේ පද බෙදුම අරබයා රජයේ මැදිහත්වීමෙන් භාෂා සංහිතා සැලසුම් ඉදිරිපත් වෙයි. පද බෙදුම අරබයා මෙසේ ඉදිරිපත් වන භාෂා සංහිතා සැලසුම් විවිධ අවස්ථාවල ද, විවිධ ආයතන යටතේ ද ඉදිරිපත් වනු දක්නට ලැබෙයි. මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලුවට පදනම් වන්නේ ද භාෂා සංහිතා සැලසුම සිදු කිරීමේ දී ගොඩනැඟුණු මෙම පසුබිම යි. ඒ අනුව සිංහල භාෂාවේ පද බෙදීමේ සම්මතය දක්වනු වස් විවිධ අවස්ථාවල, විවිධ ආයතන යටතේ මැදිහත් වීම් සිදු වූයේ මන්ද? යන පර්යේෂණ ගැටලුවට විසඳුම් සෙවීම මෙම පර්යේෂණයෙන් සිදුවිය. ඒ සඳහා 1957 සංස්කෘතික දෙපාර්තමේන්තුවේ උපදේශ සභාව මඟින් සම්පාදනය කළ පද බෙදීමේ වාර්තාවේ සිට 2015 සිංහල ලේඛන රීතිය දෙවන සංස්කරණය දක්වා රජයේ මැදිහත්වීමෙන් නිකුත් කළ වාර්තා අධ්‍යයනය කෙරිණි. එම වාර්තාවල පද බෙදීම සම්බන්ධයෙන් දක්වා ඇති රීති, වාර්තා එළිදැක්වුණු වර්ෂ අනුපිළිවෙළට වගුවලට ඇතුළත් කොට තුලනය කොට බැලීමේ ක්‍රමවේදය මෙම පර්යේෂණයේ දත්ත විශ්ලේෂණයට යොදා ගන්නා ලදී. එක් රීතියක් විකාශනය වී ඇත්තේ කෙසේ ද? එම රීතිය විකාශනයේ දී කුමන වෙනස්කම්වලට නතු වී තිබෙන්නේ ද යන කරුණු මේ යටතේ අනාවරණය කොට ගැනුණි.

| සංස්කෘතික දෙපාර්තමේන්තුවේ උපදේශක මණ්ඩල වාර්තාව | සම්මත සිංහල කමිටු වාර්තාව | සිංහල ලේඛන රීතිය | සිංහල ලේඛන ව්‍යවහාරය: උපදේශ සංග්‍රහය 2014 |
|---|---|---|---|
| නාමයකට හෝ කෘදන්තයකට විශේෂණ වශයෙන් 'නො' යෙදීමේ දී එය වෙන් නො කළ යුතු ය. ආඛ්‍යාතයකට හෝ නිපාතයකට පූර්වයෙහි යෙදෙන විට 'නො' වෙන් ව සිටී. නොකමසේ (බොහෝ), නොසරප් (වහා), නොයෙ (ඉදින්) යන සංකීර්ණ නිපාත එකට ම ලිවිය යුතු ය. (1957) | නාමයකට හෝ කෘදන්තයකට හෝ මුලින් සිටිනා 'නො' නිපාතය නොවෙන් ව ම ලිවිය යුතු යි. (1968, 1969) (1957) | නාම පදයක් හා යෙදෙන 'නො' නිපාතය ඒ හා එක් කොට ලිවිය යුතු ය. (1989, 2001) 'නො' නිපාතය දෙවැනි වචනයෙන් වෙන් කොට ලිවිය හැකි ය. (2015) | රීතියක් දක්වා නැත. |

(වගු අංකය 01)

---

1. පශ්චාද් උපාධි අපේක්ෂක,කැලණිය විශ්වවිද්‍යාලය.
priyankarayd@gmail.com

මෙම නිර්දේශ අනුව 'නො' නිපාතය භාවිතය සම්බන්ධයෙන් අනුගමනය කොට ඇති සම්මතය එක් එක් වාර්තාවල විවිධ ස්වරූපයෙන් දක්වා තිබෙනු දැකගත හැකි ය. එසේ ම විවිධ රජයේ ආයතන මඟින් සම්පාදනය කළ ඇතැම් වාර්තාවක 'නො' නිපාතය භාවිතය පිළිබඳ රීතියක් නොදක්වා තිබීම ද ගැටලුවකි. ඒ අනුව සිංහලයේ පද බෙදීමේ සම්මතය අනාවරණය කෙරෙන මෙබඳු භාෂා සංහිතා සැලසුම්වල දක්නට ලැබෙන අසමරූපී බව සිංහලයේ පද බෙදීම සම්බන්ධයෙන් සංදිග්ධතාවක් ඇති වීමට හේතු වී ඇති බව නිගමනය කෙරුණි.

**මුඛ්‍ය පද :** සංහිතා සැලසුම, සම්මතය, රජයේ වාර්තා, පද බෙදීම

# සිංහල භාෂාවේ ක්‍රියාපදය පිළිබඳ ව නූතන ව්‍යාකරණඥයන්ගේ විග්‍රහය පිළිබඳ ව තුලනාත්මක අධ්‍යයනයක් (තෝරා ගත් ව්‍යාකරණ ග්‍රන්ථ කිහිපයක් ඇසුරින්)

චානිකා පියුමාලි දොඹගොල්ල[1]

**සාරසංක්ෂේපය**

දහනවවන සියවසෙහි අග භාගයේ සිට පිරිවෙන් සහ පාසල්වල සිංහල භාෂා අධ්‍යාපනය ඇරඹීමත් සමඟ සිදත් සඟරා ව්‍යාකරණයට සීමා නොවී නූතනයට යෝග්‍ය නව ව්‍යාකරණ ග්‍රන්ථ සම්පාදනයේ අවශ්‍යතාව මතු වීමත් සමඟ හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන්ගේ 'වර්ණ රීති සහ සිංහල ව්‍යාකරණය', වේරගම පුංචි බණ්ඩාරගේ 'පද නීතිය', තියඩෝර් ජී. පෙරේරාගේ 'සිංහල භාෂාව' සහ මුනිදාස කුමාරතුංගගේ 'ව්‍යාකරණ විවරණය' යනාදි ග්‍රන්ථ රචනා විය. එම කෘති ඇසුරින් සිංහල භාෂාවේ ක්‍රියාපදය පිළිබඳ ව නූතන ව්‍යාකරණඥයන්ගේ අදහස් තුලනාත්මක ව විමසීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ රැස් කළ දත්ත විස්තරාත්මක විධික්‍රමය උපයෝගී කර ගෙන විග්‍රහ කෙරිණි. පර්යේෂණ ගැටලුව වූයේ විවිධ ව්‍යාකරණඥයන් සිංහල භාෂාවේ ක්‍රියාපදය පිළිබඳ ව විග්‍රහ කර ඇත්තේ කෙසේ ද යන්න යි. ව්‍යාකරණ රීති සහ සිංහල ව්‍යාකරණය, පද නීතිය සහ සිංහල භාෂාව කෘතිවල ක්‍රියාපද විග්‍රහය එකිනෙකට සමාන ය. ඊට පෙර රචනා වූ ව්‍යාකරණ ග්‍රන්ථවලට සාපේක්ෂ ව මුනිදාස කුමාරතුංගගේ ව්‍යාකරණ විවරණයෙහි සිංහල ක්‍රියාපදය පිළිබඳ ව විස්තරාත්මක විග්‍රහයක් ඇතුළත් ය. ඩබ්.එස් කරුණාතිලක 'සිංහල භාෂා ව්‍යාකරණය' ග්‍රන්ථයේ ක්‍රියාපදය පිළිබඳ ව නව විග්‍රහයක් ඉදිරිපත් කර ඇත. එමෙන් ම ජේ.බී. දිසානායක ක්‍රියාපදය පිළිබඳ ව ඉදිරිපත් කර ඇති නව විග්‍රහය වන 'යම් පදයක අවසාන පදාණුව හැටියට ක්‍රියා ප්‍රත්‍යයක් ඇතුළත් වේද, එය ක්‍රියාපදයක් වශයෙන් සලකනු ලැබේ' යන මතය ද මෙහි සඳහන් කළ යුතු ම ය. පාසල් දරුවන්, භාෂා ව්‍යාකරණඥයන් ඇතුළු ව්‍යාකරණ පිළිබඳ අධ්‍යයනය කරන අයට සිංහල ක්‍රියාපදය පිළිබඳ විවිධ විග්‍රහයන් අවබෝධ කර ගැනීමට මෙම පර්යේෂණය ව්‍යාකරණාත්මක වශයෙන් වැදගත් වේ. අනාගතයේ දී ද විවිධ විද්වතුන් සිංහල භාෂාවේ ක්‍රියාපදය සම්බන්ධයෙන් විවිධ මතවාද ඉදිරිපත් කරති'යි විශ්වාස කළ හැකි ඇති අතර මෙතෙක් බිහි වී ඇති නූතන ව්‍යාකරණ ග්‍රන්ථ කිහිපයක සිංහල භාෂාවේ ක්‍රියාපදය පිළිබඳ ව ඇතුළත් විග්‍රහයන් අධ්‍යයනය කිරීමෙන් ඒ පිළිබඳ ව නව විග්‍රහයක් ගොඩ නගා ගැනීමට මෙම පර්යේෂණය ඉවහල් වනු ඇති බව නිගමනය කළ හැකි ය.

**මුඛ්‍ය පදඃ** ව්‍යාකරණය, සිංහල භාෂාව, ක්‍රියාපදය, විග්‍රහය, නූතන ව්‍යාකරණඥයන්

1. සහකාර කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණි විශ්වවිද්‍යාලය
chanikadombagolla071@gmail.com

# තහංචි ව්‍යවහාර වාරණය පිළිබඳ සමාජ වාග්විද්‍යාත්මක අධ්‍යයනයක් (වරකාගොඩ ග්‍රාම නිලධාරී වසම ආශ්‍රයෙන්)

ඩබ්. ඩී. එන්. ඩී. විතානගේ[1]

**සාරසංක්ෂේපය**

මානව භාෂාවක පැවැත්ම රඳා පවතින්නේ එකී භාෂක සමාජයේ සන්නිවේදන කටයුතු සඳහා භාෂාව සක්‍රීයව දායක කර ගන්නේ නම් පමණි. මෙම භාෂාව බොහෝ විට භාෂක සමාජයේ සාමාජිකයන්ගේ සිතුම් පැතුම්, අදහස් උදහස් ආදි වූ ආකල්ප සමස්තයක එකතුවකින් නිර්මාණය වී ඇත. භාෂකයාගේ චින්තන රටාවට අනුව අනුවර්තනය වන සජීවී භාෂාව තුළ තහංචි ව්‍යවහාර නිර්මාණය ස්වාභාවිකවම සිදු වේ. "කිසියම් සමාජයක එකී සමාජය විසින් විශ්වාස කෙරෙන, එහි සාමාජිකයන්ට හානි කරවන එනම් අවුල් සහගත තත්වයක් ඇති කරවන නැතිනම් අපහසුතාවට පත් කරන හෝ ලැජ්ජා සහගත වන හැසිරීමක් තහංචියක් (වාරණයක්) හෝ මඟ හැරිය යුතු දෙයක් වේ" (Wardhaugh, 2000: 234). මේ අනුව තහංචි වහර භාෂක සමාජයක් විසින් ව්‍යවහාරයෙන් වැළකෙන වදන් නිසා ඇති වූ සංකල්පයකි. මෙහිදී තහංචි වහර වාරණයට පත් කරන්නේ ඇයිද යන්න පර්යේෂණ ගැටලුව වශයෙන් යොදා ගනිමින් පර්යේෂණය සිදු කෙරිණි. පර්යේෂණයේ මූලික අරමුණ වූයේ භාෂක සමාජයේ තහංචි වහර ව්‍යවහාරයෙන් බැහැර කිරීම කෙරෙහි සමාජීය ආකල්පවල බලපෑම අධ්‍යයනය කිරීමයි. කළුතර දිස්ත්‍රික්කයේ මදුරාවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් වරකාගොඩ ග්‍රාම නිලධාරී වසම මෙහි පර්යේෂණ නියැදිය වශයෙන් තෝරා ගන්නා ලදී. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ දත්ත එක්රැස් කර ගැනීම සඳහා සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලිය යන විධික්‍රම භාවිත කෙරිණි. සමාජවාග්විද්‍යාත්මක න්‍යාය හා සංකල්ප මත මේ අධ්‍යයනය පිහිටන බැවින් තහංචි වහර, භාෂා වාරණය වැනි සමාජවාග්විද්‍යාත්මක සංකල්ප උපයෝගී කර ගනිමින් දත්ත විශ්ලේෂණය සිදු කර ඇත. උක්ත විධික්‍රම මගින් වරකාගොඩ ග්‍රාම නිලධාරී වසමෙන් අහඹු ලෙස තෝරා ගත් පුද්ගලයන් තිස්දෙනෙකුගෙන් යුත් නියැදියකින් ලබා ගත් දත්ත විශ්ලේෂණය කිරීමෙන් ගම්‍ය වූයේ තහංචි වහර පිළිබඳව භාෂක සමාජය සවිඥානික බවත්, සමාජ පිළිගැනීම, සභ්‍යත්වය, බහු අර්ථ ගෙන දීම, ප්‍රියතාව (පිළිකුල), ජන විශ්වාස සහ ඇදහිලි යන කරුණු හේතුවෙන් තහංචි වහර ව්‍යවහාරයෙන් බැහැර කිරීමට ප්‍රධාන වශයෙන් බලපාන බවයි. මෙසේ තහංචි වහර ව්‍යවහාරයෙන් බැහැර වීමට සමාජ ආකල්ප බලපෑවද භාෂාවේ වාක්කෝෂය තුළ මෙම වාගාලාප නොනැසී සක්‍රියව පවතින බව නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද :** තහංචි ව්‍යවහාර, භාෂා වාරණය, සමාජීය ආකල්ප

---

1. සහකාර කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය
narmada@sinh.cmb.ac.lk

# සිංහල මාධ්‍ය ශාස්ත්‍රීය ලේඛන විද්‍යුත් ප්‍රකාශනයෙහි ගැටලු හා ප්‍රමිතිකරණයෙහි අවශ්‍යතාව

තමලු මලිත්ත පියදිගම[1]

**සාරසංක්ෂේපය**

සිංහල මාධ්‍ය ශාස්ත්‍රීය ලේඛන විද්‍යුත් වශයෙන් PDF ගොනු ආකාරයෙන් ගබඩා කිරීම හා ප්‍රකාශනය කිරීම සාමාන්‍යයෙන් සිදු වේ. බොහෝ ශාස්ත්‍රීය සඟරා හා සම්මන්ත්‍රණ නිර්දේශ කරන්නේ යුනිකේත නොවන රුවකුරු (font) බැවින් අන්තර්ජාලයේ ශාස්ත්‍රීය සෙවුම් යන්ත්‍ර මඟින් ලේඛනවල අන්තර්ගතය විමසා බැලීමට නො හැකි අතර උපුටාගැනීම් (citation) කර්තෘ යටතේ ලැයිස්තුගත නොවීම විශාල අඩුපාඩුවකි. ගොනුව විවෘත කොට පරිගණක මඟින් කොටස් පිටපත් කිරීමට හෝ පයිත සෙවීම් (text search) සිදු කිරීමට හෝ නො හැකි වීම ගවේෂකයන්ට අපහසුවකි. යුනිකේත (unicode) රුවකුරු භාවිත කළ ද විසඳුමක් නො ලැබෙන්නේ විවිධ පරිගණක පද්ධතිවල PDF සකසනයන් හා PDF කියවනයන් මඟින් දැනට භාවිත යුනිකේත රුවකුරු ද ගොනුවට අන්තර්ගත වන්නේ විකෘති ව බැවිනි. මේ ගැටලු සඳහා විසඳුම ලෙස මෙම අධ්‍යයනයෙන් යෝජනා කරන්නේ සිංහල ශාස්ත්‍රීය ලේඛන විද්‍යුත් මාදිලියෙන් ප්‍රචාරය සඳහා EPUB ගොනු ආකාරය භාවිත කිරීම යි. මුද්‍රණ අවශ්‍යතා සඳහා වැදගත් PDF ගොනු ආකාරයත් ප්‍රකාශනය සඳහා වඩාත් උචිත EPUB හා HTML ගොනු ආකාරත් ස්වයංක්‍රීය ව ලබා ගැනීමට ඉතා අවම තාක්ෂණික දැනුමකින් පිළියෙල කළ හැකි සරල RST පයිත ආකෘතිය භාවිත කළ හැකි ය. පිටු සැකසීම ස්වයංක්‍රීය කිරීම මඟින් ඒ සඳහා අමතර පරිශ්‍රමයක් දැරීම වළක්වා ගත හැකි ය. ඉදිරි අධ්‍යයනයක් ලෙස නිර්මාණය කිරීමට බලාපොරොත්තු වන උක්ත ප්‍රමිතිකරණවලට අනුරූප ව ශාස්ත්‍රීය ලේඛන සැකසීමේ හා සමාලෝචනය කොට පළ කිරීමේ සේවා සපයන වෙබ් මෙවලමක මූලික අංග මෙම අධ්‍යයනයෙන් හඳුනාගැනේ.

**මූඛ්‍ය පදඃ** විද්‍යුත් ප්‍රකාශන, යුනිකේත, *EPUB*, ශාස්ත්‍රීය ලේඛන, *PDF*

---

1. දත්ත ඉංජිනේරු, (Senid Mobile Solutions)
thamalumaliththa@gmail.com

# Morphological and Periphrastic Expressions of Tense and Aspect in Sinhala Language

Thamalu Maliththa Piyadigama[1]

**Abstract**

Modern linguists uphold Sinhala has two tenses, against traditional grammar which described three tenses. Prominent researchers considered the tense and aspect system of Sinhala to be complex but rarely investigated grammatical or lexical aspects. Therefore, contemporary understanding is grossly incomplete and inconsistent with the discourse. As a continuation of research I previously posted in several preprints, this study affirms that Sinhala is a tense less language following a constructive and theoretical research method. Tenseless languages lack the grammatical category of tense. The verbal categories previously misclassified as past and present tense actually indicate perfective and imperfective aspects. Shifting absolute and relative external time references in sample sentences verifies the tenseless nature because the same category fits as long as the internal temporal constituency remains the same. The imperfective category indicates progression, repetition, habitual aspect, chance, and customary use in newspaper headlines. Nevertheless, as mentioned in recent research, tenseless languages can mark time by combining aspect, mood, semantics and syntax. Following descriptive research methods, this study extends the analysis of indicative finite verbs to other modes, participle forms and periphrastic structures to describe how the language utilises the two basic aspectual categories to express tenses and subtle subcategories of aspect.

**Keywords:** *Tenseless language, grammatical aspect, expression of tense, temporality, morphology*

---

1. Data Engineer, Senid Mobile Solutions
thamalumaliththa@gmail.com

# සිංහල වාක්‍ය රීති අධ්‍යයනය සඳහා වාග්විද්‍යාත්මක ප්‍රවේශයක්

රනිල් ප්‍රභාත් සෝමරත්න[1]

**සාරසංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ ශිෂ්‍ය සංඛ්‍යාව දළ වශයෙන් ලක්ෂ හතළිහකි. ඔවුන් සිය වසකට ආසන්න කාලයක් තිස්සේ 'මව් බස' ලෙස සිංහල විෂයෙහි වාක්‍ය රීති අධ්‍යයනය කරන්නේ වාක්‍යයෙහි අර්ථය මත පමණක් පදනම් වූ සාම්ප්‍රදායික ප්‍රවේශයකිනි. මෙම පර්යේෂණය එම සාම්ප්‍රදායික ප්‍රවේශය අබිබවා යන්නකි. වාක්‍යයෙහි රූපීය ලක්ෂණ හා අන්තර්ලීන වශයෙන් පවතින රටාව සූත්‍රයක් ලෙස ඉස්මතු කර දැක්වීම මගින් වාක්‍යයක් තවත් වාක්‍යයකින් වෙනස් වන්නේ කෙසේදැයි හඳුනාගැනීමට තුඩුදීම මෙම පර්යේෂණයෙහි ස්වභාවයයි. දශක දෙකකට ආසන්න කාලයක් සිංහල භාෂාව ඉගැන්වීම සඳහා වාග්විද්‍යාත්මක ශික්ෂණයක් යොදා ගැනීමේ ශක්‍යතාව නිරීක්ෂණය කර ඇත. ශිෂ්‍ය ප්‍රජාව අවබෝධයකින් යුක්තව වාක්‍ය රීති භාවිතයට හුරු කරවීමේ අරමුණින් නියමාත්මක ව්‍යාකරණයට අයත් වාක්‍ය රීති අධ්‍යයනයේ දී ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මතු වූ ගැටලු සඳහා තාර්කික, නොවරදින භාෂා විද්‍යාත්මක අධ්‍යයන ක්‍රමවේදයක් ගොඩ නැගීමේ අවශ්‍යතාව හඳුනා ගෙන, ඒ වෙනුවෙන් කරන ලද අධ්‍යයනවල ප්‍රතිඵලය ලෙස ගොඩ නැගූ "වාක්‍ය සූත්‍ර" පද්ධතියක් භාෂා අධ්‍යයන ක්ෂේත්‍රයට හඳුන්වාදීම මෙම පර්යේෂණය මගින් සිදු වේ. ආසන්න වශයෙන් වසර දහයක කාලයක් තිස්සේ සිංහල භාෂාව අධ්‍යයන කළ ද වාක්‍ය රීති නිවැරදි ව ලේඛනය සඳහා භාවිත කිරීමට ලේඛනයෙහි යෙදෙන ශිෂ්‍ය ප්‍රජාව අසමත් ව ඇත. භාෂා අධ්‍යයනය සඳහා දීර්ඝ කාලයක් කැප කළ ද එය ඵලදායක බවින් අඩු වී ඇති බව ඒ අනුව නිරීක්ෂණය කළ හැකි ය. දශක ගණනාවක් තිස්සේ භාවිත කළ ද සාර්ථක ප්‍රතිඵල ලැබී නැති සාම්ප්‍රදායික භාෂා අධ්‍යයනයට තව දුරටත් අපේක්ෂිත කාර්ය ඉටු කළ නොහැකි ව පවතින හෙයින් අලුත් ක්‍රමවේද කෙරෙහි භාෂාඥයන්ගේ අවධානය යොමු නොවී පැවතීමට විසඳුමක් යෝජනා කිරීම මෙම පර්යේෂණයෙන් සිදු වේ. මෙම නව ව්‍යාකරණ රීති අධ්‍යයනය ශිෂ්‍ය ශිෂ්‍යාවන් පන්දහසකට වැඩි ප්‍රමාණයක් ඇසුරෙහි සිදු කර ඇත. අභ්‍යාස ලෙස ලබා දෙන්නේ පසුගිය විභාග සඳහා සෘජු ව විමසා ඇති වාක්‍ය රීති සම්බන්ධ ප්‍රශ්න පමණකි. පැය භාගයක් ඇතුළත ක්‍රමවේදය හැඳින්වීම හා 'රීති සූත්‍ර' හඳුන්වාදීම මගින් සාර්ථක ප්‍රතිඵල ලබා ඇත. නිශ්චිත ශිෂ්‍ය ප්‍රජාවක් යොදා ගෙන ඕනෑ ම විද්වත් මණ්ඩලයක් ඉදිරියෙහි මෙහි ප්‍රායෝගික බව සාර්ථක ව සනාථ කළ හැකි ය. තමාට වාක්‍ය රීතිය හඳුනා ගැනීමට, අවබෝධ කර ගැනීමට හැකිවීම හා අවශ්‍ය නම් වෙනත් කෙනෙකුට නිවැරදි ව ඉගැන්වීමට හැකියාව ලැබීම මෙමගින් ලැබෙන ප්‍රතිඵල වශයෙන් පෙන්වා දිය හැකි ය.

**මුඛ්‍ය පද** : අන්තර්ලීන, වාක්‍ය රීති, වාක්‍ය සූත්‍ර, භාෂා ශක්‍යතාව, නියමාත්මක ව්‍යාකරණය

1. පශ්චාද් උපාධි අපේක්ෂක, කැලණිය විශ්වවිද්‍යාලය
ranilprabath32@gmail.com

# බදුල්ල නාගරික කලාපයේ භාෂා භූදර්ශනය පිළිබඳ අධ්‍යයනයක්

ජේ. එම්. කලණ හසන්ත ජයසුන්දර[1]

**සාරසංක්ෂේපය**

භාෂා භූදර්ශනය (linguistic landscapes) වාග්විද්‍යා විෂය ක්ෂේත්‍රයේ මෑත කාලයෙහි උද්භව වූ පර්යේෂණ මාර්ගයකි. සමාජවාග්විද්‍යා අධ්‍යයනයේදී 'භාෂණ ව්‍යවහාරය' ප්‍රධාන මූලාශ්‍රය කොටගත්තද නූතන ව්‍යවහාරික වාග්විද්‍යාත්මක අධ්‍යයනයන්හිදී එකී මූලාශ්‍රයවල පරාසය පුළුල් කරමින් භාෂාවේ දෘශ්‍ය සංඥා අධ්‍යයන සඳහා පර්යේෂණ නියැදි ලෙස උපයුක්ත කොටගනු ලැබේ. ඒ අනුව තෝරා ගන්නා ලද භූමියක හෝ කලාපයක හෝ පොදු හා වාණිජ සංඥා මත පදනම්ව භාෂාවල දෘශ්‍ය විශදතා භාෂා භූදර්ශනය යටතේ අධ්‍යයනය කෙරේ. දිවයිනේ භාෂා සංයුතියේ විස්තෘතිය හා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය කොතෙක් දුරට නිරූපණය කෙරේද යන්න පර්යේෂණ ගැටලුව වේ. මේ අධ්‍යයනය සඳහා බහුවාර්ගික ප්‍රධාන නගරයක් වන බදුල්ල නගරය පාදක කරගනිමින් ප්‍රධාන වීථි කිහිපයක දෘශ්‍ය සංඥාවලින් පිළිබිඹු වන භාෂා භූ දර්ශනය මිශ්‍ර අධ්‍යයන ක්‍රමවේද භාවිතයෙන් අධ්‍යයනය කෙරිණි. එහිදී වෙළෙඳ දැන්වීම් පුවරු, මාර්ග නාම පුවරු හා රාජ්‍ය ආයතනවල නාම පුවරු ඡායාරූපගත කළ අතර අදාළ දත්ත නියැදියේ ඡායාරූප 272ක් අන්තර්ගතය. එම ඡායාරූප නැවත ඒකභාෂක, ද්විභාෂක, ත්‍රෛභාෂක හෝ බහුභාෂක ලෙස වර්ග කරන ලදී. ඉන් අනතුරුව බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ හා බදුල්ල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ ජන හා සංඛ්‍යාලේඛන දත්ත ලබා ගත් අතර සිංහල, ශ්‍රී ලංකා දෙමළ, ඉන්දියානු දෙමළ, ශ්‍රී ලංකා මුවර් (මුස්ලිම්) සහ බර්ගර් යන ජන වර්ගවල ප්‍රමාණ වෙන වෙනම දත්ත ගොනුවට ඇතුළත් කෙරිණි. ඉහත ඡායාරූප වර්ගීකරණ දත්ත හා ජන හා සංඛ්‍යාලේඛන දත්ත SPSS පරිගණක මෘදුකාංගය හා Microsoft Excel මගින් විශ්ලේෂණය කෙරිණි. එම විශ්ලේෂිත දත්ත මත පදනම්ව අදාළ කලාපයේ භාෂා භූදර්ශනය අධ්‍යයනය කෙරිණි. එහිදී ලබා ගත් ඡායාරූප 272ක් වන දෘශ්‍ය සංඥාවලින් 42%ක් සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂාත්‍රයම යෙදූ දෘශ්‍ය සංඥාය. දෙවන ප්‍රමුඛතාව හිමිව ඇත්තේ ඉංග්‍රීසි භාෂාව පමණක් යෙදූ දෘශ්‍ය සංඥාවලට වන අතර එය 37%කි. ඒවා සියල්ල පෞද්ගලික ව්‍යාපාරික ස්ථානවල දෘශ්‍ය සංඥාය. මේ ප්‍රදේශයේ බහුතර ජනගහනය සිංහල හා දෙමළ භාෂකයන් වුවද එම භාෂා ද්වයයම පමණක් යෙදී ඇත්තේ 2%ක අඩු ප්‍රමාණයකි. දෙමළ භාෂාව පමණක් ඇති සංඥා දක්නට නොලැබීමද විශේෂිතය. සිංහල හා ඉංග්‍රීසි භාෂා පමණක් 13%ක යෙදී ඇත. බහුතර ජනතාවක් කතා කරන සිංහල භාෂාව යෙදී ඇත්තේ 5%ක තරම් ඉතා අඩු ප්‍රතිශතයකි. අරාබි භාෂාව ප්‍රමුඛව සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා යෙදුණු දෘශ්‍ය සංඥාවක්ද සොයා ගන්නා ලදී. ඒ අනුව බදුල්ල නගරය බහුභාෂක, බහුවාර්ගික, බහුසංස්කෘතික ප්‍රදේශයක් බවත් එය එම ප්‍රදේශයේ දෘශ්‍ය සංඥාවලින් නිරූපිත බවත් සියලු රාජ්‍ය ආයතන හා මාර්ග නාම පුවරු ආදිය රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය මත

1. ස්වාධීන පර්යේෂක, බ/වැල්ලෙවලතැන්න විද්‍යාලය

ක්‍රියාත්මක වන බවත් විශද වේ. ඉංග්‍රීසි භාෂාව නිල නොලත් අයුරින් බලයක් අත්පත් කරගනිමින් සිටිනා බවද පැහැදිලිය.

**මුඛ්‍ය පද :** භාෂා භූ දර්ශනය, දෘශ්‍ය සංඥා, බහුභාෂකත්වය, බහුසංස්කෘතිකතාව, රාජ්‍ය භාෂා

# සිංහල සාහිත්‍ය විචාරයෙන් පිළිබිඹු වන ධ්වනි සහ ගුණ-රීති සංකල්ප පිළිබඳ විමර්ශනයක්

එච්.ඩබ්.බී.අයි. සම්පත්[1]

**සාරසංක්ෂේපය**

අනුරාධපුර යුගයේ සිට ම සිංහල සාහිත්‍ය විචාරය ගොඩනැඟී ඇත්තේ සංස්කෘත සාහිත්‍ය විචාර සිද්ධාන්ත පදනම් කොට ගනිමිනි. රස වාදය හා අලංකාර වාදය ප්‍රාථමික සංස්කෘත විචාර වාද වන අතර ඒවායේ ද්විතීයික අවස්ථාව වශයෙන් ධ්වනි හා ගුණ-රීති යන විචාර වාද ද, තෘතීයික අවස්ථාව වශයෙන් ඖචිත්‍ය හා වක්‍රෝක්ති යන විචාර වාද ද සැලකිය හැකි වේ. අලංකාර වාදයට අනුගත ග්‍රන්ථයක් ලෙස සැලකෙන කාව්‍යාදර්ශය, සියබස්ලකර නමින් සිංහලයට නැඟුණ ද ද්විතීයික හෝ තෘතීයික මට්ටමේ කෘති කිසිවක් මුල් යුගවල දී ඒ ආකාරයෙන් සිංහලයට නැඟී තිබුණේ නැත. ආරම්භක යුගයේ සිට ධ්වනි සහ ගුණ-රීති යන සංකල්ප සිංහල සාහිත්‍ය විචාර ක්ෂේත්‍රය තුළ පිළිබිඹු වන්නේ කවරාකාරයෙන් ද යන පර්යේෂණ ගැටලුවට අදාළ ව ගුණාත්මක පර්යේෂණ විධික්‍රමය යටතේ ග්‍රන්ථ පරිශීලනය කරමින් අධ්‍යයනය සිදු කරන ලදී. මෙම පර්යේෂණයේ දී කාව්‍යාදර්ශය, ධ්වන්‍යාලෝකය, කාව්‍යාලංකාර සූත්‍ර වැනි සංස්කෘත මූල ග්‍රන්ථ සහ සියබස්ලකර, සිදත් සඟරාව ඇතුළු සිංහල මූල ග්‍රන්ථ ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ද මාර්ටින් වික්‍රමසිංහ, යක්කඩුවේ ප්‍රඥාරාම හිමි, එදිරිවීර සරච්චන්ද්‍ර, ඊ.එම්.ජී. සිරිමාන්න, හේන්පිටගෙදර ඥානසීහ හිමි, ජී.එස්.බී. සේනානායක, කිවුලේගෙදර නාරද හිමි, ආනන්ද අබේසිරිවර්ධන වැනි මෑත කාලීන උගතුන්ගේ පොත්-පත්, ලිපි ලේඛන ආදිය ද්විතීයික මූලාශ්‍රය වශයෙන් ද අධ්‍යයනය කෙරේ. ධ්වනි සහ ගුණ-රීති පිළිබඳ පැරණිතම සිංහල විග්‍රහයන් සියබස්ලකරින් විද්‍යමාන වන අතර සිදත් සඟරාවෙන් ද ඊට සම්බන්ධ අදහස් සමහරක් ඉදිරිපත් වනු දැක ගත හැකි වේ. ධ්වනිවාදය මත පදනම් වූ ප්‍රායෝගික විචාරය ඊ.එම්.ජී. සිරිමාන්න විසින් සිංහල විචාර ක්ෂේත්‍රයට හඳුන්වා දෙනු ලැබීමත්, ජී.එස්.බී. සේනානායක විසින් ධ්වන්‍යාලෝකය සිංහල භාෂාවෙන් විවරණය කරනු ලැබීමත්, ආනන්ද කුලසූරිය විසින් කාව්‍යාලංකාර සූත්‍ර කෘතිය සිංහලයට නඟනු ලැබීමත් 1960 ගණන්වල දී සිදු විය. මෙම විචාරවාද පිළිබඳ ව සිදු කෙරුණු, උපාධි මට්ටමේ සහ පශ්චාද් උපාධි මට්ටමේ පර්යේෂණ කිහිපයක් ද සිංහල භාෂාවෙන් පළ ව තිබේ. යක්කඩුවේ හිමි, මාර්ටින් වික්‍රමසිංහ වැනි වියතුන් ඔවුන්ගේ විචාර කාර්යයන්හි දී ප්‍රායෝගික වශයෙන් මෙම සිද්ධාන්ත උපයෝගී කොට ගෙන තිබේ. සිංහල සාහිත්‍ය විචාරයේ අනන්‍යතාවන්ට තුඩු දෙන සේ මෙම විචාර සංකල්ප යොදා ගෙන ඇති ආකාරය පිළිබඳ ව ද මෙම පර්යේෂණයේ දී අවධානය යොමු කෙරේ.

**මුඛ්‍ය පද :** ධ්වනි, ගුණ, රීති, සියබස්ලකර, සිංහල සාහිත්‍ය විචාරය

1. මහාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
bihesh@gmail.com

# ථෙරී ගාථා පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අධ්‍යයනයක්

නදීකා සඳමාලි පීරිස්[1]

**සාරසංක්ෂේපය**

ස්ත්‍රී පුරුෂ ජීව විද්‍යාත්මක වෙනස මෙන් ම, සමාජයෙහි එම දෙපක්ෂයට හිමි සමාජ තත්ත්වය මත ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංකල්පය හඳුනා ගෙන තිබෙන අතර, මනෝ විද්‍යාත්මක හා සංස්කෘතික ගම්‍යයක් සහිත යෙදුමක් ලෙස ද වැදගත් වේ. සමාජය ස්ත්‍රී පුරුෂ සමාජභාවී වශයෙන් විසම ගති පැවතුම් ආරෝපණය කර ඇති ලෙසින් 'ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකා' ඔවුන්ට ආරෝපණය කර දී තිබේ. පුරාතනයේ සිට ස්ත්‍රිය හා පුරුෂයා අතර වෙනස් සමාජ භූමිකා හා සමාජ තත්ත්ව ප්‍රතිනිර්මාණය කරමින් ස්ත්‍රිය පුරුෂයාට වඩා ද්විතීයික තත්ත්වයකට හෙළීම දක්නට ලැබුණි. භාරතීය බ්‍රාහ්මණ සමාජයෙහි ස්ත්‍රියට අධ්‍යාපනය ලැබීම පවා අහිමි කර තිබුණු අතර, කාන්තාවන්ගේ සාක්ෂි ද නීතියෙන් පිළි නොගත්තේ ය. ගෞතම බුද්ධත්වයෙන් පසු ව බ්‍රාහ්මණ සමාජයේ පැවති මෙම දුර්භාග්‍ය තත්ත්වය යම් ප්‍රමාණයකට අවම වුව ද, ඒවා සම්පූර්ණයෙන් ම සමාජයෙන් ඉවත් නොවුණු බව සූත්‍ර පිටකයෙහි, ඛුද්දක නිකායේ ඇතුළත් ථෙරී ගාථාවන්ගෙන් පැහැදිලි වේ. ගෘහ ජීවිතයෙන් මිදී භික්ෂුණී ශාසනයට ඇතුළත් ව විමුක්ති මාර්ගය සාක්ෂාත් කර ගත් පසු ඉන් සන්තුෂ්ටියට පත් වූ අයුරු මෙම ථෙරී ගාථාවලින් ප්‍රකාශ වුණි. එහෙත් ඒ අව්‍යාජ සතුට සමඟ සිහි කරන තමන් පෙර අත් විඳි දුක් ගැහැට හා විවිධ අභියෝග තත් යුගයේ ස්ත්‍රීන් සමාජය හා පවුල තුළ දී මුහුණ දුන් අසාධාරණ, හිංසන අනාවරණය කරන අතර, එම ස්ත්‍රී පුරුෂ චරිත පිළිබඳ විමසා බැලීම පර්යේෂණයේ අරමුණ යි. ථෙරී ගාථාවලින් නිරූපිත බුද්ධකාලීන භාරත සමාජයේ ස්ත්‍රී පුරුෂ චරිත ඇසුරෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංකල්පය නිරූපණය වන්නේ කෙසේ ද? යන ගැටලුවට අදාළ ව මෙම පර්යේෂණය සිදු කෙරෙන අතර, ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමය යටතේ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය දත්ත, පුස්තකාල පරිශීලනය හා අන්තර්ජාලය මගින් එක් රැස් කර පයීත විශ්ලේෂණය කිරීම සිදු කෙරෙයි. ථෙරී ගාථා නිපාත දහසයෙන් ථෙරී ගාථා කථා වස්තු දහයකට පමණක් අධ්‍යයනය සීමා වන අතර, තත් යුගයේ සමාජ තත්ත්වය අනුව ස්ත්‍රී පුරුෂ චරිතවල ස්වභාවය හඳුනා ගැනීම හා ස්ත්‍රී භූමිකාවට ප්‍රමුඛස්ථානයක් ලබා දෙමින් ථෙරී ගාථා රචනා වී ඇති බව ප්‍රතීයමාන වෙයි.

**මුඛ්‍ය පද :** ථෙරී ගාථා, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ස්ත්‍රී චරිත, පුරුෂ චරිත

1. ආධුනික කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, රුහුණු විශ්වවිද්‍යාලය
nadeeka.pieris@yahoo.com

# Symbolic Representation and Character Portrayal of the Elephant (*Hasti*) in Buddhist Art: Literary Investigation with Reference to the *Nālāgiri-damana* Story in the *Butsaraṇa*

Anuda Kanchana[1]

**Abstract**

Elephant (*Hasti*) symbolism is common in South Asian Art, and historically the use of the elephant symbol dates back to Mesopotamian and Indo Valley civilizations. Based on the *Vedic-purana*-s influence, the *Hasti* art-symbol was represented in the Buddhist art corresponding the Buddhist impact. The *Hasti* symbol was developed based on Buddhist literary works and art, while the mythological and narrative features nourished the stories associated with the elephant as a character in literature. Especially in Buddhist literature, human characteristics were attributed to the *Hasti* character and it was communicated to society through the *Jātaka* stories and Buddhist literature. The *Nālāgiri-damana* story of *Butsaraṇa* is one of the selected references to investigate the character portrayal of the Elephant in Sinhala literature. Although the *Nālāgiri* incident depiction in *Butsaraṇa* has been discussed only from literary and linguistic aspects, the character portrayal of *Nālāgiri* and the use of elephant symbols in Buddhist art have not been comparatively discussed before. What are the compatibilities of the symbolic representation and the character portrayal of the elephant (*Hasti*) in Buddhist art? Based on the research problem, the main objective of this study is to investigate the demeanor of the *Nālāgiri* and its character portrayal. *Nālāgiri-damana-kathā* is the main literary source of this study and Asian Buddhist antiquities are used to investigate the *Hasti* symbol. Textual and contextual analysis is used as the main method to study the text and *Hasti* symbols have been comparatively studied with Pali and Sanskrit Buddhist literature. The *Hasti* symbol is also commonly used as a divine or demonical symbol, an omen of a good sign, a protector, and also to indicate directions. In the Buddhist Arts, the features of the *Hasti* symbol represent spiritual virtues. The story of *Nālāgiri-damana* reveals the transformation of some ungodly character traits into spiritual virtues. Here, the writer consciously or unconsciously manipulated the character of *Nālāgiri* through the language, representing the real portrayal and symbolic interpretations of the *Hasti* in Buddhist art and narrations in the Asian context.

**Keywords:** *Buddhist Arts and Literature, Character Portrayal, Hasti symbol, Nālāgiri-damana, Symbolic Representation*

1. Lecturer (Probationary), Department of Pali and Buddhist Studies, University of Ruhunu
anuda@pbs.ruh.ac.lk

# පුස්කොළ පොත්වල අන්තර්ගත ලේඛන සහ ශිල්පීය විධික්‍රම පිළිබඳ විමර්ශනයක්

## (මාතලේ සහ මහනුවර ප්‍රදේශවල තෝරාගත් පුස්කොළ පොත් ඇසුරෙන්)

දීපාංජනී ඇල්ලෙපොළ[1]

**සාරසංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ ලේඛන කලාව කෙරෙහි අවධානය යොමු කිරීමේදී පුස්කොළ පොත් ලේඛන සම්ප්‍රදාය යනු සාහිත්‍යමය, භාෂාමය සහ පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත මූලාශ්‍රයකි. තල ගසේ පත්‍ර උපයෝගි කර ගෙන පුස්කොළ පොත් නිර්මාණය සහ ඒවායෙහි ලේඛනගත කිරීමේ කාර්යය අද්‍යතන යුගයේ ක්‍රමයෙන් අභාවයට යමින් පවතී. එහෙත් මෙකී ලේඛන උරුමයෙහි බහුවිෂයමය හා සංස්කෘතික දැනුම් සම්භාරයක් අන්තර්ගත වී ඇත. ඒ අනුව මාතලේ සහ මහනුවර ප්‍රදේශවල ඇති දළදා මාලිගාව, කුළුගම්මන විහාරය, මැණික්හින්න විහාරය, මාතලේ අළුවිහාරය, කවටයාමුණ විහාරය, පල්ලෙගනේ පොත්ගුල් විහාරය ආදි ස්ථානවල සහ පෞද්ගලික තැන්පත් කිහිපයක පුස්කොළ පොත් ආශ්‍රයෙන් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. පුස්කොළ ලේඛනයේදී භාවිත කළ ලේඛන සහ ශිල්පීය විධික්‍රම මොනවාද? යන පර්යේෂණ ගැටලුවට අදාළව පුස්කොළ ලේඛන සම්ප්‍රදායට ආවේණික ලේඛන විධික්‍රම හඳුනා ගැනීම සහ ඒ පිළිබඳ ශාස්ත්‍රීය සහ ගුණාත්මක පර්යේෂණ සඳහා විද්වත් අවධානය යොමු කිරීමේ අවශ්‍යතාව අරමුණු කරගනිමින් පර්යේෂණය සිදු කෙරිණි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ ලිඛිත මූලාශ්‍රය සහ සහභාගිත්ව නිරීක්ෂණ විධික්‍රමය යටතේ තෝරාගත් අධ්‍යයන ප්‍රදේශයට අදාළ පුස්කොළ පොත් දෙසියයක පමණ සහේතුක නියැදියක් අධ්‍යයනයට යොදා ගන්නා ලදී. ඒ අනුව මෙම සම්ප්‍රදායික ලේඛනයේදී ප්‍රාදේශීය වෙනස්කම්, සංස්කෘතික උපභාෂා සහ විවිධතා, ලේඛකයාගේ ශිල්පීය හැකියාව ආදි කරුණු නිසා පුස්කොළ පෘෂ්ඨය මත ලේඛනය කිරීමේදී විවිධ ලේඛන විධික්‍රම භාවිත වී ඇති බව අධ්‍යයනයේදී හඳුනාගත හැකි විය. ඒ අනුව ඉඩ සැලසුම් කිරීම, ලේඛනය හැසිරවීමේ පහසුව, විෂය කරුණු රහස් වශයෙන් සටහන් කිරීම, අන්තර්ගත කරුණු සංක්ෂිප්ත කර දැක්වීම, භාෂාව සහ අක්ෂර හැසිරවීමේ විධික්‍රම ආදිය හඳුනාගත හැකිවිය. එකී විධික්‍රමයන්ට අනුව සම්මත ප්‍රමාණයට ලිවීම, කුණ්ඩලය භාවිතය, පෙයියාලම යෙදීම, ඡේද සහ වගන්ති ලිවීමේදී භාවිත කළ ක්‍රම, ප්‍රාර්ථනා වැකි ලිවීම, පත්තිරු අංකනය, කර්තෘ අනන්‍යතාව, කාලය දැක්වීමේ ක්‍රම සහ ලිත් හෝඩිය භාවිතය මෙම අධ්‍යයනයේදී හඳුනාගත් ශිල්පීය විධික්‍රම අතර වේ. වර්තමානය වන විට තොරතුරු පැහැදිලිව ඉදිරිපත් කිරීම සඳහා විවිධ ලේඛන පෘෂ්ඨ පහසුවෙන් යොදා ගත හැකි වීම නිසාත් පුස්කොළ පොත් සඳහා අවශ්‍ය තාල පත්‍ර පහසුවෙන්

1. පර්යේෂණ නිලධාරි, පුරාවිද්‍යා කාර්යාලය, බදුල්ල
deepanjaneee@gmail.com

සකසා ගැනීමට නොහැකි වීම නිසාත් අභාවයට යන මෙම ලේඛන ක්‍රමය කෙරෙහි අවධානය යොමු කිරීම කාලෝචිත බව සඳහන් කළ යුතුය.

**මුඛ්‍ය පද :** පුස්කොළ පොත්, ශිල්පීය විධික්‍රම, ලේඛන විධික්‍රම, මාතලේ, මහනුවර

# සීගිරි ගීයක් ඇසුරෙන් 'වැට්කොළ මල් සහ සීගිරි ළඳුන්'

සුදේවි රණසිංහ[1]

**සාරසංක්ෂේපය**

ක්‍රිස්තු වර්ෂ පස්වැනි සියවසේ සීගිරි පර්වතය කේන්ද්‍ර කොට ගෙන ප්‍රභවය වූ සීගිරි නගරය වර්තමානයේදීත් ලෝක ප්‍රකට වීමට එහි ඇඳි සිතුවම් හේතු වී ඇත. පැරණි සීගිරි නගරය සහ එහි භාවිතය පිළිබඳ දැනට ප්‍රමාණවත් අධ්‍යයන සිදු කර ඇති අතර ඉන් බොහෝමයක් අර්ථකථන, ප්‍රකට සීගිරි බිතුසිතුවම්වලින් නිරූපණය කරන කාන්තාවන් පිළිබඳවය. සීගිරි ගලේ ඉහළින් ඇති ගල් කෙවෙණි ඇතුළත බිත්තිවල උඩු කය පමණක් දක්වෙන කාන්තා රූප විශාල ප්‍රමාණයක් තිබුණ බව සඳහන්ව තිබුණද පසුකාලීනව ඒවා විනාශ වී ගොසිනි. එකල සීගිරි චිත්‍ර නැරඹීමට සිව් දෙසින් පැමිණි ජනයා ඒවා පිළිබඳ තම සිත් සතන්හි උපන් භාවාත්මක සිතිවිලි කුරුටු ගී ලෙසින් කැටපත් පවුරෙහි සටහන් කළහ. මේ ගීවල සෞන්දර්යාත්මක අගය මෙන්ම ඒවායෙන් ප්‍රකට වන සමකාලීන සමාජීය, සංස්කෘතික හා ආර්ථික කරුණු ඉතිහාසය හැදෑරීමේ දී වැදගත් තැනක් ගනී. සීගිරි ගී අතර පහත සඳහන් කවිය මහාචාර්ය සෙනරත් පරණවිතාන කියවා අර්ථ දක්වා ඇත්තේ සීගිරි කවියේ සඳහන් කළු සහ කහ ඡවි වර්ණයෙන් යුත් සීගිරි ළඳුන්, නිල් කටරොළු මලක පැටලී ගිය වැටකොළු මලකට උපමා කරමිනි.

> ස්වස්ති ! අග්බොය්මි ලීමි !
> නිල්ක(ට්)රොළ මලෙකැ ඇවුණු වැට්කොළ මල සෙය්
> සැඳැගැ සිහි වෙන්නෙය් මහනෙල්වන (හ)ය් රන්වන හුන් ( සීගිරි ගී : 334)

උක්ත සීගිරි ගීය සහ ඒ සඳහා සෙනරත් පරණවිතාන ඉදිරිපත් කළ අර්ථය පිළිබඳ සාවධාන වෙමින් විශේෂයෙන් ඒ සම්බන්ධයෙන් පුරාඋද්භිද විද්‍යාත්මකව සාකච්ඡා කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. පෝෂණ ගුණයෙන් අනූන නියං වැටකොළු එළවළුවක් වශයෙන් නැවත ජනතාව අතර ප්‍රචලිත කිරීම කාලීන අවශ්‍යතාවක් බව පෙන්වා දීම ද මෙම පත්‍රිකාවේ අනු අරමුණකි. සීගිරි කවියාගේ උපමාවෙහි දක්වෙන වැටකොලු මල් අද අප දකින දාර සහිත වැටකොළු (*Luffa acutangula*) වැලෙහි හටගන්නා මල ද? යන පර්යේෂණ ගැටලුවට අදාළ ව පුරාවිද්‍යාව, පුරාඋද්භිදවිද්‍යාව, ප්‍රවේණි විද්‍යාව, ශාක භූගෝල විද්‍යාව සහ වාග් විද්‍යාව යන විෂයයන් කෙරෙහි අවධානය යොමු කරමින් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ ග්‍රන්ථ පරිශීලනය කරමින් මෙම අධ්‍යයනය සිදු කෙරිණි. ඒ අනුව මෙම ගීයෙන් අර්ථවත් වන්නේ දාර සහිත වැටකොළු (*Luffa acutangula*) වැල්වල හටගන්නා මල් නොව

1. පර්යේෂණ නිලධාරි, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
sudeviranasinghe@ymail.com

නියං වැටකොළු (*Luffa cylindrica*) මල් බවට අදහසක් ඉදිරිපත් කිරීම මෙම පර්යේෂණයෙන් සිදු කෙරේ.

**මුඛ්‍ය පදඃ** සීගිරි ගී, සීගිරි චිත්‍ර, වැට්කොළ මල්, දාර වැටකොළු, නියං වැටකොළු

# කෝට්ටේ පද්‍ය සාහිත්‍යයෙන් හෙළි කෙරෙන විශ්වාස හා ඇදහිලි පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එම්.ජේ. නදීශා සඳමාලී[1]


**සාරසංක්ෂේපය**

සම්භාව්‍ය සිංහල පද්‍ය සාහිත්‍යය නවතාවන්ගෙන් සුපෝෂණය වෙමින් යුග ගණනාවක් තුළ මානව සුසංවාදීව ගොඩ නැගී පැවතීම දැකිය හැකිය. ඒ අනුව සම්භාව්‍ය සිංහල පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය වන කෝට්ටේ යුගයට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. සමාජ සාහිත්‍යික දෘෂ්ටිකෝණමය වශයෙන් මේ යුගය දෙස බලන කල සිංහල ජන සංස්කෘතික ජීවිතයේ විශ්වාස හා ඇදහිලි විශ්වාස කරමින්, එය ආරක්ෂා කරමින් සංස්කෘතික සභ්‍යත්වය කියා පාමින් ගෙවූ සරල ජන ජීවිතයක පිළිබිඹුව කෝට්ටේ සමයේ රචිත පද්‍ය කෘති මගින් ස්ඵුට කෙරේ. ඒ අනුව එකල ශ්‍රී ලාංකේය වැසියාගේ සමාජ, සංස්කෘතික ජීවිතයේ ස්වරූපය, හැඩය අවබෝධ කර ගැනීමට ඔවුන් උරුම කොට ගත් විශ්වාස හා ඇදහිලි පිළිබඳ අධ්‍යයනයක් සිදු කර, සාහිත්‍ය රුචිකත්වය, සිංහල සමාජ සංස්කෘතික අනන්‍යතාව සහ සභ්‍යත්වය පිළිබඳ හැඟීම් ඇති කිරීම උදෙසා උත්තේජනයක් ඇති කිරීම අරමුණ විය. එබැවින් 'කෝට්ටේ පද්‍ය සාහිත්‍යයෙන් හෙළි කෙරෙන විශ්වාස හා ඇදහිලි පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්' යන පර්යේෂණය සිදු කරන ලදී. ඒ සමයේ රචනා වූ ජාතක කතා කාව්‍ය වන කාව්‍යශේඛරය සහ ගුත්තිල කාව්‍යය මූලික කොට ගනිමින් උක්ත තේමාව විමර්ශනාත්මකව අධ්‍යයනය කෙරිණි. පෙරදිග රටක් වශයෙන් ශ්‍රී ලංකා සමාජය බුදු දහමේ ස්පර්ශයත් සමඟ යම් ශික්ෂණයක්, අනන්‍යතාවක් ඓතිහාසික වශයෙන් ගොඩ නගා ගත් බව පෙනේ. සම්භාව්‍ය පද්‍ය සාහිත්‍යය යන පර්යේෂණ ක්ෂේත්‍රය තුළදී මෙම පර්යේෂණයට අදාළ දත්ත රැස් කිරීම සඳහා ගුණාත්මක පර්යේෂණ විධික්‍රමය යටතේ ග්‍රන්ථ පරිශීලනය යොදා ගන්නා ලදී. එමගින් එක්රැස් කර ගත් දත්ත මත පදනම් වෙමින් තර්ක ගොඩ නැගීම මෙම අධ්‍යයනය සඳහා භාවිත කළ ක්‍රමවේදාත්මක පසුබිමයි. ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය උපයෝගී කර ගනිමින් ප්‍රස්තුත පර්යේෂණය සඳහා ආධාර සැපයෙන මූලධාර්මික කරුණු තහවුරු කර ගැනීමට උත්සාහ දරන ලදී. ඒ අනුව එම ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍රයගත තොරතුරු මෙහිදී විශ්ලේෂණයට භාජනය විය.


**මුඛ්‍ය පද:** කෝට්ටේ යුගය, විශ්වාස හා ඇදහිලි, ගුත්තිල කාව්‍ය, කාව්‍යශේඛරය.

1. හිටපු සහකාර කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය
mjnsandamali@gmail.com

# උපමාලංකාර පොදුජන අත්දැකීම් කෙරෙහි දක්වන සංවේදීතාව පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් : සද්ධර්මාලංකාරය සහ මයූර සන්දේශය ඇසුරෙන්

පසන් පාදුක්කගේ[1]

**සාරසංක්ෂේපය**

ගම්පොළ යුගය සම්භාව්‍ය සිංහල සාහිත්‍යයේ සුවිශේෂී අනන්‍යතාවක් සනිටුහන් කරයි. සාහිත්‍යකරුවන් ස්වකීය නිර්මාණවල අර්ථ රස උද්දීපන කාර්යය සඳහා පොදුවේ භාවිත කරන අලංකාර ප්‍රවර්ගයක් වන්නේ උපමාලංකාරයයි. උපමාලංකාරය තුළ එක් ප්‍රපංචයක් තවත් ප්‍රපංචයක් හා සමපාත කිරීමත්, එමගින් සහෘදයා තුළ රසයක් ජනනය කිරීමත් සිදුවේ. සැම විට ම පොදු ජන සමාජය ඇසුරෙන් අත්දැකීම් ලබා ගන්නා නිර්මාණකරුවා භාවිත කරන උපමාලංකාර ද පොදුජන සමාජයට සමීප ය. පොදුජන අත්දැකීම් කෙරෙහි සමීප නොවන නිර්මාණාත්මක අදහස් සාහිත්‍ය නිර්මාණයක් තුළ අන්තර්ගත වීම එහි ජනකාන්ත භාවයට පැහැදිලි බලපෑමක් ඇති කරයි. මෙම පසුබිම මත රැඳී සිටිමින් ගම්පොළ යුගයේ රචිත මයූර සන්දේශය සහ සද්ධර්මාලංකාරයේ හමු වන උපමාලංකාර තුලනාත්මකව අධ්‍යයනය කරමින් ඒවා කොතෙක් දුරට සාමාන්‍ය පොදුජන අත්දැකීම් සමඟ සමපාත වන්නේදැයි විමසා බැලීම සිදු කෙරිණි. පර්යේෂණ ගැටලු වශයෙන්, ගම්පොළ යුගයේ සිංහල ගද්‍ය සාහිත්‍යයේ හමු වන උපමාලංකාර පොදුජන අත්දැකීම් හා සමපාත වන්නේ කෙසේද යන්නත් ගම්පොළ යුගයේ සිංහල පද්‍ය සාහිත්‍යයේ හමු වන උපමාලංකාර පොදුජන අත්දැකීම් සමඟ සමපාත වන්නේ කෙසේද යන්නත් යොදා ගැනුණි. උක්ත පර්යේෂණ ගැටලු විසඳීම සඳහා සිදු කෙරුණු මෙම පර්යේෂණයේ අරමුණු ලෙස මයූර සන්දේශයෙහි හා සද්ධර්මාලංකාරයේ අර්ථ රස භූෂණය සඳහා උපමාලංකාර භාවිත කළ ආකාරය විමසා බැලීම, එකී උපමාලංකාරයන්හී යොදා ගැනෙන සංකල්ප, වස්තු, සිදුවීම් කොතෙක් දුරට සාමාන්‍ය පොදුජන අත්දැකීම් සමඟ සමපාත වන්නේ දැයි සාකච්ඡා කිරීම, මයූර සන්දේශය හා සද්ධර්මාලංකාරය සිංහල සහෘද සමාජය වෙත සමීප වීම උදෙසා ඒවායෙහි උපයුක්ත කරගත් උපමාලංකාර සාධනීය හෝ නිෂේධනීය බලපෑමක් කරන්නේ ද යන්න විමසා බැලීමත් යොදා ගැනුණි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ මයූර සන්දේශයත්, සද්ධර්මාලංකාරයත් ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් භාවිත කළ අතර පර්යේෂණ කාර්යය සඳහා දත්ත ඒකරාශි කර ගැනීමේ දී පුස්තකාල විමර්ශන විධික්‍රමය යොදා ගන්නා ලදී. ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය මගින් ලබා ගත් දත්ත විශ්ලේෂණාත්මක ව අධ්‍යයනය කළ අතර සමාජීය සාහිත්‍ය අධ්‍යයන න්‍යාය ඔස්සේ විමර්ශනය කෙරුණි. සම්භාව්‍ය සිංහල ගද්‍ය සාහිත්‍යයට අයත් සද්ධර්මාලංකාරය තුළ යොදා ගැනෙන උපමාලංකාර පොදුජන අත්දැකීම් කෙරෙහි වැඩි සමීපතාවක් දක්වන බවත්, එයට සාපේක්ෂ ව සම්භාව්‍ය සිංහල පද්‍ය

1. සහකාර කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

ppchamara96@gmail.com

සාහිත්‍යයට අයත් මයූර සන්දේශය තුළ යොදා ගැනෙන උපමාලංකාර පොදුජන අත්දැකීම් කෙරෙන් දුරස්ථ ස්වභාවයක් ගන්නා බවත් උක්ත පර්යේෂණ කාර්යය මගින් නිගමනය කෙරුණු අතර සාහිත්‍ය නිර්මාණ සඳහා සමාජය බලපාන අතර ම සාහිත්‍ය සමාජගත වීම සඳහා නිර්මාණකරුවා තුළ සූක්ෂ්ම සමාජ අවබෝධයක් පැවතිය යුතු බවත් නිගමනය කෙරුණි.

**මුඛ්‍ය පදඃ** ගම්පොළ යුගය, උපමාලංකාර, පොදුජන අත්දැකීම්, මයූර සන්දේශය, සද්ධර්මාලංකාරය

# වීදාගම මෛත්‍රෙය මාහිමි ලෝවැඩ සඟරාව යළි සංස්කරණය කිරීම පිළිබඳව පර්යේෂණාත්මක අධ්‍යයනයක්

එම්. කේ. සුසන්ත සේනාධිලංකාර[1]

**සාරසංක්ෂේපය**

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ යුගයෙහි ප්‍රකට පාලකයා වශයෙන් කටයුතු කළ හයවන පැරකුම්බා රජතුමාගේ රාජ්‍ය පාලන සමයේදී මෙරට භාෂා සාහිත්‍යයෙහි අභිවෘද්ධිය ඇති විය. ඒ සඳහා රටේ පැවති යහපත් දේශපාලන වාතාවරණය සහ ආර්ථික සංවර්ධනය හේතුවිය. වීදාගම මෛත්‍රෙය මාහිමි, තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමි, ධම්මදින්නාචරිය සිද්ධාර්ථ විමලකීර්ති මාහිමි, වෑත්තෑවේ හිමි, තිලක පිරුවන් හිමි, නන්නුරු තුනයා යනාදි ලේඛකයෝ මෙකල සාහිත්‍යකරණයෙහි නියුක්තව සිටියහ. එයින් බොහෝ දෙනෙක් සංස්කෘත අලංකාර රීතිවලට අනුගතව කාව්‍ය සම්පාදනය කළහ. වීදාගම මෛත්‍රෙය මාහිමියෝ අලංකාරවලට වහල් නොවී කාව්‍ය සම්පාදනය කළහ. මේ වන විට සොයා ගෙන ඇති මුල්ම සිංහල උපදේශ සාහිත්‍ය ග්‍රන්ථය වන ලෝවැඩ සඟරාව උන්වහන්සේ විසින් තරුණ වියේදී රචනා කරන ලදී. මහනෙත්පාමුළ අධිපති බවට පත්වීමෙන් පසුව උන්වහන්සේ ඒ බව සඳහන් කරමින් ලෝවැඩ සඟරාව යළි සංස්කරණය කළහ. ඒ බව අනාවරණය කිරීමත්, කාව්‍ය නිර්මාණය කිරීම සඳහා යොදා ගත් මූලාශ්‍රය මොනවාද යන්න අනාවරණය කිරීමත් මෙම පර්යේෂණයෙහි අරමුණු අතර වෙයි. විදාගම මෛත්‍රෙය හිමියන් විසින්ම සිදු කරන ලද ලෝවැඩ සඟරා සංස්කරණය බොහෝ කාලයක් යටපත් වී තිබීමට හේතු මොනවාද යන්න සොය බැලීමත් මෙහි පර්යේෂණ ගැටලුවයි. මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් පුස්කොළ පිටපත් 11ක් යොදා ගන්නා ලදී. පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් පුස්කොළ පිටපත් 6ක්ද, ජාතික කෞතුකාගාර පුස්තකාලයෙන් පුස්කොළ පිටපත් 3ක් ද, රත්නපුර ඇලපාත, ගිනිහිරිය විහාරයෙන් පුස්කොළ පිටපතක්ද, මාතර පොල්හේන, පදුමාරාම විහාරයෙන් පුස්කොළ පිටපත්ද වශයෙන් ප්‍රාථමික මූලාශ්‍රය 11ක් භාවිත කෙරේ. එමෙන්ම ද්විතීයික මූලාශ්‍රය වශයෙන් ලෝවැඩ සඟරා සංස්කරණ 8ක්ද ත්‍රිපිටක ග්‍රන්ථ ද  අටුවා ග්‍රන්ථ ද වෙනත් බොහෝ ග්‍රන්ථ ද අධ්‍යයනය කරමින් කරුණු අනාවරණය කිරීම මෙහි පර්යේෂණ ක්‍රමවේදයයි. තරුණ හිමි නමක් ලෙස සිටියදී වීදාගම මෛත්‍රෙය හිමියන් විසින් ලියන ලද ලෝවැඩසඟරාව, මහනෙත්පාමුළ අධිපතිබවට පත්වීමෙන් පසු යළි සංස්කරණය කරන ලද බව මෙම පර්යේෂණයෙන් නිගමනය කිරීමට නියමිතය.

**මුඛ්‍ය පද :** වීදාගම මෛත්‍රෙය හිමි, මහනෙත්පාමුළ මහ යති, උපදේශ සාහිත්‍යය, පුස්කොළ පිටපත්, ත්‍රිපිටකය

1. භාෂා පර්යේෂක, නො.60/1 ඒ, ශ්‍රී ජින මාවත, කෙසෙල්වත්ත, පානදුර.
senadhi.lankara@gmail.com

# ජාතක අටුවාවේ අන්තර්ගත කථා නාම සිංහලයට නැගීමේ දී දක්වූ සුවිශේෂතා පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

එම්. කේ. සුසන්ත සේනාධිලංකාර[1]

**සාරසංක්ෂේපය**

'ජාතක' යන වචනය තුළ ඇති අරුත් අතර 'උත්පත්තිය' යන අරුත ලැබේ. ඒ අනුව ගෞතම බෝධිසත්ත්වයන් වහන්සේගේ උත්පත්තිය දක්වෙන කථා අන්තර්ගත කාව්‍ය විශේෂය 'ජාතක කථා' යනුවෙන් හැඳින්විය හැකි ය. ජාතක කථාවල මූල බීජය ඇතැම් සූත්‍ර ධර්මයන්හි අන්තර්ගත වුව ද පසු ව සූත්‍රවලින් ඉවත් කර වෙන කොට්ඨාසයක් ලෙස ජාතක කථා සංවර්ධනය කර ඇති බව සිතිය හැකි ය. ඛුද්දක නිකායේ ජාතක කොට්ඨාසයෙහි ඇතුළත් කථා ලංකාවට බුද්ධ ධර්මය හඳුන්වා දීමෙන් පසු ව මෙරට භික්ෂූන්ට මිහිඳු මාහිමියන් ඇතුළු පිරිස උගන්වන්නට ඇතැයි සිතිය හැකි ය. එම පාළි ධර්මය මෙරට ජනයාගේ ප්‍රයෝජනය සඳහා හෙළටුවා බවට පරිවර්තනය කිරීමට මෙරට භික්ෂූහු ක්‍රියා කළහ. ක්‍රි. ව. පස්වන සියවසේ දී මෙරටට වැඩම කළ බුද්ධඝෝෂ හිමියෝ මහාවිහාරයීය නායක භික්ෂූන් වහන්සේගේ අවසරය ලබා ගෙන හෙළටුවා යළි පෙළටුවා බවට පරිවර්තනය කිරීමට කටයුතු කළහ. ඒ අනුව උන්වහන්සේ විසින් සම්පාදිත පාලි ජාතකට්ඨකථාව කුරුණෑගල යුගයේ දී යළි සිංහලයට පරිවර්තනය කරන ලදී. මෙම පරිවර්තනය පන්සිය පනස් ජාතක පොත් වහන්සේ හෙවත් සිංහල ජාතක පොත යනුවෙන් හැඳින්වෙයි. ජාතක අටුවාවේ සඳහන් ජාතක කථාවල නාම සිංහලයට නැගීමේ දී සිදු වූ වෙනස්කම් පෙන්වාදීම මෙම පර්යේෂණයේ අරමුණයි. පාලි ජාතක කථා නාම සිංහලයට නැගීමේ දී වෙනසකට භාජනය වූයේ ඇයි ද යන්න පර්යේෂණයේ ගැටලුව වශයෙන් තෝරා ගැණින. ගුණාත්මක පර්යේෂණ විධික්‍රමයට අදාළව ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ජාතකට්ඨකථාව හා පන්සිය පනස් ජාතක පොත ඇතුළත් පුස්කොළ පිටපත් යොදා ගැනීමට අපේක්ෂා කෙරේ. එමෙන් ම අදාළ ග්‍රන්ථවල සංස්කරණ ද්විතීයික මූලාශ්‍රය වශයෙන් යොදා ගැනේ. පාලි ජාතකට්ඨකථාවෙහි අන්තර්ගත ජාතක නාම හා පන්සිය පනස් ජාතක පොතෙහි අන්තර්ගත ජාතක කථා නාම සමග තුලනය කරමින් සිංහල ජාතක පොත පරිවර්තනයක් පමණක් නොවන බවත්, එහි පන්සිය පනහක් කථා නොමැති බවත් නිගමනය කිරීමට නියමිත ය.

**මුඛ්‍ය පද :** සිංහල ජාතක පොත, පාලි අටුවාව, ජාතක නාමයන්, වග්ග, නිපාත වණ්ණනා

1. භාෂා පර්යේෂක, නො.60/1 ඒ, ශ්‍රී ජින මාවත, කෙසෙල්වත්ත, පානදුර.
senadhi.lankara@gmail.com

# සාහිත්‍ය ඉතිහාසඥයකු වශයෙන් කේ. එන්. ඕ. ධර්මදාසගේ අනන්‍යතාව

චින්තක රණසිංහ[1]

**සාරසංක්ෂේපය**

කේ. එන්. ඕ. ධර්මදාස 1960 දශකයේ දී පේරාදෙණිය සරසවියෙන් සිංහල විශේෂ උපාධිය හදාරා පසු ව බටහිර විශ්වවිද්‍යාල දෙකකින් තම පශ්චාද් උපාධිය සම්පූර්ණ කළ ප්‍රකට විද්වතෙකි. ඔහුගේ ආචාර්ය උපාධි නිබන්ධය Language Religion and Ethnic Assertiveness, The Growth of Sinhalese Nationalism in Sri Lanka (1992) යන මැය යටතේ එළ විය. එතුමා පේරාදෙණි ගුරුකුලයේ ප්‍රකට වියතුන් වූ එදිරිවීර සරච්චන්ද්‍ර (1914-1996), ඩී. ඊ. හෙට්ටිආරච්චි (1909-1989), ම. ව. සුගතපාල ද සිල්වා (1931-1980) වැනි මුල්කාලීන බුද්ධිමය භූමිකාවල ප්‍රබල ආභාසයට ලක් විය. ශිෂ්‍යයකු ලෙස මෙන් ම සරසවි ආධුනික ඇදුරෙකු ලෙස එම පුරෝගාමී විද්වත් පරම්පරාවේ විෂය ඥානය මෙන් ම බුද්ධිමය සම්ප්‍රදායේ අවශේෂ අංග ද ලබා ගත්තේ ය. ප්‍රධාන විෂය ක්ෂේත්‍රය වූ 'සමාජ වාග්විද්‍යාවට' අමතර ව හෙතෙම දිගින් දිගට ම මෙරට සමාජ හා සංස්කෘතික ඉතිහාසය රචනා කිරීමේ නියැළී තිබේ. ඒ අනුව ඔහු සංස්කෘතික හා සමාජ ඉතිහාසයේ ඇතැම් පැතිකඩ තම ඉතිහාස ලේඛන මඟින් සාකච්ඡා කර ඇත. එහි දී ඉතිහාසය වාර්තා කිරීම මෙන් ම යම් ආකාරයකින් විශ්ලේෂණය කිරීම ද ඔහුගේ රචනාවල අන්තර්ගත බව නිරීක්ෂණය විය. 'ධර්මදාස සාහිත්‍යය පිළිබඳ ඉතිහාසඥයකු ලෙස ගොඩනැගූ භූමිකාවේ ස්වරූපය කෙබඳුද? යන පර්යේෂණ ගැටලුවට අදාළ ව සමකාලීන සාහිත්‍ය ඉතිහාසඥයන් සමග සංසන්දනයේ දී ධර්මදාස පළ කරන අනන්‍යතාව කුමක්ද ? සහ තෝරා ගත් යුගවල සාහිත්‍ය කටයුතු වාර්තාකරණයේ දී හා විශ්ලේෂණයේ දී භාවිත කළ ක්‍රමවේදයේ ස්වභාවය කුමක්ද? යන ප්‍රශ්න කෙරේ අවධානය යොමු කෙරිණි. සිංහල සාහිත්‍යයේ ඉතිහාසය ලියූ ඉතිහාසඥයකු ලෙස කේ. එන්. ඕ. ධර්මදාසගේ ක්‍රමවේදය හඳුනා ගැනීම සහ විශ්ලේෂණය කිරීම පර්යේෂණයේ අරමුණ විය. ගුණාත්මක පර්යේෂණ විධික්‍රමයට අදාළ ව ග්‍රන්ථ පරිශීලනය කරමින් මෙම අධ්‍යයනය සිදු කෙරිණ. මේ සඳහා එතුමා විවිධ සඟරා හා ශාස්ත්‍රීය ප්‍රකාශන සඳහා සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් ලියූ ලිපි සහ ඔහුගේ ඇතැම් පතපොත විමර්ශනය කෙරිණ. නූතන ඉතිහාසඥයන් කලාව හා සංස්කෘතික ඉතිහාසය ලිවීම පිළිබඳ ගොඩ නැගූ 'History Writing: New trends and Methodologies' (නීරා වික්‍රමසිංහ 2001) වැනි ප්‍රවාද කෙරෙහි අවධානය යොමු කරමින් ධර්මදාසගේ ඉතිහාසකරණය, දෘෂ්ටිමය වශයෙන් කුමනාකාර ප්‍රයත්නයක් දරන්නේ ද යන්න විමසා බැලිණ.

**මුඛ්‍ය පද :** ධර්මදාස, ඉතිහාසකරණය, සාහිත්‍ය ඉතිහාසය ලිවීම, බුද්ධිමය අනන්‍යතා

---

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය
chinthakaranasinha@gmail.com

# රත්න ශ්‍රී විජේසිංහගේ කාව්‍ය සම්ප්‍රදානය තුළ සෞන්දර්යාත්මක චින්තනය සමග දේශපාලන දෘෂ්ටිය සංයෝගකරණයේ ස්වාධිකාරකත්වය පිළිබඳ අධ්‍යයනයක්

අමරසිරි වික්‍රමරත්න[1] | නාලක ජයසේන[2]

**සාරසංක්ෂේපය**

කාව්‍යකරණයම සන්නිවේදන මග කොටගත් රත්න ශ්‍රී විජේසිංහයන් සෞන්දර්යාත්මක චින්තනය සමග දේශපාලන දෘෂ්ටිය සූක්ෂ්ම ලෙස සංයෝග කරගැනීම පිළිබඳ සෙවීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණයි. රත්න ශ්‍රී විජේසිංහට නූතන සිංහල කවි මග තුළ හිමිව ඇති අධිකාරිත්වය විමසීම මෙම පර්යේෂණයේ ගැටලුවයි. ඔහු විසින් 1979 සිට 2022 දක්වා රචනා කරන ලද කාව්‍ය ග්‍රන්ථ දහය, මෙම පර්යේෂණයේ සාහිත්‍ය විමර්ශනය පිණිස උපයෝගී කර ගැනෙයි. පර්යේෂණ විධික්‍රමය වන්නේ විජේසිංහ කවියාගේ කාව්‍ය පංක්තිවල වාග් ව්‍යූහය (structure of words) සලකමින් ඒ තුළ අන්තර්ගත විසංයෝජනීය ලක්ෂණ හඳුනා ගැනීමයි. මෙම කවියා සෞන්දර්ය සමග දේශපාලනය අවියෝජනීය ලෙස ගළපයි. කවියාගේ 'පින්තූරයකට පෙනී සිටීම' නමැති නිර්මාණය තම සෞන්දර්යානුභූති ප්‍රතිරචනයේදී වෘද්ධි බව ප්‍රකට කරයි. 'ගමේ යන සකිසඳ' කාව්‍යයේ අනුභූතිය වී ඇත්තේ දරිද්‍රතාව හමුවේ අවුරුද්දට ගමට යා නොහැකි වූ පියෙකුගේ අධ්‍යාත්මයේ හට ගන්නා මානසික කම්පනයයි. ඔහු අත්දැකීම තම ස්වාමිත්වයට ගෙන දේශපාලන දෘෂ්ටිය සහ සෞන්දර්යාත්මක පරිකල්පනය ඓන්ද්‍රියක උත්කර්ෂයට නගා නව්‍ය නිර්මාණයක් එයින් ජනනය කරයි. සමාජ අනුවේදන වෙතින් අත්දැකීම් ලබන කවියා ඒ ඔස්සේ සාර්ථක නිර්මාණ කරන්නට සමත් වෙයි. 'අසිරිමත් ථේර ගාථාව' නමැති කව ද මෙකී සංයෝගකරණය පිළිබඳ නිදර්ශනයකි. එය උත්ත්‍රාසය සහ උත්තාපය සහිත දේශපාලනයත් ඒ කෙරෙහි සවිඥානික දෘෂ්ටියත්, කලාත්මක පරිකල්පනයේත් පරිපාකය විද්‍යමාන කරන කවියකි. 'පැණි කෑ ගැහැනිය'ද සෞන්දර්යයේත් දේශපාලනයේත් සම්මිශ්‍රණයකි. රසායනිකව නව සංයෝග ඇති වීමේදී පෙර හා පසු ගුණ සමාන වන්නේත් අසමාන වන්නේත් නැති සේ, රත්න ශ්‍රීගේ කාව්‍ය තුළ සෞන්දර්යමය චින්තනය හා දේශපාලන දෘෂ්ටිය ප්‍රතික්‍රියා කරන්නට ඉඩ දුන් පසු උපදින නවජයන් නූතන සිංහල කවි මග තුළ ඔහුගේ ස්වාධිකාරිත්වය උත්ථාපිත කරයි. රත්න ශ්‍රී විජේසිංහගේ කාව්‍ය සම්ප්‍රදානය තුළ අචල සහ ප්‍රාසංගික සෞන්දර්මය චින්තාවක් විශද වුව ද ඔහුගේ දේශපාලන දෘෂ්ටියේ අස්ථායි බව ප්‍රසාධනය කළ හැකිය' යන්න නව ප්‍රවාදයක් ලෙස මේ පර්යේෂණයෙන් අනාවරණය විය.

**මුඛ්‍ය පද :** කාව්‍ය විසංයෝජනය, දේශපාලන දෘෂ්ටිය, නූතන සිංහල කවිය, රත්න ශ්‍රී විජේසිංහ, සෞන්දර්යාත්මක චින්තනය

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය
amarasiriw@gmail.com
2. ස්වාධීන පර්යේෂක
nalakadhamma@gmail.com

# ශ්‍රී ලාංකේය දේශපාලනික ව්‍යුහ තුළ මාධ්‍යවේදීන්ගේ භූමිකාව පිළිබඳ කතිකාව: සහෝදරයා ටෙලිනාට්‍ය ඇසුරෙන්

ඒච්. ටී. කේ. ඉෂාරා ජයරත්න[1]

**සාරසංක්ෂේපය**

කලා නිර්මාණය සමාජයේ ගැඹුරු සමාජීය, දේශපාලනික ප්‍රතිසංස්කරණයන්හි අවශ්‍යතාව විචාරය කරන මෙවලමකි. මෙම පර්යේෂණයහි අරමුණ වන්නේ දේශපාලනික ව්‍යුහ තුළ මාධ්‍යවේදීන්ගේ භූමිකාව පිළිබඳ විග්‍රහයට ලක් කිරිමත්, දේශපාලනික නියෝජිතයන් ඇතුළු බලපෑම් කණ්ඩායම් මාධ්‍යවේදීන්ට බලපාන ආකාරය අධ්‍යයනය කිරීමත් යන කරුණු කලාව තුළ ප්‍රතිනිර්මාණය වන්නේ කෙසේද, ඒ ප්‍රතිනිර්මාණය පිළිබඳ සමාජීය විග්‍රහය කෙසේද යන්න විග්‍රහයට ලක් කිරීමත්ය. මෙහිදී ලාංකේය දේශපාලනික ව්‍යුහ තුළ මධ්‍යවේදීන්ගේ භූමිකාව පිළිබඳ කතිකාව ටෙලිනිර්මාණ තුළ ප්‍රතිනිර්මාණය කරන්නේ කෙසේද යන ප්‍රධාන පර්යේෂණ ගැටලුව සහෝදරයා ටෙලිනාට්‍ය ඇසුරින් අධ්‍යයනය කරන ලදී. නාමල් ජයසිංහ අධ්‍යක්ෂණය කළ කොටස් 38කින් සමන්විත සහෝදරයා ටෙලිනාට්‍ය යූටියුබ් වෙබ් අඩවිය හරහා නරඹමින් මේ සඳහා රැස් කරගත් දත්ත විශ්ලේෂණය සඳහා ගුණාත්මක විශ්ලේෂණ ක්‍රමවේදයන් වන කතිකා විශ්ලේෂණය (Discourse analysis) සහ අන්තර්ගත විශ්ලේෂණය (Content analysis) යන විධික්‍රම භාවිත විය. මෙමඟින් දේශපාලනික සංස්කෘතිය නිර්මාණාත්මක විවේචනයකට හසු කරමින් ප්‍රධාන දහරාවේ ප්‍රතිසංස්කරණයන්හි අවශ්‍යතාව අවස්ථානෝචිතව විග්‍රහ කිරීමත්, ඒ සඳහා භූමිකා සහසම්බන්ධ කර ගැනීමේ ස්වරූපයත් අවශේෂ කතිකාවන් වන රාජ්‍ය මර්දනය, පුරවැසි භූමිකාව, රාජ්‍ය බලය, පවුල, ඥාති ව්‍යුහ, සමාජ වටිනාකම්, දේශපාලන පක්ෂ මඟින් විශ්ලේෂණයට ලක් කරන ලදී. මෙම පර්යේෂණයහි සොයාගැනීම් වූයේ සමාජ වටිනාකම් ප්‍රතිනිර්මාණය කිරීමේදී පුරවැසි භූමිකාව මත ස්ථාපිත වන බලයහි එක් ප්‍රතිරූපයක් බවට මාධ්‍යවේදී භූමිකාව පත්ව ඇති බවත්, දේශපාලනික සංස්කෘතියේ ප්‍රධාන දහරාවන්ගේ ක්‍රියාපටිපාටියට අනුගත නොවන මාධ්‍යවේදීන් රාජ්‍ය බලය තුළින් මර්දනයට ලක්වන බවත්, එම රාජ්‍ය මර්දනය මාධ්‍යවේදී භූමිකාව සමඟ සහසම්බන්ධිත අවශේෂ කතිකා දක්වා පැතිර පවතින බවත්, අවශේෂ කතිකාවන්ට අනුරූපව මාධ්‍යවේදී භූමිකාවහි බලපෑම් ස්වරූපය තීරණය වේ යන්නයි. ඒ අනුව ටෙලිනිර්මාණ මාධ්‍යවේදී භූමිකාව පිළිබඳ කතිකාව මෙන්ම එහි අවශේෂ කතිකාවන් ද සියුම් නිරීක්ෂණයට ලක් කිරීමට හැකි ලෙස ප්‍රතිනිර්මාණය කර ඇත යන්න නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය වචන :** දේශපාලනික ව්‍යුහ, දේශපාලනික නියෝජිතයන්, ප්‍රතිනිෂ්පාදනය, මාධ්‍යවේදීන්, කතිකාව

1. බාහිර කථිකාචාර්ය, දේශපාලන විද්‍යා සහ රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය
ishara@poli.cmb.ac.lk/htkishara11jayarathne@gmail.com

# ආකෘතිය පිළිබඳ පෙරදිග සංකල්පයට සාපේක්ෂව සාහිත්‍ය නිර්මාණයට හා විචාරයට නව පර්යාලෝකයක් එක් කිරීමට අපරදිග ආකෘතිවාදය සමත් වන්නේ ද යන්න පිළිබඳ විමර්ශනයක්

කේ. කේ. එන්. එන්. කාරියවසම්[1]

**සාරසංක්ෂේපය**

සාහිත්‍යය යනු භාෂාව පෙරබිමට කැඳවන, අනන්‍ය වූ ව්‍යූහීය ලක්ෂණයන්ගෙන් සමන්විත භාෂාවේ සුඛනම්‍ය අඩවිය ලෙස හැඳින්විය හැකි ය. සාහිත්‍ය යනු හුදු වචන ලියා දැක්වීම නොවේ. එය භාෂාවේ විධිමත් සංරචනයකි. එනිසා විශිෂ්ට සාහිත්‍ය නිර්මාණයක් තුළ ඉතා විශිෂ්ට භාෂාත්මක ගොඩනැංවීමක්, පිළිවෙළක් හා ව්‍යූහීය සංරචනයක් දැකිය හැකි ය. භාෂාව තුළින් හා ඊට ඔබ්බෙන් සාහිත්‍ය නිර්මාණය හා විචාරය පවත්වා ගැනීම විශිෂ්ට විචාරාත්මක භාවිතයක හා නිර්මාණකරණයක අත්‍යවශ්‍ය කරුණක් වන්නේ එබැවිනි. ආකෘතිවාදීන්ට පෙර සාහිත්‍යයෙහි වැදගත්කම අවධාරණය කළේ අන්තර්ගතයට සාපේක්ෂව ය. එක ම අන්තර්ගතය විවිධ ස්වරූපයන්ගෙන් නිර්මාණ මගින් මතුවීම න්‍යායික ප්‍රවේශයක් තුළට කැටිකර ගනු ලැබුවේ ආකෘතිවාදීන් විසිනි. පෙරදිග විචාරය තුළ ද ආකෘතිය පිළිබඳ අදහසක් පවතී. ඔවුන් ආකෘතිය දුටුවේ අන්තර්ගතයේ වාහකයක් ලෙස ය. විශේෂ වශයෙන් පෙරදිග සාහිත්‍ය භාවිතය විචාරයෙහි ලා එම ප්‍රවේශය වැදගත් වුව ද, මෙහි දී අප අවධානය යොමු කරන්නේ රුසියානු ආකෘතිවාදීන් හා නව විචාරකවාදී ගුරුකුලය විසින් විසිවන සියවසේ දී වර්ධනය කරන ලද න්‍යායික ප්‍රවේශය කෙරෙහි ය. ඔවුහු තිර ලෙස ආකෘතිය හා අන්තර්ගතය අතර ගොඩ නැඟිය හැකි අන්තර් පෝෂණාත්මක සම්බන්ධය අවධාරණය කළහ. ආකෘතිවාදීන්ට අනුව අන්තර්ගතය යනු ආකෘතියේ ඵලයකි. සමහර සාහිත්‍ය භාවිතයන්ගේ අනන්‍යතාකාරක ලක්ෂණය ලෙස පවතින්නේ ම ආකෘතිය බව ආකෘතිවාදීහු පෙන්වා දුන්හ. භාෂාත්මක ගොඩනැංවීම හෙවත් පිළිවෙළ හා අර්ථ (Order vs meaning) අතර සම්බන්ධය නව අරුත් සම්පාදනයෙහි ලා තීරක ව බලපාන බව ආකෘතිවාදීහු අවධාරණය කරති. එයින් සාහිත්‍ය නිර්මාණය හා විචාරය තුළ ව්‍යූහය තේරුම් ගැනීමේ හා කියවීමේ වැදගත්කම අවධාරණය කෙරිණි. එම අවධාරණයත් සමඟ නිර්මාණය තුළ වන සන්දර්භය, චරිත, අවස්ථා, භාෂාවේ ස්වරූපය යනාදිය නැවත නැවතත් ප්‍රශ්න කිරීම අත්‍යවශ්‍ය සාධකයක් බව තහවුරු කෙරිණි. මෙකී ප්‍රවේශ, පෙරදිග ආකෘතිවාදයට සාපේක්ෂ ව ලාංකේය සාහිත්‍ය කලා භාවිතය හා විචාරය නව සංකථනයක් වෙත රැගෙන යන්නේ ද යන්නත්, එය හුදු භාෂාව පමණක් සාහිත්‍ය ලෙස වටහා ගන්නා සමාජය ඊට ඔබ්බෙහි පිහිටුවීමට අනුබලයක් සපයන්නේ ද යන්නත් මෙහි දී සාකච්ඡා කෙරේ.

**මුඛ්‍ය පද:** සාහිත්‍ය, ආකෘතිවාදය, ව්‍යූහය, විචාරය, නිර්මාණය

1. බාහිර කථිකාචාර්ය, ප්‍රසංග කලා අධ්‍යයනාංශය, ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය
naleennishanthapdn@gmail.com

# ලාංකේය නාට්‍යය කලාවේ දෘෂ්ටිවාද නිරූපණය: 'සුබ සහ යස' වේදිකා නාට්‍යය ආශ්‍රිත සිද්ධි අධ්‍යයනයක්

එම්.ඒ. දිෂාන් මධුෂන්ක[1]

**සාරසංක්ෂේපය**

නාට්‍යය කලාව බිහි වී ඇත්තේ හුදු රස නිෂ්පත්තිය සඳහා පමණක් ම නොවේ. නාට්‍යකරුවාත් ඔහු අතින් ප්‍රේක්ෂකාවතීර්ණ කෙරෙන වේදිකා නාට්‍යයත් නිශ්චිත සමාජ-දේශපාලන ප්‍රකාශනයකි. ලාංකේය නාට්‍යය කලාවේ රසාත්මක පැතිකඩ පිළිබඳ ශාස්ත්‍රීය ප්‍රවාද සුලභ වුවත් එහි දෘෂ්ටිවාදාත්මක අංශය සම්බන්ධයෙන් වන කතිකා විරල ය. මෙම අධ්‍යයනය එම පර්යේෂණ රික්තකය ඌනපූරණය කිරීමේ අරමුණෙන් සිදු කරන ලද්දකි. මේ සඳහා සයිමන් නවගත්තේගමගේ 'සුබ සහ යස' වේදිකා නාට්‍යය සිද්ධි අධ්‍යයනයක් වශයෙන් යොදා ගෙන ඇත. 'සුබ සහ යස' වේදිකා නාට්‍යයෙන් නිරූපිත දෘෂ්ටිවාද කවරේ ද? යන්න පර්යේෂණයේ ප්‍රධාන අධ්‍යයන ගැටලුවයි. පර්යේෂණ විධික්‍රම වශයෙන් තේමා අධ්‍යයනය සහ අන්තර් පයීත විධික්‍රමය යොදාගන්නා ලදී. මෙම නාට්‍යයෙන් වේදිකාගත වන්නේ යසලාලකතිස්ස රජු පිළිබඳ ආඛ්‍යානයයි. 1974 දී එනම් 1971 විප්ලවය සිදු වී වසර තුනකට පසු මෙම නාට්‍යය වේදිකාගත විය. නාට්‍යයෙහි වන දෘෂ්ටිවාදාත්මක නිරූපණය පෝෂණය කිරීමෙහි ලා මෙම විප්ලවීය ආභාසය බලපා ඇති බව අවබෝධ කරගත හැකි ය. මෙම දෘෂ්ටිවාදීමය ආස්ථාන ප්‍රධාන තේමා ද්විත්වයකට යටත් ව විශ්ලේෂණය කළ හැකි ය. සමාජ හා සංස්කෘතික දෘෂ්ටිවාදය එහි පළමු තේමාවයි. වේදිකා නාට්‍යයේ ප්‍රේක්ෂකාවතීර්ණ කෙරෙන පින්වත් දරු උපතක් පිළිබඳ ආඛ්‍යානය එවැනි සංස්කෘතික මනෝභාව සඳහා නිදසුනකි. දරුවකු පිළිසිඳ ගැනීම හෝ නොගැනීම නොඑසේ නම් උපදින දරුවා ගැහැනු හෝ පිරිමි දරුවකු වීම වැනි සංරචක ආශ්‍රිත සමාජ-සංස්කෘතික මනෝභාව කවර හෝ සමාජ සන්දර්භයක හඳුනාගත හැකි ය. එමෙන් ම වේදිකා නාට්‍යය මගින් පොතේගුරුවාදී සාම්ප්‍රදායික දෘෂ්ටිවාදය සතු බලපෑම ද අවධාරණය කර ඇත. රජු පිළිකෙව් කරන වන්දිභට්ටයන්ගේ ගායනා එවැනි පොතේගුරුවාදී සම්ප්‍රදායන් සඳහා වන නිදසුනකි. මෙහි දෙවන තේමාව වන්නේ දේශපාලන දෘෂ්ටිවාදය යි. එහි දී විප්ලවීය හා ප්‍රතිවිප්ලවීය ආස්ථාන පිළිබඳ අවලෝකනයක් ඉදිරිපත් කර තිබේ. රජුගේ පාලන තන්ත්‍රය යටතේ විප්ලවීය අවස්ථාවකට තුඩු දෙන මූලබීජ රාශියකි. එහෙත් විප්ලවීය බල හුවමාරුවක් යනු පුද්ගල මාරුවක් පමණක්ම නොවේ. එම අර්ථයෙන් 'සුබ සහ යස' වේදිකා නාට්‍යය බහුවිධ දෘෂ්ටිවාදය නිරූපණය කර ඇති කලා ප්‍රකාශනයක් ලෙස අර්ථකථනය කළ හැකි ය.

**මුඛ්‍ය පද:** දෘෂ්ටිවාද, පොතේගුරුවාදය, විප්ලවය, සම්ප්‍රදාය, සුබ සහ යස

---

1. පරිවාස කථිකාචාර්ය (සමාජ විද්‍යාව), මානවශාස්ත්‍ර පීඨය, ඇක්වයිනාස් උසස් අධ්‍යාපන ආයතනය. කොළඹ-08

dishan.madushanka92@gmail.com

# වීරපොකුණේ උපරතන හිමියන්ගේ 'මං' නවකතාවේ අන්තර්ගත අතුරු කතා පිළිබඳ අධ්‍යයනයක්

මනෝජා නවෝදනී ඒකනායක[1]

**සාරසංක්ෂේපය**

නූතන ප්‍රබන්ධ කතා සාහිත්‍යයට අයත් ප්‍රධාන සාහිත්‍යාංග අතර මානව ජීවිතය විවරණය කරන ප්‍රබලතම මාධ්‍යය වනුයේ නවකතාවයි. ඒ අනුව යුගයෙන් යුගය නවකතාවේ තේමා, ආකෘති මෙන්ම භාෂා ශෛලියද වෙනස්වීම්වලට ලක් වේ. එහිදී මහා සිංහල ශබ්ද කෝෂයේ අතුරු කතාව යනු දීර්ඝ කතාවක් මධ්‍යයෙහි පවසන අතිරේක කතාව ලෙස දක්වා තිබේ. ඉන් අර්ථ ගැන්වෙන්නේ ප්‍රධාන කථාවට අමතරව ඇති වෙනත් කතා යන්නයි. මෙහිදී සිංහල නවකතාවට භික්ෂූන් වහන්සේලාගේ දායකත්වයද බොහෝ සෙයින් ලැබී ඇති අතර වීරපොකුණේ උපරතන හිමි ඒ අතර ප්‍රමුඛ තැනක් ගනී. වීරපොකුණේ උපරතන හිමිගේ 'මං' නවකතාවේ අන්තර්ගත අතුරු කතා හඳුනාගත හැක්කේ කෙසේද? යන පර්යේෂණ ගැටලුව මුල් කර ගනිමින් සිදු කළ මෙම පර්යේෂණයේ මූලික අරමුණ වූයේ නවකතාවක ශිල්පීය ලක්ෂණ අතර අතුරු කතා යෝජනය නම් ශිල්ප ක්‍රමය පිළිබඳ අවධානය යොමු කිරීමයි. එහිදී උපරතන හිමියන්ගේ 'මං' නවකතාවේ තේමාත්මක අගය හා වස්තු විකාශනය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීම අනු අරමුණක් විය. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ රැස් කරගත් දත්ත විස්තරාත්මක ක්‍රමය උපයෝගී කර ගනිමින් විශ්ලේෂණය කෙරිණි. 'මං' කෘතියේදී මෙහිමියෝ එතෙක් බිහි වූ සිංහල නවකතාවක නොදක්නා තරමින් අතුරු කතාව නම් ශිල්පෝපක්‍රමය ඔහුටම ආවේණික වූ ශෛලියකට හසුරුවීමට සමත් වී ඇති බව හඳුනාගත හැකිවිය. එහිදී කතු හිමි අතුරු කතා ප්‍රමුඛාර්ථය කුළුගැන්වීමට මෙන්ම පරිසරය පිළිබඳ විශ්වසනීයත්වය තහවුරු කිරීමටද චරිත පදනම ස්ථාපිත කරන්නටද යොදා ගෙන ඇත. නිදසුනක් ලෙස 'මං' නවකතාවේ එන හාමුදුරුවන්ගේ අතීතාවර්ජනය සහිත අතුරු කතාව දැක්විය හැකිය. අතුරු කතාව මූලික කතාවට පෑහෙන්නේ හාමුදුරුවන් හා මල්ලිස් අප්පුගේ ආත්ම වෙළා පැවති හුදෙකලා බව නමැති සන්ධියෙනි. කතාවට පාදක වන යටත් විජිත සමයේ භීෂණත්වය අතුරු කතාවෙන් තව දුරටත් තීව්‍ර කිරීමට අවස්ථාව උදා වී ඇත. මනෝ ව්‍යාකූලතා දැක්වීමටද උපරතන හිමි අතුරු කතා යොදා ගෙන ඇත. සුගන්දිනා කුමාරිහාමි හා රංග ලෝකුරු නයිදේගේ කතාව එයට නිදසුන් වේ. මේ අනුව උපරතන හිමියන්ගේ නවකතාවල කැපී පෙනෙන ශිල්පීය ලක්ෂණ අතර අතුරු කතා යෝජනය සිංහල නවකතාවේ පෝෂණය කෙරෙහි සුවිශේෂී දායකත්වයක් දක්වන බව නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පදඃ** සිංහල නවකතාව, යතිවර දෘෂ්ටිය, අතුරු කතා, ශිල්පීය ලක්ෂණ, ප්‍රමුඛාර්ථය

1. තාවකාලික කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
navodaniekanayaka@gmail.com

# වර්තමාන සිංහල නවකතාවෙන් නිරූපණය වන සංක්‍රාන්තික ලිංගික සමාජභාවී පරපීඩනය පිළිබඳ ව විමර්ශනාත්මක අධ්‍යයනයක්.
## (තෝරා ගත් නවකතා ඇසුරෙන්)

එච්.එම්.බී.එල්.කේ.හේරත්[1]

**සාරසංක්ෂේපය**

සංක්‍රාන්තික ලිංගික සමාජභාවී පුද්ගලයන් යනු ශරීරය බාහිරින් එක් ලිංගික අනන්‍යතාවක් සහ මානසික ව එයට සපුරා ම වෙනස් ලිංගික අනන්‍යතාවක් සහිත ව ජීවත් වන අය යි. සංක්‍රාන්තික ලිංගික සමාජභාවී පුද්ගලයන් පරපීඩනයට ලක්වන ආකාරය නිරූපණය කිරීම, වර්තමාන සිංහල නවකතාවේ විශේෂ යුග ප්‍රවණතාවකි. සංක්‍රාන්තික ලිංගික සමාජභාවී පරපීඩනය නවකතාවෙන් නිරූපණය කර තිබෙන ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීම පර්යේෂණ අරමුණ යි. උපයුක්ත නවකතාවල සංක්‍රාන්තික ලිංගික පරපීඩනය නිරූපණය කර තිබෙන්නේ කවරාකාරයෙන්ද? යන්න පර්යේෂණ ගැටලුව යි. ගුණාත්මක පර්යේෂණ විධික්‍රමයට අදාළ ව ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රය ලෙස පණ්ඩක පුත්‍ර වස්තුව (අනුරසිරි හෙට්ටිගේ), අංගනා (ශාන්ති දිසානායක) සහ අකාල කුසුම් (බුද්ධික හේරත්) යන නවකතා භාවිත කෙරිණි. ලිංගික අනන්‍යතාව, සංක්‍රාන්තික ලිංගික සමාජභාවය සහ සංක්‍රාන්තික ලිංගික සමාජභාවීය පරපීඩනය පිළිබඳ රචනා වූ පර්යේෂණ ග්‍රන්ථ, සඟරා හා අන්තර්ජාල ශාස්ත්‍රීය ලිපි ද්විතීයික මූලාශ්‍රය වශයෙන් භාවිත කරන ලදී. දත්ත විශ්ලේෂණයේ දී විස්තරාත්මක විශ්ලේෂණය භාවිත කෙරිණි. පරපීඩිත සංක්‍රාන්තික ලිංගික සමාජභාවී චරිත ඔවුන්ගේ ලිංගික අනන්‍යතාව හේතුවෙන් පරපීඩනයට ලක් වූ බව පණ්ඩක පුත්‍ර වස්තුව නවකතාවේ සිරිමල්, අංගනා නවකතාවේ සේපාල සහ අකාල කුසුම් නවකතාවේ විදර්ශන චායා වැනි චරිතවලින් නිරූපණය වේ. එහි දී පුද්ගල අයිතිවාසිකම් අහිමි කරමින් කායික, මානසික, ලිංගික පරපීඩනයට මෙන් ම නොසලකා හැරීමට ද සංක්‍රාන්තික ලිංගික සමාජභාවී පුද්ගලයන් ලක් වන ආකාරය වර්තමාන සිංහල නවකතාවෙන් නිරූපණය කර තිබේ. තව ද සංක්‍රාන්තික ලිංගික සමාජභාවී පුද්ගලයන්ට තමන් දරන්නා වූ ලිංගික අනන්‍යතාව හේතුවෙන් සමාජයෙන් එල්ල වන මානසික පරපීඩනය දරා ගැනීමට නොහැකි ව ඔවුන් සිය දිවි අහිමි කර ගැනීමට පවා උත්සහ කරන ආකාරය ද නිරූපිත ය. මෙම නවකතා අනුව සංක්‍රාන්තික ලිංගික සමාජභාවය පිළිබඳ ව වර්තමාන ශ්‍රී ලාංකේය සමාජයට පැහැදිලි අවබෝධයක් නොවීම එලෙස සංක්‍රාන්තික ලිංගිකයන් ව පරපීඩනයට පත් වීම සඳහා හේතු වී තිබෙන බව පැහැදිලි වේ.

**මුඛ්‍ය පද :** සංක්‍රාන්තික ලිංගික සමාජභාවී පරපීඩනය, පණ්ඩක පුත්‍ර වස්තුව, අංගනා, අකාල කුසුම්

1. පශ්චාත් උපාධි අපේක්ෂක, සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
hmbikherath@gmail.com

# සාහිත්‍ය නිර්මාණයක අන්තර්ගතයේ පමණක් නොව ආකෘතියේද අර්ථ ගැබ්වී පවතින ආකාරය පිළිබඳ අධ්‍යයනයක් (තෝරාගත් නූතන පද්‍ය සාහිත්‍ය කෘති කිහිපයක් ඇසුරින්)

එස්. එම්. එන්. එස්. විමලසේන[1]

**සාරසංක්ෂේපය**

සාහිත්‍යය වනාහි මානව ජීවිතය හා ප්‍රතිබද්ධ හෘදයග්‍රාහි කලා මාධ්‍යයකි. සාහිත්‍ය හා සාහිත්‍ය විචාරය අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකට බැඳී පවතී. නිර්මාණයක ආකෘතිය විෂයෙහි පැන නඟින සංකල්පයක් වශයෙන් ආකෘතිකවාදය අර්ථකථනය කළ හැකිය. සාහිත්‍ය නිර්මාණයක අන්තර්ගතයේ මෙන්ම ආකෘතියේද අර්ථ ගැබ්ව පවතින්නේ කෙබඳු ආකාරයෙන්ද? යන පර්යේෂණ ගැටලුව මුල් කර ගෙන පර්යේෂණය සිදු කෙරිණි. සාහිත්‍ය නිර්මාණයක ආකෘතිය එම නිර්මාණයේ අර්ථ ජනනයට හා අර්ථ බහුල කිරීමට දායක වන අයුරු නූතන පද්‍ය සාහිත්‍ය කෘති කිහිපයක් ඇසුරින් විමසා බැලීම පර්යේෂණයේ මූලික අරමුණයි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ පුස්තකාල පරිශීලනයෙන් රැස් කරගත් දත්ත විස්තරාත්මක ක්‍රමය උපයෝගී කර ගනිමින් විශ්ලේෂණය කෙරිණි. සාහිත්‍ය නිර්මාණයක ආකෘතිය අන්තර්ගතයට මනා ආලෝකයක් ලබා දීමට සමත් වෙයි. මෙම විචාර වාදය බිහි වීමට පෙර අන්තර්ගතයෙන් පමණක් සාහිත්‍යික අගය මැන බලා ඇත. එහිදී උදාහරණයක් වශයෙන් ඉදිරිපත් වී ඇත්තේ බෝතලයේ හැඩය කෙසේ වුවත් වයින් වයින්ම බව පැවසීමයි. නමුත් ආකෘතිකවාදීහු බෝතලයේ හැඩය වයින්වලට බලපාන බව අවධාරණය කරති. එහිදී බෝතලයේ හැඩයෙන් වයින්වලට වටිනාකමක් ලැබෙන බව සඳහන් කරයි. වයින් බීම, භාජනයේදී හැඩය අනුව රසවත් වැදගත් වනවා සේම සාහිත්‍යයේදීද කවියක, කෙටිකතාවක, නවකතාවක රසයට ආකෘතිය වැදගත් වන බව ආකෘතිකවාදීහු පෙන්වා දෙති. යම් සාහිත්‍ය නිර්මාණයක ආකෘතිය යම් හැඩයක්, රිද්මයක් ගෙන දුන් නමුත් එය දවටනයක් සේ සැලකීම නොවටී. එය ඓන්ද්‍රීය අංගයක් ලෙස හඳුනා ගැනීම වඩාත් නිවැරදිය. යමක් කියන ආකාරය එහි අර්ථයේ කොටසක් සේ සැලකීම වැදගත්ය. සාහිත්‍යයේදී කියන ආකාරය කියන දේම කොටසක් ලෙස හඳුනාගත යුතුය. ආකෘතිකවාදය විසින් මුල්වරට සාහිත්‍ය සම්බන්ධයෙන් යමක් කියන ආකාරය කොතරම් තීරණාත්මකද යන්න මතු කරනු ලැබීය. කාව්‍ය රිද්ම රටා, එය ලේඛනගත කර ඇති ආකාරය ආදිය ආකෘතියේ කොටස් වන අතර ඒවා අන්තර්ගතය හා එකතු වී අර්ථ උත්පාදනයට ඉවහල් වන බව නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පදඃ** නූතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ, සාහිත්‍ය විචාරය, ආකෘතික වාදය, සාහිත්‍ය රසවින්දනය, අර්ථ උත්පාදනය

---

1. සහකාර කථිකාචාර්ය සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
nilushalk1@gmail.com

# පුරුෂ මූලික සමාජ සංස්ථාව තුළ පීඩනයට පත් වන පවුල් සංස්කෘතිය පිළිබඳ නූතන ස්ත්‍රීවාදී කියැවීමක් : රුවන් බන්දුජීවගේ කුණ්ඩලකේශී කාව්‍ය ආශ්‍රයෙන්

ඩබ්.එම්.සී.ඩී.වනසිංහ[1]

**සාරසංක්ෂේපය**

මානව ජිවිතයෙහි නොගැඹුරු, ගැඹුරු සහ ඉතා ගැඹුරු තැන් අපගේ මනසට හසුකර ගැනීමට අපට උපකාරී වන, ජන සාහිත්‍යය හා ජන සමාජය සමඟින් බද්ධ වූ ප්‍රබල කලාංගයකි, නූතන කවිය. මිනිසාගේ සිතුම්පැතුම්, හැඟීම්, දුක් පීඩා, ජය පරාජය ආදි සමාජ යථාර්ථය නූතන කවියෙන් චිත්‍රණය වෙයි. රුවන් බන්දුජීව, පවතින සමාජ ප්‍රවාහය තුළ අප අත්දකින අත්විඳින සුලබ සිදුවීම් වඩාත් නිර්මාණශීලීත්වයෙන් සමාජයේ යහපැවැත්මට සහ සමාජ සංවර්ධනයට නූතන කවිය උපයෝගී කර ගත් අයෙකි. ඔහුගේ "මීළග මීවිත" කාව්‍ය කෘතියෙහි 'කුණ්ඩලකේෂී' නිර්මාණයෙන් මතු කරන ස්ත්‍රීත්වයේ මුහුණුවර කාලෝචිතව විමර්ශනය කිරීම වැදගත්ය. ලාංකේය සාම්ප්‍රදායික ස්ත්‍රීත්වය පුරුෂ මූලික සමාජ සන්දර්භය තුළ පීඩනයට හසුවන්නේ කෙසේද යන පර්යේෂණ ගැටලුවට අදාළ ව කාන්තාව සමාජ, දේශපාලන ආර්ථික හා සංස්කෘතිකමය වශයෙන් අත්විඳින අනවරත අරගලය පිළිබඳ සාකච්ඡා කිරීමේ පර්යේෂණ අරමුණට අදාළ ව පර්යේෂණය සිදු කෙරිණි. මෙහි දී ගුණාත්මක පර්යේෂණ විධික්‍රමය ඔස්සේ පුස්තකාල පරිශීලනය, විෂය ප්‍රාමාණිකයන්ගේ අදහස් ලබා ගැනීම සහ අන්තර්ජාල මගින් දත්ත රැස්කර ගන්නා ලදී. දත්ත විශ්ලේෂණය සඳහා ස්ත්‍රීවාදී න්‍යාය භාවිතයෙන් ගුණාත්මක විශ්ලේෂණයක් සිදු කෙරේ. කවියා පහළ පංති සමාජයේ දහසකුත් දියණිවරුන් වෙනුවෙන් නැගී සිටින සමස්ත මව්වරුන් පිළිබඳ සාකච්ඡා කරයි. පුරුෂාධිපත්‍යයෙන් පීඩිත සමාජ වපසරියක ස්ත්‍රී සංහතිය දනවන කාව්‍ය සන්දර්භයේ හැඩය තුළින් ඉස්මතු කෙරෙන ස්ත්‍රියකගේ අසීමාන්තික පුරුෂ භක්තිය අවසන් වන්නේ ඛේදවාචකයකිනි. තම දියණියගේ ආත්මය වෙනුවෙන්, සැමියා ඝාතනය කිරීමට පෙලඹෙන ස්ත්‍රීත්වය වෙත මුල් වන සමාජ දේශපාලනික කරුණු කාව්‍යයෙන් විශද කරයි. සමාජ වටපිටාව ඇසුරින් මනුෂ්‍යත්වයේ ගැඹුරු ප්‍රතිරූපණයට අවැසි මානව ධර්මතා බිඳවැටීම් තුළ ගැටෙන ස්ත්‍රීත්වයේ සත්‍යය ඛේදනීය ඉරණම, නූතන කවියේ හැඩය හඳුනා ගත් බන්දුජීවගේ නිර්මාණකරණය අතිශයින් ප්‍රබලය. කාව්‍යකරණය තුළ "පෙළ බෙදීම" යන ආකෘතිමය ගුණය උපයුක්ත කර ගනිමින් නිසඳැස් කාව්‍යයහි රිද්මය මෙන්ම සමාජ විවේචනය යන ගුණාංග රැකෙන පරිදි නිර්මාණයෙහි යෙදීමද සුවිශේෂීය. රූපක සංකේත දෘෂ්ටිය හා කවියට ලබා දෙන හැඩය කවියාගේ නිර්මාණකරණයේ තවත් සුවිශේෂී කරුණකි.

**මුඛ්‍ය පදඃ** නූතන කවිය, ස්ත්‍රීත්වය, ස්ත්‍රීවාදය, සමාජ සංසිද්ධීන්, නිර්මාණකරණය

1. සමාජවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණු විශ්වවිද්‍යාලය.
chamikawanasinghe93@gmail.com

# අනුරාධපුර පන්කුලිය විහාරයේ පාදෙණියක සටහන්ව ඇති සෙල්ලිපියක් පිළිබඳ අධ්‍යයනයක්

කරුණාසේන හෙට්ටිආරච්චි[1]

**සාරසංක්ෂේපය**

අනුරාධපුර නගරයට උතුරු දිශාවෙන් මල්වතු ඔයට නුදුරින් පිහිටි 'පන්කුලිය විහාරය' අනුරාධපුර යුගයට අයත් සුවිශේෂ වාස්තු විද්‍යාත්මක හා කලාත්මක නිර්මාණවලින් අනූන ආගමික ස්ථානයකි. අශෝකාරාමය වශයෙන්ද ප්‍රසිද්ධ මෙම විහාරය පබ්බතාරාම සම්ප්‍රදායට අයත් ආරාමයක් ලෙස උගතුන් පිළිගෙන ඇත. මෙය විවිධ වාස්තු විද්‍යාත්මක නිර්මාණ අංගවලින් සමන්විත වන අතර ඉතා කලාත්මක ශෛලමය හිඳි බුද්ධ ප්‍රතිමාවක්ද වෙයි. මෙම භූමියෙන් ශිලාලේඛන කීපයක්ම මේ වන විට සොයාගෙන තිබෙන අතර පාදෙණියක සටහන්ව ඇති ශිලාලේඛනයක්ද ඒ අතර වෙයි. මෙම ලිපිය සොයා ගෙන වසර 120ක් ගතව ඇතත් මෙතෙක් එය කියවා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත්කොට නැත. මෙය ඉතා දුර්ලභ සෙල්ලිපියක් වන අතර ලංකාවේ වෙනත් ස්ථානවලින්ද එබඳු ලේඛන හමුව ඇත්තේ ඉතා විරල වශයෙනි. මෙහිදී පර්යේෂණ ක්‍රමවේද වශයෙන් විශේෂයෙන් ලිඛිත මූලාශ්‍ර පරිශීලනය සහ ක්ෂේත්‍ර අධ්‍යයනය උපයෝගී කර ගැනුණි. මෙම ලිපිය සටහන්ව ඇත්තේ සෙ.මී.40ක් පමණ උස සෙ.මී.75ක් පමණ විෂ්කම්භය ඇති ගල් බේසමක් බඳු භාජනයක ගැටිය මතය. දැනට මෙම බඳුන පංකුලිය ආරාම සංකීර්ණයෙහි ප්‍රධාන දාගැබෙහි දකුණු දොරටුව හා සම්බන්ධ පියගැට පෙළ පාමුල ඊට වම්පසින් තැන්පත්ව ඇත. මෙම ලිපියේ සඳහන්ව ඇත්තේ පාදෙණියක් කරවීම පිළිබඳවය. ලැබී ඇති වෙනත් සාධකවලට අනුව පාදෙණිය යනු පා සේදීම සඳහා යොදා ගන්නා ජලය බහා තබන බඳුනයි. මෙබඳු රවුම් හෝ හතරැස් හැඩයෙන් යුතු පාදෙණි හෙවත් පාදෝණි බොහොමයක් පැරණි ආරාම භූමිවල ඇති දාගැබ් හෝ ප්‍රධාන ගොඩනැගිලිවල ප්‍රවේශ දොරටුව ආසන්නයෙහි තැන්පත් කොට තිබෙනු දැක ගත හැකිය. නමුත් සෙල්ලිපි සටහන්ව ඇත්තේ ඉන් දෙක තුනක පමණි. මෙම පාදෙණියේ දායකයා වන්නේ තීරු බදු සටහන්කරුවකු වූ 'සෙනල්' නමැත්තෙකි. එය සෙල්ලිපියෙහි සටහන්ව ඇත්තේ 'පොත් කරන සෙනල් මාඩැබි' යනුවෙනි. මෙම තනතුර වෙනත් සමකාලීන සෙල්ලිපි කීපයක ද දැකගත හැකිවන අතර අක්ෂර ලක්ෂණ අනුව ලිපිය 10වන සියවසට පමණ අයත් වේ. මෙම ලිපිය ආශ්‍රය කොට එම බඳුන්වල පැරණි නාමය ස්ථිර වශයෙන් හඳුනා ගැනීමටත්, ලංකාවේ පැරණි රාජ්‍ය නිලධාරීන් පිළිබඳවත්, ඔවුන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳවත් හඳුනා ගැනීමටත් උපකාර කරගත හැකිය.

**මුඛ්‍ය පදඃ** පන්කුලිය විහාර, පාදෙණිය, සෙනල් මාඩැබි, පබ්බතාරාමය, මල්වතුඔය

---

1. මහාචාර්ය, ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
hettiarachchikaru@yahoo.com

# ජය ශ්‍රී මහා බෝධිය හා වත්මන් තේවාකරුවන් පිළිබඳ කෙරෙන සමාජ සංස්කෘතික අධ්‍යයනයක්

වසන්ත කේ. දිසානායක[1]

ජී. භවන්ත ප්‍රමෝද් චන්ද්‍රරත්න[2]

**සාරසංක්ෂේපය**

බුදුන් වහන්සේ ජීවමාන කාලයේ සිටම පුද පූජා ලැබූ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට බුද්ධ පරිනිර්වාණයෙන් අනතුරුව විවිධ ආවතේව කරන්නට බෞද්ධයෝ පෙලඹුණහ. ඒ අනුව පසුකාලීනව බෝධීන් වහන්සේ වටා සුවිශාල සේවා සංස්කෘතියක් ඇති විය. මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් ශ්‍රී මහා බෝධීන් වහන්සේට තේවා පිණිස පැමිණි තේවා කුලිකයන්ගේ වත්මන් ක්‍රියාදාමය පිළිබඳ විමර්ශනය කෙරේ. අතීතයේදී ශ්‍රී මහා බෝධීන් වහන්සේ උදෙසා පැවැත්වූ තේවා ඒ අයුරින්ම වර්තමානයේදීත් පැවැත්වෙන්නේද? යන්න පර්යේෂණයේ ගැටලුවයි. අතීතයේදී පැවැත්වූ තේවා වර්තමානයේදී ඒ අයුරින්ම සිදු නොවන බව උපන්‍යාසයයි. අතීතයේ තේවා කුල ශ්‍රේණි දහඅටට පැවරුණු තේවා පිළිබඳ විමර්ශනය කර වර්තමානයේ එම තේවාවල ස්වභාවය තුලනාත්මකව අධ්‍යයනයක් තුළින් විමර්ශනය කෙරිණි. ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක විධික්‍රමය ඔස්සේ ක්ෂේත්‍ර අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා සහ මූලාශ්‍රය අධ්‍යයනය භාවිතයෙන් දත්ත රැස් කරන ලදී. දහඅට කුලයක ජනතාව හා කුමාරවරුන් අටදෙනෙකු බෝධීන් වහන්සේට ආවතේව කිරීමට පැමිණියද වර්තමානය වන විට හේවිසි තේවාකරුවන් හැරුණු කොට තේවාකරුවන් ලෙස හඳුනාගත හැක්කේ බෝධි මලුවෙහි සිටින නූතනයේ "වෙල්ලිදුරයි" ලෙස හඳුන්වන විහාර පදවියේ ගම් වැසියන් පමණි. මොවුන් වෙල්ලිදුරයි ලෙස හැඳින්වුවද කුමන කුල පරපුරකින් පැවත එන්නේද, දේවානම්පියතිස්ස රජු ඔවුන්ට පැවරූ කාර්යය කුමක්දැයි හඳුනාගැනීමද ගැටලු සහගත වුවද බෝධිගුප්ත කුමරාගේ පරපුරෙන් පැවතෙන බව ඔවුන්ගේ විශ්වාසයයි. වර්තමානයේදී බෝධීන් වහන්සේට සේවය කිරීමට අමතරව පොදු ජනතාවගේ භාර හාර වීම හා ඒවා ඔප්පු කිරීම, පිරිත් කීම, පිරිත් නූල් බැඳීම, බෝධීන් වහන්සේට සේවා සිදු කිරීමටත් වඩා සුවිශේෂී වූ කාර්යය වශයෙන් සලකති. බෝධීන් වහන්සේ උදෙසා අතීතයේ පැවති තේවා ඒ අයුරින්ම පවත්වාගෙන යන කිසිදු කුලයක් අද වන විට දැකගත නොහැකිය. අතීතයේ සිට තේවා කුලිකයන්ට පැවරුණු බෝධි තේවා කටයුතුවලින් ඔවුන් දුරස්වීමට ආසන්නම හේතුව ලෙස සලකන්නේ බෝධීන් වහන්සේ සඳහා වූ තේවා අත්හැර රාජ්‍ය පාලනය විෂයෙහි සහසම්බන්ධවීමය.

1. මහාචාර්ය, භාෂා අධ්‍යයනාංශය, සමාජීයවිද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ
dwasanta@yahoo.com

2. සහකාර කථිකාචාර්ය, භාෂා අධ්‍යයනාංශය, සමාජීයවිද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ
pramodchandraratna@gmail.com

බෝධි ගුප්ත කුමරුට ප්‍රදානය කළ "ලංකා ජය මහා ලේඛක" තනතුර ශිලාලේඛනවල හා ග්‍රන්ථවල ලක්මහ ලදන, ලක්මහලේනා, ලක්මහලන, ලක්මහලේ, මහලේ, මහ ලෙඛක, ලෙදරු ලෙයා ආදි ලෙසට පසු කාලීනව දක්නට ලැබිණ. ඉහත සාධක මත තේවා කුලිකයන් තම තේවා අතහැර ගොස් තිබෙන අතර අද වන විට දෛනිකව හා වාර්ෂිකව මෙන්ම සුවිශේෂී අවස්ථාවල දී සිදු කෙරෙන තේවා කිහිපයක් පමණක් ඉතිරිව පවතී. අතීතයේදී බෝධීන් වහන්සේට තේවා කටයුතු සඳහා පැමිණි දහඅට ශ්‍රේණියක බෝධිභාරක කුලිකයන් පසුකාලීනව සිදු වූ දේශපාලන, සමාජ, සංස්කෘතික ප්‍රවණතා හමුවේ තම මූලික අභිලාෂය වෙනස් කරගෙන ඇත. ඒ අනුව වර්තමානයේ දී ශ්‍රී මහා බෝධීන්වහන්සේ උදෙසා පැවැත්වෙන්නේ සීමාසහිත තේවා කිහිපයක් පමණක් බව නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පදඃ** ජය ශ්‍රී මහා බෝධිය, බෝධි භාරක කුලිකයන්, තේවාව, චලනත්වය, සංස්කෘතික ප්‍රවණතා

# හොරණ රජමහා විහාරයෙහි ඇති දුර්ලභ ගණයේ සඳකඩපහණක් පිළිබඳ අධ්‍යයනයක්

කරුණාසේන හෙට්ටිආරච්චි[1] | දිල්හානි දිල්රුක්ෂිකා[2]

**සාරසංක්ෂේපය**

ශ්‍රී ලාංකේය කැටයම් කලාවේ අග්‍රගණ්‍ය නිමැවුමක් ලෙස සඳකඩපහණ දැක්වීමට පුළුවන. අනුරාධපුර යුගයේ සිට මෑත යුගය දක්වා ක්‍රමිකව විකාශනය වී ඇති සඳකඩපහණ ආගමික මෙන්ම රාජකීය ගොඩනැගිලිවල දොරටු අලංකරණය සඳහා යොදා ගෙන ඇත. 19වන සියවස පමණ සිට මේ පිළිබඳ අධ්‍යයනය කළ කලා විචාරකයෝ ඒ පිළිබඳ විවිධ මත ඉදිරිපත් කළහ. මෙබඳු සඳකඩපහණ අතර දඹදෙණි හෝ ගම්පළ යුගය නියෝජනය කරන ඉතා දුර්ලභ ගණයේ සඳකඩපහණ කීපයක් බස්නාහිර පළාතට අයත් හොරණ රජමහවිහාරයෙන් හමුව ඇත. ඉන් එක් සඳකඩපහණක් හැඩයෙන් හා අන්තර්ගත කැටයම් අතරින් සුවිශේෂ වන හෙයින් ඒ සඳකඩපහණ පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම සම්මන්ත්‍රණ පත්‍රිකාවේ අරමුණයි. හොරණ රජමහවිහාර සඳකඩපහණෙහි කැටයම් සම්ප්‍රදායෙන් පිටපනින ලද්දේ ද? යන ගැටලුව පාදක කොට ලිඛිත මූලාශ්‍රය පරිශීලනය සහ ක්ෂෙත්‍ර අධ්‍යයන උපකාර කොට අධ්‍යයනයට ලක්කෙරිණි. මෙම සඳකඩපහණ ග්‍රැනයිට් පාෂාණයෙන් නිමවා ඇත. එහි දිග සෙ.මී 120ක් හා පලළ සෙ.මී. 115ක් පමණ වේ. දැනට නූතන ගොඩනැගිල්ලක් තුළ තැන්පත් කොට ඇති මෙය විහාර භූමියෙහි මුලින් පිහිටුවා තිබූ ස්ථානය අවිනිශ්චිතය. අර්ධකවාකාර හැඩයෙන් මිදුණු සඳකඩපහණ ආකෘතිකමය වශයෙන් ඝණ්ටාකාර හැඩයක් ගනී. එම හැඩයෙන්ම එහි අභ්‍යන්තර කොටස යන්තමින් උන්නතව සකසා එම කොටස පමණක් විචිත්‍රවත් ලෙස සැරසිලි ගන්වා ඇත. සඳකඩපහණෙහි කේන්ද්‍රගත මධ්‍ය කවයෙහි ආපසු හැරී බලන පක්ෂියෙකි. එය වටකොට නිර්මිත කවයක් සමාන්තර කොටස් නවයකට බෙදා ඇත් රූප 5ක්, ගජසිංහ රූප 2ක් හා මකර රූප 2ක් කැටයම් කර තිබීම විශේෂත්වයකි. ඉන් පිටත තීරුවෙහි පහතින් මධ්‍යගතව අන්නාසි මලකි. ඒ දෙපස මදක් විශාල සිංහ රූප දෙකකි. එම රූපවලට සමාන්තරව පිටු පසින් ගුරුළු රූප දෙකක්, සිංහ රුවට ඉහළින් නාගයෙකු හොටින් ඩැහැගත් තවත් ගුරුළු රූප දෙකක්, (එම තීරුවෙහි ම) හංස හා මකර රූප කීපයකි. මේවා කිසියම් අනුක්‍රමික රටාවකට යොදමින් යම් අර්ථයක් ප්‍රකාශ කිරීමට උත්සාහ ගත් බවක් පෙනී යයි. නූතන රයිගම් කෝරළයෙහි කොඩිය සඳහාද නාගයා කටින් ගත් ගුරුළු රුව එම සඳකඩපහණ ආශ්‍රයෙන් තෝරා ගෙන තිබීම සුවිශේෂ කරුණකි. මෙහි අන්තර්ගත කැටයම්වලට සම කළ හැකි කිසිදු සඳකඩපහණක් මෙතෙක් ලංකාවේ කිසිදු ස්ථානයකින් හමු ව නැත.

**මුඛ්‍ය පද :** සඳකඩපහණ, හොරණ රජමහා විහාරය, දඹදෙණි යුගය, ගුරුළු රූප

1. මහාචාර්ය, ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
hettiarachchikaru@yahoo.com
2. පර්යේෂණ නිලධාරි, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
arch.symposium.promo@gmail.com

# අලුත් බණ්ඩාර නමින් කිවුලෙගෙදර මොහොට්ටාල ඇදහීමෙන් ප්‍රකාශිත පානම ජනයාගේ උඩරට සම්භවය පිළිබඳ විමර්ශනයක්

අමරසිරි වික්‍රමරත්න[1]

**සාරසංක්ෂේපය**

මෙම පර්යේෂණයේ අරමුණ උඩරට කැරැල්ලෙන් පසුබට ජනතාව ආරක්ෂක සම්ප්‍රයෝගයක් වශයෙන් පානම ප්‍රදේශයේ ප්‍රතිස්ථාපන වීමේ දී සිදු වූ අලුත් බණ්ඩාර දේව ඇදහිල්ල පිළිබඳ සම්මර්ශනයකි. පර්යේෂණ ගැටලුව වන්නේ කිවුලෙගෙදර මොහොට්ටාල පානම දී අලුත් බණ්ඩාර ලෙස දෙවියෙකු ස්වරූපයෙන් පුනරුත්පත්තිය ලැබී ද? යන්නයි. පර්යේෂණ අභ්‍යුපගමය වන්නේ 'වීරයන් මිය ගිය පසු නෑ යකුන් හෝ දෙවිවරුන් වශයෙන් යළි උපදින බවට ජන විශ්වාසයක් ඇත' යන්න යි. පර්යේෂණ ක්‍රමවේදය ලෙස පානම ප්‍රදේශයේ ක්ෂේත්‍ර අධ්‍යයනය යොදා ගැනෙයි. සාහිත්‍ය විමර්ශනය සඳහා කිවුලෙගෙදර මොහොට්ටාල හා අලුත් බණ්ඩාර යන දෙදෙනා අරබයා ඇති ජනශ්‍රැති මෙන් ම ලිඛිත ව වාර්තා වී ඇති කවි මෙන් ම ප්‍රවාද ද උපයෝගී කර ගති. කිවුලේගෙදර මොහොට්ටාලගේ ආරක්ෂාව යටතේ බණ්ඩාර වැද්දන්ගේ පරපුරට අයත් කිවුලේගෙදර ප්‍රදේශයේ වැදි ප්‍රධානියා වූ කිවුලේගෙදර මොහොට්ටාල වලපනේ දිසාව තනතුර ද ලබා එහි කටයුතු කළ අතර පසු ව මහනුවර රාජධානියේ මොහොට්ටාල පදවියක් ද දැරුවේ ය. ඔහු කොකාගල ප්‍රදේශයේ දොරේ සාමිට ආරක්ෂාව ලබා දුන් අතර උඩරට කැරැල්ලට මහත් වූ දායකත්වයක් ලබා දුන්නේ ය. අනෙක් ජන ප්‍රධානීන් සමග අල්ලා හිස ගසා මරා දැමීමෙන් පසු ඔහු දේවත්වයට පත් කොට අදහන්නට යෙදුණි. කිවුලේගෙදර මොහොට්ටාල පුංචි අලුත් බණ්ඩාර ලෙසත් ඔහුගේ පියා අලුත් බණ්ඩාර ලෙසත් පිදුම් ලබයි (ඔබේසේකර, 2018 : 257 - 261). උඩරට කැරැල්ල මැඬපවත්වන විට පානමට පසු බැස ආ ජනතාව තමන්ගේ සමහර විශ්වාස නව භූගෝලීය ප්‍රදේශ කරා රැගෙන ආහ. කිවුලේගෙදර මොහොට්ටාල එසේ කැඳවා ගෙන ඒම අහම්බයක් නොවේ. ඔහු වීරවරයෙක් විය. ඔවුහු තෝරාගත් ඇදහිල්ල අතර අලුත් දෙවියන් තැබූහ. එම පානම අදහන අලුත් දෙවියන් කිවුලේගෙදර මොහොට්ටාල ය. ඒ පියා ද පුතා ද යන්න ඔවුන්ට වැදගත් නැත. දෙදෙනා ම එකල පිදුම් ලැබූහ. පානම උපසංස්කෘතියේ ආනුෂංගයක් වූ අං කෙළියේ දී අලුත් දෙවියන් පත්තිනිට ප්‍රමුඛ වෙයි. "අලුත උපන් දෙවියෝ කිවුලේගම - සලිත කෙරේ වඩිනවා දුටුව ම' යන පානම ව්‍යවහාර කවිය ද යට කී නාමද්වයෙහි අනුපූරක සහසම්බන්ධයට සාක්ෂ්‍යයක් වන අතර ඓතිහාසික මනුෂ්‍යයෙකු වන කිවුලේගෙදර ඓහලෞකිකත්වයට පත්ව ඇත" යන පර්යේෂණ ගැටලුවට 'ඔව්' යන පිළිතුර සාධනය කළ හැකිය.

**මුඛ්‍ය පද :** අලුත් දෙවියෝ, උඩරට කැරැල්ල, කිවුලේගෙදර මොහොට්ටාල, පානම උප සංස්කෘතිය

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය
amarasiriw@gmail.com

# Factors affecting the vocational Interest of the G.C.E. Advanced Level Students

E. Randeniya[1] , W.M.C.S Wijesinghe[2]

**Abstract**

It is being discussed that the education system in Sri Lanka is not career oriented. Career counselors confirm that students could perform successful career choice according to their interests through appropriate selection of subject streams in G.C.E (Advanced Level) examination. However the nominal number of researches was conducted in this respect. This research has been launched for recognizing the factors and challenges that affect the vocational interest of (Advanced Level) students. This research focuses on the identification of career interests of students who engage in studies in different subject streams based on the classification of schools in Sri Lanka. It further elaborate factors and challenges which affect career interests. A sample of 240 students from 8 schools situated in Kelaniya educational zone of Gampaha district in Western province was selected to perform this research. Career interests of the selected sample of students were recognized based on the John Holland's Career Choice Theory and the standard test called "Career Key" presented by Lawrence K Jones. Questionnaires and semi structured interview schedules were utilized for data collection. Data analysis was performed using quantitative oriented mixed method. Research revealed that majority of Advanced Level students are highly interested in realistic careers (40.8%) and enterprising (23.8%), investigative (17.9%), social (15%), artistic (1.7%) and conventional (0.8%) respectively. Research further discovered the career interests with factors affected and correlation between the career interests and challenges. Majority (97%) of students engage in studying the subject streams that supports their preferred careers whilst less opportunity available for rest (3%) to select preferred subject streams. Key challenges observed the lack of confidence to approach the preferred careers and the financial difficulties. Accordingly a formal strategic plan to be compiled by the responsible parties to extend the support to overcome the challenges face by students regarding their career interests.

***Key Words :*** *Career Interest, Factors, Challenges, Random Sampling*

---

1. Senior Lecturer, Department of Education Psychology, Faculty of Education, University of Colombo.
   *erandeniya@edphy.cmb.ac.lk*
2. Government Teacher.
   charithawijesinghe1@gmail.com

# සිංහල ජන සමාජයේ පවතින විවාහ සම්ප්‍රදායන් සම්බන්ධයෙන් වත්මන් නෛතික පිළිගැනීම පිළිබඳ අධ්‍යයනයක්

එස්. ආර්. එල්. රෝසා[1]


**සාරසංක්ෂේපය**

පුරුෂයෙකු හා ස්ත්‍රියක අතර ඇති වන අන්‍යෝන්‍ය බැඳීම පවුල් සංස්ථාවක් බවට පරිවර්තනය කිරීම විවාහය තුළින් සිදු වේ. විවාහය සඳහා වන සමාජීය පිළිගැනීම විවිධ ජාතීන් තුළ විවිධාකාරයෙන් සිදු වන අතර එහි දී ඔවුන්ගේ සංස්කෘතික අනන්‍යතාව ද විවාහ චාරිත්‍ර තුළින් ඉදිරිපත් වේ. විවාහ උත්සව, චාරිත්‍ර විධි, සම්ප්‍රදායන් අනුගමනය කරමින් විවාහය සඳහා එළැඹීම අතීතයේ සිට අද දක්වා ම සිංහල සංස්කෘතිය තුළ දක්නට ලැබේ. එහි දී චාරිත්‍රානුකූල විවාහ, සහවාසයෙන් සහ ප්‍රසිද්ධියෙන් වන විවාහ සඳහා නීතිය යටතේ නෛතික වලංගුභාවය ලැබෙන්නේ ද යන්න මෙම පර්යේෂණයේ දී අධ්‍යයනය කෙරේ. පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ගුණාත්මක දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය මත පදනම් ව වෛවාහක කටයුතු සඳහා අදාළ වන ව්‍යවස්ථා, නඩු තීන්දු අධ්‍යයනය කරනු ලබයි. විවාහයක් සිදු නොකොට ස්ත්‍රියක හා පුරුෂයෙකු කාලයක් තිස්සේ සමාජයේ එකට ජීවත්වීම තුළින් පවුල් සංස්ථාව ගොඩනගා ගන්නා අවස්ථාවල දී අධිකරණය එය සහවාසයෙන් සහ ප්‍රසිද්ධියෙන් වූ වලංගු විවාහයක් වශයෙන් පූර්ව නිගමනය කරන බව විජේසේකර එ. වැලිවිටිගොඩ නඩුවේ දී දක්වා ඇත. පසුකාලීන ව ගුණරත්න එ. පුංචිහාමි නඩුවේ දී අධිකරණයේ මතය වන්නේ එවැනි විවාහයක් වලංගු වීමට නම් අවම වශයෙන් චාරිත්‍ර සිදු කළ බවට සාක්ෂි අවශ්‍ය බව යි. 1907 අංක 19 දරන සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනත 46 වගන්තිය, විවාහය ලියාපදිංචි නොකිරීම විවාහයක වලංගුභාවයට බලපාන බව නොදක්වයි. පෝරුවේ චාරිත්‍ර ඉටු කිරීම, අත පැන් වත් කිරීම වලංගු චාරිත්‍ර බවත් එවැනි චාරිත්‍රානුකූල විවාහයක් සාමාන්‍ය නීතිය යටතේ ලියාපදිංචි නොකළ ද වලංගු බව සොපියා හාමිනේ එ. අප්පුහාමි නඩුවේ දී අධිකරණය තීරණය කර ඇත. 1952 අංක 44 දරන උඩරට විවාහ හා දික්කසාද පනත 3 (1) (a) වගන්තිය විවාහය ලියාපදිංචි කළ යුතු අතර 3 (1) (b) වගන්තිය ලියාපදිංචි නොකළ විවාහ අවලංගු වන බව දක්වයි. පොඩිනෝනා ඒ. හේරත්හාමි නඩුවේ දී විවාහය ලියාපදිංචි නොකළහොත් නෛතික වලංගුතාවක් නොලැබෙන බව අධිකරණය ප්‍රකාශ කර ඇත. ඒ අනුව සිංහල චාරිත්‍රානුකූල විවාහ සම්බන්ධයෙන් සාමාන්‍ය නීතිය සහ උඩරට නීතියේ ස්ථාවරය දෙයාකාර වන බව නිරීක්ෂණය කළ හැකි ය.


**මුඛ්‍ය පද:** සිංහල විවාහ සම්ප්‍රදායන්, සංස්කෘතිය, නීතිය, ව්‍යවස්ථා, වලංගුභාවය

1. ජ්‍යෙෂ්ඨාධිකරණයේ නීතිඥ, බාහිර කථිකාචාර්ය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.
ruchirarosa@gmail.com

# සිංහල සමාජයේ විවාහ මංගල පෝරු චාරිත්‍රයන් තුළින් නිරූපණය වන සමාජීය හරයන් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එස්. ආර්. ඒ. ආර්. ආර්. ලක්මාල්[1]

**සාරසංක්ෂේපය**

ඕනෑ ම සමාජයක යහපැවැත්ම සහ සංස්කෘතික අනන්‍යතාව පිළිබිඹු කරනු ලබන ප්‍රධාන සංකේතයක් ලෙස විවාහ චාරිත්‍ර වාරිත්‍ර පෙන්වා දිය හැකි ය. මෙම අධ්‍යයනය සිදු කිරීමට පෙර අපට ඇති වූ ගැටලුව වනුයේ සිංහල සමාජයේ විවාහ මංගල අවස්ථාවල දී සිදු කරන මංගල පෝරු චාරිත්‍රයන් සිදු කරනු ලබන්නේ හුදු චාරිත්‍රානුකූල අවශ්‍යතා සැපයීම සඳහා පමණ ද යන්න යි. ඕනෑ ම සමාජයක යහපැවැත්ම සහ සංස්කෘතික අනන්‍යතාව පිළිබිඹු කරන ප්‍රධාන සංකේතයක් ලෙස විවාහ චාරිත්‍ර වාරිත්‍ර පෙන්වා දිය හැකි ය. අනාදිමත් කාලයක පටන් පෙර අපර දෙදිගම සියලු ම ජන සමාජයන්හි මෙම විවාහ චාරිත්‍ර වාරිත්‍රවලට ප්‍රධාන ස්ථානයක් ලබා දෙයි. ඉන් ආසියානු කලාපයේ රටවල විවාහ චාරිත්‍ර සාපේක්ෂ ව වඩාත් උත්කර්ෂවත් ලෙසත් ගෞරවනීය ලෙසත් භක්ති සම්පන්නවත් සිදු කෙරෙනු දැකිය හැකි ය. ඒ අනුව සිංහල සමාජයෙහි ප්‍රධානතම විවාහ චාරිත්‍රමය අවස්ථාව මංගල පෝරු චාරිත්‍ර සිදු කරන අවස්ථාව යි. නමුත් අද වන විට ප්‍රධාන ම චාරිත්‍රයට ලබා දී ඇත්තේ අඩු සැලකිල්ලක් බව අප සැවොම දන්නා කරුණකි. කළ යුතු නිසා සිදු කරන හුදු චාරිත්‍රමය අවස්ථාවක් පමණක් ම බව සැලකීම එයට ප්‍රධානතම හේතුව යි. නමුත් ගැඹුරින් විමර්ශනය කරන කල්හි පැහැදිලි වන්නේ විවාහ මංගල පෝරු චාරිත්‍ර හුදු චාරිත්‍රයක් ම පමණක් නොවන බවත් ඒ හා බැඳි සමාජීය හර පද්ධතියක් පවතින බවත් ය. වර්තමානයේ බුද්ධිමත් පරම්පරාවට එම හර පද්ධතීන්වල අගය වටහා දී සිංහල සමාජයේ පෝරු චාරිත්‍රයට හිමි විය යුතු ගෞරවය අත් කර දීම මෙම පර්යේෂණයේ අරමුණ යි. මෙහි දී ප්‍රධාන වශයෙන් සහභාගීත්ව නිරීක්ෂණය සහ සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් පර්යේෂණය සිදු කළ අතර එහි ප්‍රතිඵල ලෙස සිංහල විවාහ මංගල පෝරු චාරිත්‍ර හා බැඳි සමාජීය හරයන් ගණනාවක් තිබෙන බවත් සෑම චාරිත්‍රයක් ම සිදු කරන්නේ විවාහයෙන් පසු ගෙවන අඹු සැමි ජීවිතයට අවශ්‍ය උපදේශයක් සිදු කරමින් ම බවත් හෙළි විය. ඒ අනුව සිංහල සමාජයේ විවාහ චාරිත්‍ර අතර ප්‍රධාන මංගල පෝරු චාරිත්‍ර සිදු කරන්නේ හුදෙක් චාරිත්‍රමය අවශ්‍යතා සපුරාලීම සඳහා පමණක් ම නොවන බවත් ඒ සෑම චාරිත්‍රයක් ම හා බැඳි සමාජීය හරයක් පවතින බවත් නිගමනය කළ හැකි ය.

**මුඛ්‍ය පද :** පෝරු චාරිත්‍ර, සිංහල විවාහ චාරිත්‍ර, ජනශ්‍රැතිය, සමාජීය හරයන්, පවුල් උපදේශනය

1. බාහිර කථිකාචාර්ය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
rehansenadheera@gmail.com

# සලාගම ජන වංශය හා සබැඳි කිරිපොහොය ශාන්තිකර්මය පිළිබඳ අධ්‍යයනයක්

පී.ඩබ්.ටී. ඩයන්[1]

**සාරසංක්ෂේපය**

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ අම්බලන්ගොඩ නගරය දෙපස ගම්මාන කිහිපයක ජනතාව අතර ප්‍රචලිත දේව පූජා ක්‍රමයකි, කිරිපොහොය ශාන්තිකර්මය. සෑම වර්ෂයකම ඇසළ හෝ නිකිණි පොහොය කේන්ද්‍ර කරගනිමින් මෙම ශාන්තිකර්මය පැවැත්වේ. අම්බලන්ගොඩ නගරයට බටහිරින් වූ බලපිටිය නගරයට අයත් බ්‍රාහ්මණවත්ත, මෝදරවත්ත, වැලිසර, කෝද්දූව ආදි ගම්මානවලද නැගෙනහිරින් වූ ඌරාවත්ත, මාදම්පාගම, කුලීගොඩ, රත්ගම ආදි ගම්මානවලද මෙම යාතුකාර්මික චාරිත්‍රය ඉටු කෙරේ. මෙම ප්‍රදේශවල ගැමියන් සලාගම ජන වංශයට අයත් වේ. ඒ අනුව මෙම පර්යේෂණයේ මූලික අරමුණ වන්නේ තද් ශාන්තිකර්මය සලාගම කුලකයට පමණක් ආවේණික ශාන්තිකර්මයක්ද යන්න විමසා බැලීමයි. මානව වංශ පර්යේෂණ යටතට ගැනෙන මෙම අධ්‍යයනයට දත්ත එක්රැස් කිරීම සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදා ගැනිණ. පර්යේෂණ නියැදිය ලෙස උක්ත නම් සඳහන් ගම්මාන යොදා ගත් අතර 2014 හා 2015 යන වර්ෂවලදී ජූලි හා අගෝස්තු මාසවල පැවති කිරිපොහොය ශාන්තිකර්මයට අදාළ චාරිත්‍ර නිරීක්ෂණය කළේය. එම ගම්මානවල වෙසෙන ජනයා අතරින් තෝරා ගත් පුද්ගලයන් පනස් දෙනෙකු සහ ගම්මාන ආශ්‍රිතව ක්‍රියාත්මක පත්තිනි හා කතරගම දේවාල පහක කපු මහතුන් පස්දෙනෙකු සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වා දත්ත එක්රැස් කර ගැනීම සිදු කෙරිණි. මෙම ශාන්තිකර්මය පැවැත්වෙන ඇසළ පොහොය දිනය ශුද්ධ පොහොය, සුද්ද පොහොය, කිරිපොහොය යනාදි නම්වලින්ද ජනතාව අතර ව්‍යවහාර වන්නේ තද් ශාන්තිකර්මය නිසාය. තම නිවෙස්වල මුළුතැන්ගෙය හා බද්ධ චාරිත්‍ර වාරිත්‍ර රැසක් ඉටු කෙරෙන මෙම ශාන්තිකර්මයේ මුඛ්‍ය චාරිත්‍රය වන්නේ ''කිරි කැකෑරුම්'' පිසීම හෙවත් හාල්කිරි පිසීමයි. සෑම නිවසකම ඉදිරිපිට ඉදි වන මල් යහනක සකස් කර ගත් පූජා ද්‍රව්‍ය තබා දෙවියන් පිදීම සිදු කොට පවුලේ සියලු දෙනා එක්ව සකස් කොට ගත් ආහාර අනුභව කරති. ඉඳුල් කට නොගෑ ළදරුවන්ට මෙම දිනයේදී ඉඳුල් කටගෑම සිදුවේ. පසුදින ගම්මානයේ පත්තිනි දේවාලය කේන්ද්‍ර කර ගනිමින් මෙම ශාන්තිකර්මයට අදාළ චාරිත්‍ර රැසක් ඉටු කරන උත්කර්ෂවත් සැණකෙළියකි. මෙම ශාන්තිකර්මයේ වැදගත්කම වන්නේ ඊටම ආවේණික ජනශ්‍රැතියක් ඒ තුළ දක්නට ලැබීමයි. භාෂා ව්‍යවහාර, ජන ක්‍රීඩා, චාරිත්‍ර වාරිත්‍ර, දේව සංකල්ප, ආහාර පුරුදු, ද්වාර කර්ම චාරිත්‍ර, ජීවනෝපාය, කුල ක්‍රමය, ආගම හා අභිචාර ආදි සංස්කෘතික ලක්ෂණවල ආවේණිකතා රැසක් ප්‍රකට කරවන

1. ආරාධිත කථිකාචාර්ය, කලා සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
thomsondin@gmail.com

කිරිපොහොය ශාන්තිකර්මය සලාගම ජන වංශයේ ජනයා සතු හරවත්කම් වටිනාකම් මෙන්ම මානව ධර්මතාවලින්ද උපලක්ෂිත සංස්කෘතිකාංගයකි.

**මුඛ්‍ය පද :** කිරි පොහොය, සලාගම කුලය, කිරි කැකෑරුම්, ඉඳුල් කටගෑම, මධුතෝත්‍ර

# පුරාතන ලංකාවේ ඔත්තු සේවය

එච්.එම්. ඉසුරු හේරත්[1]

**සාරසංක්ෂේපය**

පුරාතනයේ සිට වර්තමානය දක්වා දීර්ඝ කාල පරිච්ඡේදය තුළ ලෝකයේ බොහෝ රටවල්, ස්වකීය රාජ්‍යය බාහිර සහ අභ්‍යන්තර ප්‍රශ්නවලින් මුදවා ගෙන ස්ථාවරව පවත්වා ගෙන යාම සඳහා ක්‍රමවත් ඔත්තු සේවාවක් පවත්වාගෙන යාමට උත්සහ කළහ. මෙම අධ්‍යයනයේ අරමුණ පුරාතන ශ්‍රී ලංකාවේ ඉතා දියුණු ඔත්තු සේවා පැවති බවට සාධක හඳුනා ගැනීමය. මෙම අධ්‍යයනයට අවශ්‍ය දත්ත රැස්කිරීමේදි පුස්තකාල පර්යේෂණ ක්‍රමය භාවිත කෙරිණි. එසේම මහාවංශය වැනි ප්‍රාථමික මූලාශ්‍රය මෙන්ම පුරාතන යුගයේ ලංකාවේ ඔත්තු සංවිධානයට අදාළව පර්යේෂණ පැවැත්වූ උගතුන්ගේ වාර්තාද බහුල වශයෙන් භාවිත කළ අතර පසුව ඒවා විශ්ලේෂණය කෙරිණි. මහාවංශයට අනුව ක්‍රි.පූ. 2දී කාවන්තිස්ස රජුගේ සේනාපතිවරයෙකු වූ වේළුසුමන නමැත්තා එළාරගේ අශ්ව සේනාවේ භාරකරු ළඟ ඔත්තුකරුවෙකු වශයෙන් සේවය කොට ඇත. වෝහාරතිස්ස රජුට බියෙන් ඉන්දියාවට පලා ගිය ඔහුගේ සොහොයුරු අභයනාග කුමාරයා සුභදේව නමැති පුද්ගලයා වෝහාරතිස්ස රජු ළඟ ඔත්තුකරුවෙකු වශයෙන් සේවයේ යොදවා ඇත. හෙතෙම අහිංසක රජු සහ මහජනතාව අතර මිත්‍රත්වය බිඳ දැම්මට කටයුතු යෙදීය. සීගිරි කාශ්‍යප රජතුමා ඉන්දියාවේ සිටි ස්වකිය සහෝදර මුගලන් මරා දැමීම සඳහා ඔත්තුකරුවෙකුගේ වේශයෙන් රාජකීය අරක්කැමියා සහ අස්ගොව්වා යැවීය. පළමුවන විජබාහු කුමරුද චෝළ විරෝධි සටනේදී පොලොන්නරුව මුදවා ගැනිම සඳහා රවිදේව, චල නම් ඔත්තු සේවා ප්‍රධානීන් දෙදෙනෙකු යොදවා තිබේ. පළමුවන පරාක්‍රමබාහු රජතුමාද ලංකාවේ එක්සත් කිරීමේදී ඉතා දියුණු ඔත්තු සේවාවක් පවත්වාගෙන ගොස් ඇත. ඒ සඳහා හෙතෙම විවිධාකාර වෙස් ගැන්වූ ඔත්තුකරුවන් පොදු ජනතාව වෙත යවා ඇත. මහනුවර යුගයේදී උඩරට රජධානිය තුළ මෙවැනි දියුණු ඔත්තු සේවාවක් පැවති බවට සාධක ඇත. විශේෂයෙන්ම ගරිල්ලා සටන් ක්‍රම හා සබැඳි ඔත්තු සංඥා ක්‍රම පැවතිණි. ඒ අතර පක්ෂීන් හෝ විවිධ සත්ව හඬවල් අනුකරණ කරමින් මුඛයෙන් ශබ්ද නැගීම, හූ කීම, සක් පිඹීම, යුද බෙර වාදනය, හොරණෑව පිඹීම සහ ගිනි ගොඩවල් ගැසිම වැනි සංඥා ක්‍රම පැවතිණි. යම් හෙයකින් සතුරු සේනා පැමිණෙන ආකාරය නිරික්ෂණය වුවහොත් ඔත්තුකරුවන් විසින් බැලුම්ගල මුදුනේ ගිනි ගොඩක් දල්වන ලදී. බැලුම්ගලට අමතරව ඔත්තුකරුවන් සපයන වැදගත් තොරතුරු තල් පතක ලියා පසුව ඊ තලයක බැඳ විදින ලදී. මේ අනුව පෙනි යන්නේ පුරාතන ලංකාවේ දියුණු ඔත්තු සේවයක් හෙවත් චරපුරුෂ සේවයක් පැවති බවයි.

**මුඛ්‍ය පද :** ඔත්තු සේවාව, ප්‍රභූවරු, හොරණෑව, බැලුම්ගල, ඔත්තුකරුවා

1. සහකාර පුස්තකාලයාධිපති, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
isuruhistory@gmail.com

# ශ්‍රී ලංකාවේ සහ චීනයේ පුර පසළොස්වක දින සැමරුම් පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

Huang Yuxuan[1]

**සාරසංක්ෂේපය**

ලෝකයේ විවිධ රටවල්වල පුර පසළොස්වක දින වෙනුවෙන් පවත්වන විවිධ උත්සව දක්නට ලැබේ. පුර පසළොස්වක දිනය ආගම් හා සම්බන්ධ වූ අතර එය ජාතික චාරිත්‍ර හා බැඳුණු මාතෘකාවකි. මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් උත්සව ප්‍රභවය හා සිරිත් විරිත් යන දෙඅංශයෙන් ශ්‍රී ලංකාවේ හා චීනයේ පුර පසළොස්වක දිනවල පැවැත්වෙන උත්සව පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් සිදු කෙරේ. ශ්‍රී ලංකාවේ පසළොස්වක පොහොය දොළහ සහ වෙසක් උත්සවය, චීනයේ පූර්ණ චන්ද්‍රයා පිළිබඳ උත්සව අට සහ චීන ලන්තෑරුම් උත්සවය සහ ශ්‍රී ලංකාවේ සහ චීනයේ පුර පසළොස්වක දින සංසන්දනය කිරීම යන අරමුණුවලට අදාළ ව පර්යේෂණය සිදු කෙරිණි. මෙහි දී ග්‍රන්ථ පරිශීලනය සහ සම්මුඛ සාකච්ඡා මගින් දත්ත සපයා ගන්නා ලදී. ආගමික විද්‍යාව, ජනප්‍රවාද විද්‍යාව සහ මානව විද්‍යාව යන අධ්‍යයන ක්ෂේත්‍ර ආවරණය කරමින් පර්යේෂණ සිදු කෙරිණි. ශ්‍රී ලංකාවේ වසරක් තුළ බක්, වෙසක්, පොසොන්, ඇසළ, නිකිණි, බිනර, වප්, ඉල්, උඳුවප්, දුරුතු, නවම් හා මැදින් යන මාස දොළහක් හෙවත් පොහොය දොළහක් හෝ දහතුනක් යෙදේ. චීනයෙහි පසළොස්වක උත්සව පද්ධතියේ සංකල්පයක් නැතත් චන්ද්‍රයාට මුල්තැන ලබා දෙන බව චීන ජාතිකයන්ගේ පොදු මතයක් වන බැවින් චන්ද්‍ර උත්සව පද්ධතිය යන ජන කියමනක් සොයාගත හැකි ය. චීන ජන කියමන් පරිදි චන්ද්‍ර උත්සව පද්ධතියෙහි පළමුවන මස ලන්තෑරුම් උත්සවය, දෙවන මස මල් දෙවි උත්සවය, සතරවන මස වෙසක් උත්සවය, පස්වන මස මහා මකර බෝට්ටු උත්සවය, සයවන මස මැද වසර උත්සවය, හත්වන මස සොල්මන් උත්සවය, අටවන මස මැද සරත් ඍතු උත්සවය, දසවන මස ජල දෙවි උත්සවය යනුවෙන් උත්සව අටක් තිබේ. මෙම උත්සව එකිනෙකට නොබැඳි ඒවා වූ අතර එහි ප්‍රභවයන් හා සිරිත් විරිත් අතර විශාල වෙනස්කම් දැකිය හැකි ය. ශ්‍රී ලංකාවේ සහ චීනයේ උත්සව සංස්කෘතිය මඟින් දෙරටට ආවේණික සමාජයීය ජීවිතය පිළිබිඹු වේ. ශ්‍රී ලංකාවට සාපේක්ෂව වර්තමාන චීන ජනතාව සාම්ප්‍රදායික උත්සවයන්ට ප්‍රමාණවත් අවධානයක් යොමු නොකරන බව සහ ආවේණික සිරිත් විරිත් ක්‍රමයෙන් අභාවයට යන බව පැහැදිලි විය.

**මුඛ්‍ය පදඃ** ශ්‍රී ලංකාවේ දොළොස් පොහොය, වෙසක් උත්සවය, චීනයේ පුර පසළොස්වක දින, ලන්තෑරුම් උත්සවය

---

1. MA Candidate, Department of Sinhala, School of Asian Studies, Beijing Foreign Studies University, China
sangeethaa2014@163.com

# දේශීය බුද්ධ ප්‍රතිමා කලාව පිළිබඳ ශාරිපුත්‍රයෙහි එන උපදේශ පිළිබඳ අධ්‍යයනයක්

ඉවන්තා සඳුනි ජයසේන[1]

**සාරසංක්ෂේපය**

මංජු ශ්‍රී භාෂිත වාස්තු විද්‍යා - ශාස්ත්‍ර හෙවත් චිත්‍රකර්ම ශාස්ත්‍රය හා ශාරිපුත්‍රය හෙවත් බිම්බමානය බුද්ධ ප්‍රතිමා මාන ක්‍රම සම්බන්ධයෙන් විධිමත් අධ්‍යයන සිදු කොට ඇති වැදගත් ශිල්ප ග්‍රන්ථ දෙකකි. විද්‍යමාන සාක්ෂ්‍ය අනුව මෙම කෘති ද්විත්වයම ශ්‍රී ලංකාවෙන් හමු වී ඇති බව පිළිගැනේ. ශාරිපුත්‍රය කෘතිය 11වැනි හෝ 12වැනි සියවසේ රචනා කර ඇත. දේශීය බුද්ධ ප්‍රතිමා කලාව පිළිබඳ ශාරිපුත්‍රයෙහි එන උපදේශ කවරේද? යන ගැටලුව මුල් කර ගනිමින් සිදු කළ මෙම පර්යේෂණයේ මූලික අරමුණ වූයේ දේශීය බුද්ධ ප්‍රතිමා කලාව පිළිබඳ ශාරිපුත්‍රයෙහි එන උපදේශ පැහැදිලි කිරීමයි. දේශීය බුද්ධ ප්‍රතිමා කලාව පිළිබඳ ශාරිපුත්‍රයෙහි එන උපදේශවල උපයෝගිතාව හඳුනා ගැනීම පර්යේෂණයේ අනු අරමුණක් විය. එම අරමුණු ඉටු කර ගැනීම සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ පුස්තකාලය පරිශීලනය කොට දත්ත රැස්කර එම දත්ත විස්තරාත්මක ක්‍රමය උපයෝගී කර ගනිමින් විශ්ලේෂණය කරන ලදී. බුද්ධ ප්‍රතිමා මාන විධි පිළිබඳ සඳහන් ග්‍රන්ථයක් වශයෙන් බිම්බමාන හෙවත් ශාරිපුත්‍රය හැඳින්විය හැකිය. ලාංකේය ප්‍රතිමා ශිල්පීන්ගේ අත් පොතක් වශයෙන් සැලකෙන මෙම කෘතිය ශ්ලෝක ග්‍රන්ථයකි. සන්නයකින්ද යුක්ත වේ. මාන, ප්‍රමාණ හා උපමාන ආදි මිනුම් විස්තරාත්මකව දක්වා ඇත. ශාරිපුත්‍රයෙහි දේශීය බුද්ධ ප්‍රතිමා කලාව පිළිබඳ උපදේශ දක්වා ඇත. ඒ අනුව හිඳි, හිටි හා ඔත් යනුවෙන් ප්‍රතිමා වර්ග තුනකි. රන්, තඹ, මැටි, සිලා, ලී, ගඩොලු සහ සුණු ආදි ද්‍රව්‍ය පිළිම සෑදීමට භාවිත කළ හැකි බව දක්වා ඇත. අල්ප ප්‍රතිමා, අධම ප්‍රතිමා, මධ්‍යම ප්‍රතිමා හා උත්තම ප්‍රතිමා වශයෙන් උස අනුව බුද්ධ ප්‍රතිමා වර්ග කර ඇත. පිළිම සෑදීම වඩාත් නිවැරදිව කළ යුතු බව දක්වා ඇත. නැතහොත් එය ශිල්පියාට, පවුලට හා රටට වශයෙන් හානි ගෙන දෙන බවද දක්වා ඇත. නිවැරදිව ප්‍රතිමා නිර්මාණය දිගාසිරි වර්ධනයට හේතු වන බව දක්වා ඇත. තවද පැරණි ප්‍රතිමා ශිල්පීහු මෙම ප්‍රතිමා මාන ශාස්ත්‍රද ඉගෙන ගත්හ. ඒවා ස්වකීය නිර්මාණ විෂයෙහිද යොදා ගෙන ඇත. පොලොන්නරු යුගයෙන් පසු නිර්මාණය වූ බුද්ධ ප්‍රතිමා අධ්‍යයනයෙන් ඒ බව ප්‍රකට වේ. ඒ අනුව ශාරිපුත්‍රය තුළ දේශීය බුද්ධ ප්‍රතිමා කලාවකට උපදේශ දක්වමින් විශිෂ්ට දේශීය බුද්ධ ප්‍රතිමා කලාවක් නිර්මාණය කර ඇති බව නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද:** බුද්ධ, ප්‍රතිමා, දේශීය, ශාරිපුත්‍රය, උපදේශ

1. සහකාර කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණි විශ්වවිද්‍යාලය
iwanthasanduni@gmail.com

# උඩරට නර්තනයේ පා සරඹ අභ්‍යාස කිරීමෙහිලා දණ්ඩිකඳ යොදා ගැනීමේ අවශ්‍යතාව පිළිබඳ අධ්‍යයනයක්

එල්.ඒ.වී. රංගික ජීවන්ත[1]

**සාරසංක්ෂේපය**

ගුරුකුල අධ්‍යාපන ක්‍රමය මූලික කොටගත් උඩරට නර්තන සම්ප්‍රදායෙහි පා සරඹ අභ්‍යාස කිරීමට දණ්ඩිකඳ අනිවාර්ය මෙවලමක් ලෙස භාවිතයට ගත්ත ද වර්තමානය වන විට එය භාවිතයෙන් සම්පූර්ණයෙන්ම ඈත් ව ගොස් ඇති බවක් දක්නට ලැබේ. ඊට කාලානුරූපී ව විවිධ හේතු බලපාන ලද බව පර්යේෂණයේ දී සනාථ විය. දණ්ඩිකඳෙහි පා සරඹ අභ්‍යාස කිරීමේ දී උඩරට නර්තනයෙහි පාද ප්‍රයෝගවල නිරවද්‍යතාව ඉහළ අගයක පවතින බව තහවුරු කර ගැනීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ යි. උඩරට නර්තනයේ පා සරඹ අභ්‍යාස කිරීමෙහිලා දණ්ඩිකඳ භාවිත කිරීම වැදගත් වන්නේ ද යන්න පර්යේෂණ ගැටලුවයි. ආධුනික නර්තන ශිල්පියාගේ සිට වෘත්තීය නර්තන ශිල්පියා දක්වා දණ්ඩිකඳෙහි පා සරඹ අභ්‍යාස සිදු කොට, ශරීරය උණුසුම් කර ගැනීමෙන් පසු නර්තනයේ යෙදීමේ දී පහත සදහන් ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීමට හැකියාව ලැබේ. ශාරීරික සමබරතාව රැක ගනිමින් දිගු වේලාවක් නර්තනයේ යෙදීමට ඇති කාය හැකියාව වර්ධනය වීම, දීර්සකාලීන ව නර්තනයේ යෙදීමේ දී පාද ආශ්‍රිත ව ඇතිවන අතුරු ආබාධ අවම කර ගැනීමට හැකිවීම, පාදවල මාංශ පේෂීන්ගේ ශක්තිමත් බව සහ පිරිපුන් බව වර්ධනය කර ගැනීමේ හැකියාව මෙන් ම සාමූහික නර්තන අවස්ථා ඒකමතික ව සහ වර්ධනය කර ගැනීමේ ඇති හැකියාව ද ලැබේ. මෙය නර්තනයේ චලන විද්‍යාත්මක පදනම මත සහ මූලික සිද්ධාන්ත මත සිදු කෙරෙන පර්යේෂණයකි. ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍රය යටතේ පුස්තකාල පරිශීලනය ද ක්ෂේත්‍ර අධ්‍යයනය කරමින් ද දත්ත ගවේෂණය සිදු කෙරිණි. එසේ ම දැනට නර්තන කලාවේ නියුතු ප්‍රවීණයන් පස්දෙනෙකු සමග සම්මුඛ සාකච්ඡා පවත්වමින් ද, සහභාගීත්ව නිරීක්ෂණයෙන් ද තොරතුරු රැස් කර ගන්නා ලදී. එම දත්ත විශ්ලේෂණය ගුණාත්මක අධ්‍යයන ක්‍රමවේදය යටතේ සිදු කෙරිණි. දණ්ඩිකඳෙහි පා සරඹ අභ්‍යාස කිරීම නැවත උඩරට නර්තන සම්ප්‍රදායෙහි ස්ථාපිත කිරීම හරහා මූලික පාද ප්‍රයෝගවල අවිනිශ්චිත තත්ත්වයන් නැති කොට නිරවද්‍යතාව තහවුරු කර ගැනීමට හැකියාව ලැබෙනු ඇති බව නිගමනය විය.

**මුඛ්‍ය පද :** දණ්ඩිකඳ, පා සරඹ, උඩරට නර්තන සම්ප්‍රදාය, පාද ප්‍රයෝග, නර්තන ශිල්පියා

---

1. පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
rivegadance@gmail.com

# සිංහල ජන වහරෙහි බෞද්ධාගමික ආභාසය පිළිබඳ අධ්‍යයනයක්

ඉවන්තා සඳුනි ජයසේන[1]

**සාරසංක්ෂේපය**

සෙනරත් පරණවිතාන පෙන්වා දෙන ආකාරයට ප්‍රාග් බෞද්ධ ලංකාවේ විවිධ ඇනිමිස්ටික් ඇදහිලි ක්‍රියාත්මක විය. මහින්දාගමනයත් සමග එම පූර්ව ඇදහීම් බුදු දහම හා සුසංයෝගී විය. ඒ අනුව බෞද්ධ සංකල්ප සමග අධි මානුෂික ඇදහීම් මිශ්‍ර වී ජනප්‍රිය සිංහල බුදු දහම බිහි වී ඇත. මෙම අධ්‍යයනයේදී බෞද්ධාගම යනුවෙන් අදහස් කරන්නේ පොදු ජනයා අතර පවතින යට කී සිංහල බුදු දහමයි. ඒ ආශ්‍රිත සාම්ප්‍රදායික යෙදුම්වලින් සිංහලය පොහොසත්ය. එහෙත් මෙහිදී එකී සියලු ක්ෂේත්‍ර ගැඹුරින් අධ්‍යයනය නොකරන අතර වචන කෝෂය පමණක් පුළුල්ව අධ්‍යයනය කෙරේ. සිංහල ජන වහරෙහි එන වචන කෝෂය කෙරෙහි බෞද්ධාගමික ආභාසය කෙබඳුද යන ගැටලුව මුල් කර ගනිමින් සිදු කළ මෙම පර්යේෂණයේ මූලික අරමුණ වූයේ සිංහල ජන වහරෙහි එන වචන කෝෂය කෙරෙහි බෞද්ධාගමික ආභාසය පුළුල්ව විමසීමයි. සිංහල ජන වහරෙහි එන ප්‍රස්තාව පිරුළු, රූඪී හා උපමා කෙරෙහි බෞද්ධාගමික ආභාසය සැකෙවින් හඳුනා ගැනීම අනු අරමුණක් විය. එම අරමුණු ඉටු කර ගැනීම සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ පුස්තකාලය පරිශීලනය කොට දත්ත රැස්කර එම දත්ත විස්තරාත්මක ක්‍රමය උපයෝගී කර ගනිමින් විශ්ලේෂණය කරන ලදී. පොදු ජන විඤ්ඤාණගත ආගමික සංකල්ප වෙතින් පෝෂණය වූ ජන වහර, මූලික වශයෙන් සිවු වැදෑරුම්ය. එනම්; ථෙරවාදී බුදු දහමේ අභිධර්මානුගත සංකල්ප ආශ්‍රිත ජන වහර, බුද්ධ චරිතය ආශ්‍රිත ජන වහර, බෞද්ධ සාහිත්‍යගත සංකල්ප ආශ්‍රිත ජන වහර හා ජනප්‍රිය බුදු දහමෙහි අධි මානුෂික බලවේග ආශ්‍රිත ජන වහර යනුවෙනි. සංසාරේ, කරුමේ, තණ්හාසෙ, බෝධිසත්තය, දේවදත්තය, වෙස්සන්තර, කාලගෝල, මූසිලයා, බුදු අම්මෝ, පෙරේතය වැනි වචන නිදසුන් වශයෙන් දැක්විය හැකිය. සිංහල ජන විඤ්ඤාණය තුළ බුද්ධත්වය හා නිර්වාණය වැනි ලෝකෝත්තර සංකල්ප පවා ලෞකිකකරණය වී ඇත. කෘත්‍යමය ශක්‍යතාව අනුව සංස්කෘතියට නව සංකල්ප අන්තර්ග්‍රහණය කර ගැනීම හා අඛණ්ඩව පවත්වා ගැනීම සිදු වී ඇත. මෙම නම්‍යශීලීත්වය ථෙරවාද ධර්මයේ මෙන්ම මෙරට ආගමික සංස්කෘතියේද පැවැත්ම සඳහා අන්‍යෝන්‍ය වශයෙන් ඉවහල් වී ඇත. ඒ අනුව සිංහල ජන වහරට ජනප්‍රිය සිංහල බුදු සමයෙහි ආභාසය ලැබී ඇත. එහිදී එකම වදන අවස්ථාවෝචිතව නානාර්ථ නංවමින් ව්‍යවහාර කිරීමේ ශක්‍යතාව, ගැමියන්ගේ නිර්මාණශීලීත්වය මෙන්ම භාෂාවේ ගතික ස්වභාවයද ප්‍රකට කරන බව නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද:** සිංහල, ජන වහර, බෞද්ධාගමික, ආභාසය, ජනප්‍රිය

---

1. සහකාර කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණි විශ්වවිද්‍යාලය
iwanthasanduni@gmail.com

# සම්ප්‍රදායික ලාක්ෂා කර්මාන්තය සහ ඉන් පිළිබිඹු වන සමාජ ස්තරායනය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් (මහනුවර යුගයේ පාරම්පරික ලාක්ෂා කර්මාන්තය ඇසුරෙන්)

ඩබ්.එම්.සී.ඩී. වනසිංහ[1]

**සාරසංක්ෂේපය**

සමාජීය සත්ත්වයෙකු ලෙස ඕනෑ ම පුද්ගලයෙකුට එකී සමාජ සන්දර්භය තුළ ජීවත් වීමට දිශානතිය පිළිබිඹු කරනු ලබන සමාජ කාරණා රැසක් බලපායි. ආර්ථික, සමාජීය, දේශපාලන සහ ආගමික කරුණු හෝ අනෙකුත් දක්ෂතා, හුරු පුරුදු, සාරධර්ම, චින්තන පද්ධතිය, කලාශිල්ප යනාදිය සංස්කෘතිය ලෙස නියෝජනය වේ. ලාංකේය ඉතිහාසයෙන් අපට දායාද වූ සංස්කෘතික වටිනාකම් ඊට නිදසුන් වේ. අතීත ශ්‍රී ලංකාවේ විවිධ තාක්ෂණික සහ කලාශිල්ප සම්ප්‍රදායන් පැවති අතර ලාක්ෂා කර්මාන්තය ඉන් සුවිශේෂී වේ. ලාක්ෂා කර්මාන්තයේ විශේෂ ප්‍රවර්ධනයක් ඇති වන්නේ දුමින්දාගමනයත් සමග පැමිණි අටළොස් කුල ශිල්පීන්ට සම්බන්ධ ව බව ඉතිහාසයේ දැක්වේ. බෞද්ධ ආකල්පවලින් එම කර්මාන්තය විචිත්‍රණය වීම ද එයට හේතුවයි. ලාක්ෂා යනු සංස්කෘත වදනකි. ලාකඩ කර්මාන්තය ලෙස හඳුන්වන එය නියපොතු වැඩ සහ පට්ටල් වැඩ ලෙස කොටස් දෙකකි. මහනුවර යුගයේ සමාජ විෂමතාව කෙරෙහි ලාක්ෂා කර්මාන්තයේ වූ සංස්කෘතිකාංග මඟින් කුල පදනමේ බලය ක්‍රියාත්මක වීම මෙමඟින් විවරණය කෙරේ. මූලාශ්‍රයගත තොරතුරු, පොත්පත්, සඟරා, අනතර්ජාල සහ විද්වත් කතිකා පහක් ආශ්‍රයෙන් සම්පත් දායකයන් යොදා ගෙන ගුණාත්මක අධ්‍යයනයක් සිදු කිරීමට අපේක්ෂිත ය. බෞද්ධ පන්නරයක් සමඟ දේශීය කුල සම්ප්‍රදාය තුළ ගෞරවාන්විත කාර්යයක් ලාක්ෂා කලා ශිල්පීන් ඉටු කළ ද, මහනුවර යුගයේ වැඩවසම් සමාජ ක්‍රමය හමුවේ පීඩිත පිරිසක් බවට සහ කුලහීනයන් බවට පත්වීමත් සමඟ මෙම ශිල්පීය ක්‍රම පිරිහීමට පත්වූ බවක් පෙනේ. කුලීනයන් සැමවිට ම තම අවශ්‍යතා සපුරා ගැනීමට පමණක් මෙම ශිල්පීන් භාවිත කර සමාජයෙන් ඈත්කර කර තිබීම වැනි සමාජමය බලපෑම් ඊට හේතුවයි. මෙම කර්මාන්තය පිරිහීම කෙරෙහි කුලය වැනි තත්වයන් ප්‍රබල සමාජ කාරණාවක් ලෙස බලපෑ බව මහනුවර යුගයේ සමාජ ස්තරායනය අවබෝධ කර ගැනීමේ දී සම්පූර්ණයෙන් බැහැර කළ නොහැකි ප්‍රපංචයක් බවට පත් වන අයුරු මෙම සමාජ විද්‍යාත්මක අධ්‍යයනය තුළින් විවරණය කෙරේ.

**මුඛ්‍ය පදඃ** ලාක්ෂා කර්මාන්තය, මහනුවර යුගය, සමාජ ස්තරායනය, කුලය

---

1. වැඩ සටහන් නිවේදිකා, ස්වාධීන රූපවාහිනී සේවය
chamikawanasinghe93@gmail.com

# පබ්බතාරාම ආශ්‍රිතව හඳුනාගත හැකි බෞද්ධ ආරාම සංවිධානයේ සංවිධිත බව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

යූ.ඩී.ආර්. ෂෙහාන් තිලකරත්න[1]

**සාරසංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ බෞද්ධ විහාරාරාම සංකීර්ණ අතර ක්‍රි.ව. 5, 6 සියවස්වලදී පමණ කැපී පෙනෙන බෞද්ධ වාස්තුවිද්‍යාත්මක ගොඩනැගිලි සංකීර්ණ ලෙසට පබ්බතාරාම හඳුනාගත හැකිය. ප්‍රිශාන්ත ගුණවර්ධන 'පුරාවිද්‍යාව ශ්‍රී ලංකා බහුජාතික එකමුතුව සහ වාස්තුවිද්‍යා උරුමය' (2009) නමැති කෘතියේදී පබ්බත විහාරාරාම වාස්තුවිද්‍යාත්මක සැලැස්ම ලංකාවේ බෞද්ධ විහාරාරාම ඉතිහාසය පුරාම පවතින විහාරාරාමවල මුල් ස්වරූපය බව පවසයි. මෙම පබ්බතාරාම අනුරාධපුර නරගරයට තදාශ්‍රිතව මෙන්ම ඊට දුර බැහැරව ප්‍රාදේශීය වශයෙන්ද ව්‍යාප්තව තිබෙනු හඳුනාගත හැකිය. උතුරුමැද සහ මධ්‍යම පළාත්වල පවතින පබ්තාරාම අධ්‍යයන නියැදිය වශයෙන් ගෙන සිදු කෙරෙන මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ බෞද්ධ ආරාම සංවිධානයේ සංවිධිත බව පබ්බතාරාම ඇසුරෙන් හඳුනා ගැනීමයි. පබ්බතාරාම ආශ්‍රිතව සංවිධිත ආරාම සංවිධානයක් හඳුනාගත හැකිද? යන්න මෙහි පර්යේෂණ ගැටලුවයි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ පුස්තකාල ගවේෂණය සහ ක්ෂේත්‍ර අධ්‍යයනය භාවිත කෙරිණි. පබ්බතාරාමවල පිහිටීම සහ ඉතිහාසය පිළිබඳව පුස්තකාල ගවේෂණය මඟින් කරුණු අධ්‍යයනය කළ අතර ක්ෂේත්‍ර කරා ගොස් ඡායාරූපකරණය, ඒවායෙහි වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ පිළිබඳව අධ්‍යයනය කිරීම සිදු කළේය. වගු, රූක් සටහන් සහ ඡායාරූප භාවිතයෙන් තොරතුරු වර්ගීකරණය කළ අතර විශ්ලේෂණාත්මක හා සංසදනාත්මක අධ්‍යයනය මඟින් අර්ථකථන සිදුකරන ලදී. ලංකාවේ පවතින පබ්බත විහාරවල ව්‍යාප්තිය දෙස බැලූවිට බොහොමයක් පබ්බතාරාම අනුරාධපුර නගරය තුළ ඉදි කර තිබෙන බවක් හඳුනාගත හැකිවිය. පන්කුලිය, පුලියන්කුලම, බටහිරාරාමය, විජයාරාමය, තොළුවිල ආදිය නිදසුන් වේ. තවද අනුරාධපුර නගරයට දුරින් ප්‍රාදේශීය වශයෙන් පිහිටා ඇති පබ්බතාරාම අතළොස්සක් පමණද හඳුනාගත හැකිය. කළුදියපොකුණ, මැණික්දෙණ ආදිය නිදසුන්වේ. භූමියේ පිහිටීම හා පාරිසරික සාධකවල බලපෑම ආදිය මත මෙම ප්‍රත්‍යන්ත පබ්බතාරාම, නගරාශ්‍රිතව පවතින පබ්බත විහාරවලට වඩා වෙනස් වන ආකාරයක් දැකගත හැකිය. නමුත් සෑම පබ්බතාරාමයකම ඉදිකිරීම් ශෛලියෙහි සමරූපී බවක් විද්‍යමාන වේ. ප්‍රධාන සැලැස්ම සහ ප්‍රධාන නොවන සැලැස්ම යනුවෙන් කාණ්ඩ දෙකක් යටතේ සියලුම පබ්බතාරාම ඉදිකර තිබේ. ප්‍රධාන සැලැස්මට අයත් වන මධ්‍යමික මළුව, කාර්තු හතරකට බෙදා ප්‍රධාන පූජනීය අංග සතර ස්ථාපිත කොට ඇත. දෙවැනි මළුවෙහි සෙසු ඉදිකිරීම් ක්‍රමානුකූලව ඉදිකර ඇත. එබැවින් සුවිශේෂී වාස්තුවිද්‍යාත්මක සැලැස්මකට අනුව ක්‍රමානුකූලව සහ විධිමත්ව නිර්මාණය කර තිබෙන ආරාම සම්ප්‍රදායක් ලෙසට පබ්බතාරාම

1. හිටපු සහකාර කථිකාචාර්ය, පුරාවිද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණි විශ්වවිද්‍යාලය.
shehanthilakarathna1205@gmail.com

පෙන්වාදිය හැකිය. ඒ අනුව පබ්බතාරාම යනු බෞද්ධ ආරාම සංවිධානයේ සංවිධිත බව ප්‍රකට කරන හොඳම නිදර්ශනය ලෙසට නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පදඃ** ආරාම සංවිධානය, පබ්බතාරාම, ප්‍රධාන සැලැස්ම, ප්‍රධාන නොවන සැලැස්ම, සංවිධිත බව

# අභිචාරාත්මක ප්‍රතිකාර ක්‍රම සහ සංකේතිය ප්‍රාග්ධනයඃ මොරවක් කෝරළය ආශ්‍රයෙන් කෙරෙන සංස්කෘතික අධ්‍යයනයක්

ශයිනි කරුණාරත්න[1]

**සාරසංක්ෂේපය**

අභිචාරාත්මක රෝග සුව කිරීමේ යාතුකර්ම යනු ග්‍රාමීය සමාජවල ප්‍රතිකාරාත්මක අවශ්‍යතා සඳහා යොදා ගැනෙන ප්‍රාථමික රෝග නිවාරණ ක්‍රම වන බව බොහෝ අධ්‍යයනවලින් හෙළි ව තිබේ (කාරියවසම්, 1974; රත්නපාල, 1995; මීගස්කුඹුර 1997). මෙම යාතුකර්මවල පවතින මනෝවිද්‍යාත්මක විභවතා නිසා ග්‍රාමීය ජනතාව ඒ අභිචාර ක්‍රම වෙත යොමු වන බව ඇතැම් උගත්තු පෙන්වා දෙති (ඔබේසේකර,2007). එහෙත් මෙම අභිචාර රෝග නිවාරණ ක්‍රම ලෙස වර්තමාන සමාජයේ භාවිත වන්නේ ඇයිද යන්න නිසි ලෙස විසඳී නොමැති පර්යේෂණ ගැටලුවකි. එබැවින් එකී පර්යේෂණ ගැටලුව පදනම් කර ගනිමින් වර්තමාන සමාජයේ රෝග නිවාරණ අභිචාර ව්‍යාප්ත වීම කෙරෙහි බලපාන සමාජ සහ සංස්කෘතික හේතු විමසා බැලීම මෙම පර්යේෂණයේ අරමුණයි. එහිලා අපගේ අධ්‍යයනය ක්ෂේත්‍රය ලෙස මාතර දිස්ත්‍රික්කයට අයත් ඉපැරණි පරිපාලන ඒකකයක් වුණු මොරවක් කෝරළයේ ව්‍යාප්තව පවතින රෝග සුව කිරීමේ අභිචාරාත්මක යාතු කර්ම තෝරා ගැනුණි. මොරවක් කෝරළය යනු නූතන වෛද්‍ය විද්‍යාත්මක ප්‍රතිකාර ක්‍රමවලට වඩා අභිචාර විධි කෙරෙහි විශ්වාසය තබන විශාල ප්‍රජාවක් වෙසෙන ප්‍රදේශයක් වීම එම ප්‍රදේශය තෝරා ගැනීමට හේතුවයි. ක්ෂේත්‍ර නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා සහ කුටුම්භ සාකච්ඡා යන ගුණාත්මක දත්ත රැස්කිරීමේ විධික්‍රම ඔස්සේ සොයා ගත් දත්ත, පියරේ බෝදියෝ නමැති ප්‍රංශ න්‍යායාචාර්යවරයා ඉදිරිපත් කළ "සංකේතිය ප්‍රාග්ධනය" (Symbolic capital) යන සංකල්පය යොදා ගනිමින් විශ්ලේෂණය කර ඇත. න්‍යායික විශ්ලේෂණ කෙරෙහි පුස්තකාල සමීක්ෂණය යොදා ගැනුණි. පර්යේෂණයෙන් හෙළි වූ පරිදි අභිචාරාත්මක යාතුකර්මවලට හිමි සංකේතිය ප්‍රාග්ධන හේතුවෙන් ඒවා නූතන ආර්ථික ක්‍රම සමග ඒකාබද්ධව නව සංස්කෘතික ආර්ථික ක්‍රමයක් ගොඩනගා ඇත. විශේෂයෙන් ම අභිචාරාත්මක යාතුකර්ම ව්‍යාප්ත වීමෙහිලා විවිධ ප්‍රචාරණ ක්‍රම යොදා ගැනීම සහ අභිචාරාත්මක ප්‍රතිකාර සඳහා යොමු වන පිරිස් ඒ වෙනුවෙන් අධිකව මුදල් වියදම් කිරීම යන සාධක ඔස්සේ මෙම අභිචාරමය ප්‍රතිකාර ක්‍රම නූතන වෛද්‍ය සංස්කෘතික වෙළෙඳපොළෙහි වෙළඳ භාණ්ඩයක් බවට පත් වී ඇත. විශේෂයෙන් ම මොරවක් කෝරළයට සාම්ප්‍රදායික වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම සම්බන්ධව හිමිව ඇති සංකේතිය ප්‍රාග්ධනය නූතන වෛද්‍ය ප්‍රතිකාරක්‍රමවල විද්‍යාත්මක බලයට අභියෝග කරමින් මොරවක මිනිසුන්ගේ ජීවිතවල සුවිශේෂ වැදගත් කමක් අත්පත් කරගෙන ඇති ආකාරය මෙම පර්යේෂණයෙන් අනාවරණය කෙරිණි.

**මුඛ්‍ය පද :** අභිචාරාත්මක ප්‍රතිකාර, සංකේතිය ප්‍රාග්ධනය,අභිචාරාත්මක යාතු කර්ම,මොරවක් කෝරළය, නව සංස්කෘථික ආර්ථිකය

1. සහකාර කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය
shaini@sinh.cmb.ac.lk

# ඓතිහාසික පඬිවිට ඉසිඹුහලේ කලාත්මක හා වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳව විමර්ශනයක්

සුභසිංහ ආරච්චිගේ ප්‍රසන්න[1]

**සාරසංක්ෂේපය**

පුරාවිද්‍යාත්මක ස්මාරක අතර ඉසිඹුහල් නොහොත් අම්බලම් යන වාස්තු විද්‍යාත්මක අංගය සඳහා සුවිශේෂී ස්ථානයක් හිමිවේ. පඬිවිට ඉසිඹුහල මාතලේ-මහනුවර කුඹියන්ගොඩ මාර්ගයේ වෙල් යාය මධ්‍යයේ දැකිය හැකි ය. අතීතයේ දී රජරට සිට බලකඩුව දුර්ගය හරහා මහනුවර නගරයට යන මගීන්ගේ ප්‍රයෝජනය සඳහා මෙම අම්බලම ඉදිකර ඇත. මෙහි කලාත්මක, වාස්තු විද්‍යාත්මක ලක්ෂණ හා එහි වර්තමාන තත්ත්වය පිළිබඳ ව අධ්‍යයනයක් සිදු කිරීම මූලික අරමුණ යි. මෙම ඉසිඹුහල ආශ්‍රයෙන් හඳුනාගත හැකි සුවිශේෂී කලාත්මක නිර්මාණ හා වාස්තු විද්‍යාත්මක ලක්ෂණ මොනවාද? යන්න මෙහි පර්යේෂණ ගැටලුව යි. මෙහි පර්යේෂණ ක්‍රමවේදය පශ්චාත් ප්‍රත්‍යක්ෂ මූලවාදී විධි ක්‍රම අනුව සිදු කෙරී ඇති අතර එහි දී දත්ත එක්රැස් කිරීම සඳහා ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යයනය හා සම්මුඛ සාකච්ඡා යොදා ගත් අතර ග්‍රන්ථ පරිශීලනය ද සිදු කෙරිණි. මෙය ඉදිකිරීමට මහනුවර යුගයේ ගෘහ නිර්මාණ තාක්‍ෂණයේ සුවිශේෂී ටැම්පිට ක්‍රමය යොදා ගෙන ඇත. සම චතුරස්‍රාකාර සැලැස්මක් දැකිය හැකි ය. කබොක් ගල් මත තැබූ දැව පාදමක් මත බාහිර හා අභ්‍යන්තර කුලුනු මුදුන් කුඩුම්බි මගින් වද්දා ඇති අතර අභ්‍යන්තර කණු මුදුන්වල පේකඩ කුලුනු සිවුපසින් ඉහළට නැගී යළි යට අතට විහිදී එල්ලෙන නෙළුම් මල් සතරක් ආකාරයෙන් යොදා ඇත. එහි ලියවැල් හා පලා පෙති මෝස්තර අරලිය පත්‍ර පහළට එල්ලී වැටෙන අයුරින්ද ඇතැම් ඒවා කිහිඹි මුහුණේ මුඛයෙන් එල්ලෙන ආකාරයෙන් ද යොදා ඇත. මෙහි මධ්‍යයේ සිට විහිදුන පරාල මුදුන් එකතු කර මඩොල් කුරුප්පාව මගින් සම්බන්ධ කර පියස්ස නිර්මාණය කර ඇත. මේවා රවුම් හා හතරැස් හැඩතල සංකලනයෙන් නිමවා සිරස් අතට යෙදූ සියුම් රේඛාවලින් හැඩගන්වා ඇත. පාදම අසල ආයත චතුරස්‍රාකාර හැඩයෙන් වන අතර, ඉහළ දාර විසිතුරු බොරදමින් නිර්මාණය කර, අලංකරණ මල් කැටයම් ආදිය යොදා කුලුනු පාමුල පුන්කලසක ස්වරූපයක් මතුකිරීමට උත්සාහ කර ඇත. ඊට ඉහළින් සතර දෙසට යෙදූ පනේල තුළ නෙළුම් මල්, නාරිලතා මල්, සිංහ, ඇත්, අශ්ව, හංස පූට්ටුව ගජසිංහ රූපය වැනි ස්වාභාවික මෙන් ම කාල්පනික සත්වයන්, මල් රටා භාවිත කරමින් ලී කැටයම් යොදා ඇත. මහනුවර සම්ප්‍රදායට අයත් ගෘහනිර්මාණ ශිල්පයට ආවේණික වාස්තු විද්‍යාත්මක ලක්‍ෂණ හා කලාත්මක අංග රැසක් මෙම පුරාවිද්‍යාත්මක ස්මාරකයෙන් හඳුනාගත හැකි අතර විනාශය අභිමුඛයේ පවතින ඓතිහාසික නිර්මාණයක් ලෙසින් ද මෙය පෙන්වාදිය හැකි ය.

**මුඛ්‍ය පද:** ඉසිඹුහ, ස්මාරක, වාස්තු විද්‍යාව, ලී කැටයම්, මහනුවර සම්ප්‍රදාය

1. පශ්චාද් උපාධි අපේක්ෂක, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය. කැලණිය විශ්වවිද්‍යාලය
prasasakbo@gmail.com

# සීගිරිය කෞතුකාගාරයේ ප්‍රදර්ශිත තෝරා ගත් පුලුටු මැටි රූ පහක් පිළිබඳ රූප විද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

මල්ෂා මධුශානි රණසිංහ[1]

**සාරසංක්ෂේපය**

අතීත මානවයාගේ සමාජීය, ආගමික හා කලාත්මක පසුබිම අධ්‍යයනය සඳහා යොදාගත හැකි පුරාකෘති අතර පුලුටු මැටි රූප සඳහා විශේෂිත ස්ථානයක් හිමි වේ. සීගිරියට ආසන්න ඉලුක්වැව ප්‍රදේශයෙන් සොයා ගන්නා ලද දැනට සීගිරිය කෞතුකාගාරයෙහි සැඟවුණු යුගය ලෙසට නම් කළ ප්‍රදර්ශන කුටියෙහි දක්නට ලැබෙන මැටි රූ පහක් පිළිබඳව වෙන වෙනම රූප විද්‍යාත්මක අධ්‍යයනයක් හා එම රූප තුළින් සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. මැටි හා වැලි මිශ්‍ර කරමින් මෙම මැටි රූ ඝනව සාදා ඇත. සරල ලක්ෂණ සහිතය. මේවා පුලුටු මැටි රූ වශයෙන් හඳුන්වන්නේ පිලිස්සීමේදී හට ගන්නා තද රතු පැහැති ලක්ෂණ තවමත් ශේෂව පවතින නිසාය. පිලිස්සීමෙන් අනතුරුව ආලේප කළ කළු පැහැති ද්‍රව්‍යයක කොටස් ඉතා සුළු වශයෙන් තවමත් ශේෂව පවතී. නිරීක්ෂණයට ලක්වන අවස්ථාව වන විට අසම්පූර්ණ හෝ කඩතොලු ආකාරයෙන් දක්නට ලැබුණි. යටත් නියැදියේ පුරුෂ යැයි හඳුනාගත හැකි රූප දෙකක් හා ස්ත්‍රී යැයි හඳුනාගත හැකි රූප තුනක් වශයෙන් මෙම මැටි රූපවල මානව ලක්ෂණ හඳුනාගත හැකිය. අතින් ඇඹූ ලක්ෂණ සහිත මෙම රූප සම්පූර්ණ කිරීම සඳහා වෙනම සැදූ අඟපසඟ යොදා හෝ සිදුරු කර හෝ ඉරි ඇඳීම් සිදු කර තිබේ. ස්ත්‍රී රූපවල පියයුරු වැනි ලක්ෂණ නිරීක්ෂණය විය. රූපයේ මුහුණත මඟින් යම් හැඟීමක් නිරූපණය වන බවද හඳුනාගත හැකිය. මෙම මැටි රූ සරල ලක්ෂණ දනවන බැවින් ඒවා ජන ආගමක හෝ අභිචාර විධියක් සඳහා උපයෝගී කරගත් බවට අනුමාන කළ හැකිවන්නේ සමකාලීනව හා ඊට පෙර කාලවලදී සකසන ලද සරල නොවන සැරසිලි මැටි රූප ද සීගිරිය ආශ්‍රිතව හමුවන නිසාය.

**මුඛ්‍ය පද:** පුලුටු මැටි රූප, රූපීය ලක්ෂණ, අභිචාර, ඉලුක්වැව

---

1. පශ්චාද් උපාධි අපේක්ෂක, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය.
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව (බදුල්ල ප්‍රාදේශීය කාර්යාලය)
rm.malsharanasinghe@gmail.com

# මානසික ආතතිය අවම කරගැනීමෙහි ලා ජන කවියේ උපයෝගීතාව

ආර්. නිරංජන් මදුශංක තෙන්නකෝන්[1]

**සාරසංක්ෂේපය**

ජනශ්‍රැතියෙහි අන්තර්ගත සුවිශේෂී අංගයක් ලෙසින් ජන කවිය හඳුනාගත හැකිය. ජන කවිය වූ කලි ගැමියා අතරම උපත ලබා ඔහු ඇසුරේම වර්ධනය වූ නිර්මාණාත්මක සාහිත්‍යාංගයකි. ගැමි ජනයාගේ දුක්ඛ දෝමනස්ස, සතුට මෙන්ම පුද්ගල පාලුව කාංසිය මකා ගැනීමටත් තවකෙකු වෙත දැනවීමටත් ජනකවිය යොදාගෙන ඇත. මෙරට ජනකවිය පිළිබඳ අධ්‍යයනය කිරීමේදී විවිධ තේමා මූලික කරගනිමින් ජනකවි නිර්මාණය වී ඇති බව පැහැදිලි වේ. අතීත කෘෂක ජන සමාජයේ සරල අවශ්‍යතා සපුරා ගැනීමේ අරගලයේදී ජනතාවට විවිධ මානසික ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණපාන්නට සිදුව තිබේ. මෙකී තත්ත්වය වර්තමානයේදී මානසික ආතතිය (Stress) වශයෙන් හඳුනා ගැනේ. මානසික ආතතිය අවම කරගැනීම හෝ කළමනාකරණය සඳහා විවිධ මනෝවිද්‍යාත්මක ක්‍රමවේදය නූතනයේ අත්හදා බලමින් පවතී. අතීත ගැමියා කිසියම් හේතු සාධකයක් මත තමාට ඇති වූ මානසික පීඩනය අවම කර ගැනීම සඳහා ජනකවිය උපයෝගී කරගත් ආකාරය කෙබඳුද? යන්න මෙහි පර්යේෂණ ගැටලුවයි. පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූයේ තමාට මුහුණ පෑමට සිදුවූ පීඩාකාරී තත්ත්වය අවම කර ගැනීම සඳහා ගැමියා ජන කවිය යොදා ගෙන ඇති ආකාරය අධ්‍යයනය කිරීමයි. සරල අවශ්‍යතා සහිත සමාජයක පුද්ගලයාට මානසික පීඩනය ඇති කරන හේතු සාධක ජනකවිය ඇසුරින් විමසා බැලීම මෙහි උප අරමුණ විය. ගුණාත්මක පර්යේෂණ විධික්‍රමයට අදාළ සාහිත්‍ය මූලාශ්‍රය විමර්ශනය කිරීම මගින් දත්ත රැස් කරන ලදී. අසම්භාවිත නියැදි ක්‍රමය (Non-Propability Sample) යටතේ පරමාර්ථගත හෝ විනිශ්චමය (Purposive or Judgmental Sample) නියැදිය භාවිත කරමින් ජන කවි තෝරා ගැණිනි. මෙම ජන කවි විශ්ලේෂණය කිරීමේදී පැහැදිලි වූයේ මානසික ආතතිය කළමනාකරණය කර ගැනීමට ගැමියා ජන කවිය සාර්ථකව උපයෝගී කර ගෙන ඇති අකාරයත් එය ඉතාමත් සංයමශීලීව සහ නිර්මාණශීලීත්වයෙන් යුක්තව ඉදිරිපත් කර තිබෙන බවත්ය. අතීත ගැමියාට රැකියාව, මානව සම්බන්ධතා බිඳවැටීම, දුප්පත්කම, පාළුව ආදි සාධක ද මානසික පීඩනය ඇති වීමට හේතු වී තිබෙන බව ජන කවි විශ්ලේෂණය කිරීමේදී පැහැදිලි විය.

**මුඛ්‍ය පදඃ** ජනශ්‍රැතිය, ජන කවිය, මානසික පීඩනය, ආතති කළමනාකරණය

---

1. පශ්චාද් උපාධි අපේක්ෂක, කැලණිය විශ්වවිද්‍යාලය.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, නොච්චියාගම
niranjan199027@gmail.com

## වාර්ෂික පර්යේෂණ සැසිය - 2022
## උපකමිටු

**අනුග්‍රාහක කමිටුව**

මහාචාර්ය අගලකඩ සිරිසුමන හිමි
ආචාර්ය කුමුදු කරුණාරත්න

**පොත් ප්‍රදර්ශනය සංවිධාන කමිටුව**

ආචාර්ය රංජිත් සේනානායක
සහකාර කථිකාචාර්ය පසන් පාදුක්කගේ
සහකාර කථිකාචාර්ය නදුනි පතිරණ

**ප්‍රචාරක කමිටුව**

ආචාර්ය ලතා ගුරුසිංහ
කථිකාචාර්ය අචින්ත්‍ය බණ්ඩාර
සහකාර කථිකාචාර්ය නර්මදා විතානගේ
සහකාර කථිකාචාර්ය පසන් පාදුක්කගේ

**සංග්‍රහ කමිටුව**

ආචාර්ය දීපචන්දි අබේසිංහ
සහකාර කථිකාචාර්ය නර්මදා විතානගේ
සහකාර කථිකාචාර්ය ශයිනි කරුණාරත්න

**සමාරම්භක උත්සව කමිටුව**

ආචාර්ය ජයන්ති බණ්ඩාර
කථිකාචාර්ය ඔසඳ ගුණරත්න
සහකාර කථිකාචාර්ය නර්මදා විතානගේ
සහකාර කථිකාචාර්ය පසන් පාදුක්කගේ
සහකාර කථිකාචාර්ය නුවන්තිකා සංජීවනී
සහකාර කථිකාචාර්ය නදුනි පතිරණ
සහකාර කථිකාචාර්ය ශයිනි කරුණාරත්න

**තාක්ෂණික කමිටුව**

කථිකාචාර්ය ඔසඳ ගුණරත්න
සහකාර කථිකාචාර්ය පසන් පාදුක්කගේ
අසිතංජන බටුවන්තුඩාව
වසන්ත ගම්ලත්